# 10. මූල්‍ය අංශය

## 10.1 මූල්‍ය ප්‍රතිපත්තිය

මූල්‍ය වෙළෙඳපොළ ස්ථායිතාවය සහ මිල ස්ථායිතාවය අත්කර ගැනීම සම්බන්ධයෙන් තවදුරටත් ඉදිරි පියවර ගැනීම කෙරෙහි, 1998 දී මූල්‍ය ප්‍රතිපත්තිය යොමු කෙරුණි. 1998 දී මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කෙරුණේ විදේශ වාතාවරණය ඉතා අස්ථායි තත්වයක තිබියදීය. 1997 මැද සිටම ලෝකයේ බැංකු කර්මාන්තය සහ මූල්‍ය වෙළෙඳපොළවල් තදබල අස්ථායිතාවයකට මුහුණපාමින් සිටියහ. නැගෙනහිර ආසියානු මූල්‍ය වෙළෙඳපොළ අර්බුදයත් සමඟ ලෝක මූල්‍ය සහ භාණ්ඩ වෙළෙඳපොළවල් කෙරෙහි එම අර්බුදය පැතිර යෑමෙන් ඇතිවන ක්ෂණික ප්‍රතිඵල මෙන්ම වඩා කල් පවතින අයහපත් විපාකයන්හි බලපෑම් ද දක්නට විය. මින් පසුව, රුසියාවේ ඇති වූ ගෙවීම් අර්බුදයද, බ්‍රසීලයේ සහ ජපානයේ ආර්ථික ප්‍රශ්නද අස්ථායිතාවය තවදුරටත් තීව්‍ර කළේය. මීට අමතරව, මූල්‍ය අර්බුදයනට ලක් වූ රටවල විශාල වශයෙන් ආයෝජනයන් කර තිබූ බටහිර රටවල සමහර මූල්‍ය ආයතනයන්හි ස්ථායිතාවය පිළිබඳවද සැක පහළ වී තිබුණි. ව්‍යාපාරික පාලනය, විධිමත් කිරීමේ ආකෘතීන් සහ අධීක්ෂණ ප්‍රමිතීන්හි දුර්වලතා නිසා බොහෝ රටවල මූල්‍ය ආයතනයන්හි ස්ථායිතාවයට තර්ජන ඇති වී තිබුණි. අර්බුදයනට මුහුණ පෑ රටවල බොහෝ මූල්‍ය ආයතන වසා දමන ලදී. සංවර්ධනය වන රටවලද මූල්‍ය ප්‍රවාහ සැලකිය යුතු ලෙස අඩු වූ අතර, විනිමය අනුපාතික ස්ථායීකරණය සඳහා පොලී අනුපාතික ඉහළ දැමීම මගින් මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කරන ලදී. තරඟකාරිත්වය නැවත ඇති කරගැනීම සඳහා චීනය සිය මුදල අවප්‍රමාණය කිරීමකට යොමු වේදැයි සමපේක්ෂණයන් ඇතිවිය. ආසියානු අර්බුදයට භාජනය වූ ඇතැම් රටවල වෙළෙඳපොළ විශ්වාසය කෙමෙන් ගොඩ නැංවුන අතර, වඩා තියුණු ආර්ථික අවපාතයන් වැළැක්වීමේ අරමුණෙන් බටහිර කාර්මික රටවල මෙන්ම වෙනත් බොහෝ රටවලද පොලී අනුපාතිකයන් අඩු කරන ලදී. ලෝක මූල්‍ය වෙළෙඳපොළවල දක්නට වූ මේ අස්ථායිතාවය නිසා විනිමය අනුපාතික වෙනස් වීමේ දිශාව පැහැදිලි නොවූ අතර, ප්‍රධාන ව්‍යවහාර මුදල් අතර විනිමය අනුපාතිකයන්හි විශේෂයෙන්ම යෙන් /එක්සත් ජනපද ඩොලර් අනුපාතිකයෙහි, දක්නට වූ චංචලතාවය නිසා, ලංකාව වැනි සාපේක්ෂ වශයෙන් වඩා විවෘත සහ කුඩා ආර්ථිකයන්හි විනිමය අනුපාතික සහ මූල්‍ය ප්‍රතිපත්තීන් සම්බන්ධීකරණය අභියෝගාත්මක කර්තව්‍යයක් බවට පත්විය. මෙම අපහසුතා මෙන්ම අපේක්ෂිත මට්ටමට වඩා පුළුල් වූ දේශීය රාජ්‍ය මූල්‍ය හිඟයක් මගින් ඇති වූ සංරෝධකයක් තිබියදීත්, මූල්‍ය පාලන සහ නම්‍ය ලෙස කළමනාකරණය කළ විනිමය අනුපාතිකය, 1998 දී දේශීය මූල්‍ය වෙළෙඳපොළ ස්ථායිතාවය පවත්වාගෙන යෑමට උපකාරී විය.

ඉහත පසුබිම 1997 දී ඇරඹුන මූල්‍ය ප්‍රතිපත්තීන් ලිහිල් කිරීම තවදුරටත් කරගෙන යමින් පොලී අනුපාතික වැඩිදුරටත් අඩු කරලීමට මහ බැංකුවට ඇති හැකියාවට බාධා පැමිණුනි. කලාපීය මූල්‍ය වෙළෙඳපොළවල පැවති අවිනිශ්චිතතාවය සහ 1998 ආරම්භයේදී තරමක් ඉහළින් පැවති දේශීය උද්ධමනය නිසා වර්ෂයේ මුල් මාස කිහිපයේ ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කරලීමක් අවශ්‍ය විය. දෙවැනි කාර්තුවේදී සුළු ලිහිල් කිරීමක් ඇති කළත්, විදේශ විනිමය වෙළෙඳපොළෙහි අළුතින් ඇති වූ චංචලතාවය නිසා මූල්‍ය ප්‍රතිපත්ති තවදුරටත් දැඩි කරලීමේ අවශ්‍යතාවයක් ඇතිවිය. මෙම ස්ථාවරය අවසාන කාර්තුව දක්වා පවත්වා ගත් අතර, එහිදී උද්ධමන පීඩන අඩුවීමක් සහ විනිමය වෙළෙඳපොළවල සාපේක්ෂ වශයෙන් ස්ථායිතාවයක් ඇති වීමත් සමග ප්‍රතිපත්තිද යම් පමණකට ලිහිල් කරලීමට හැකිවිය. මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන උපකරණය විවට වෙළෙඳ කටයුතු වූ අතර, ප්‍රතිමිලදී ගැනීම් සංඥ කිරීමේ ප්‍රධාන යන්ත්‍රණය ලෙස කටයුතු කළේය. මැයි මාසයේ සිට, සිය භාණ්ඩාගාර බැඳුම්කර දරීම් ද්‍රවශීල වත්කම්වල කොටසක් ලෙස ඇතුලත් කිරීමට වාණිජ බැංකුවලට අවසර ලැබුණි. නොවැම්බර් මාසයේදී එක්දින ප්‍රතිවිකුණුම් පහසුකම යළි හඳුන්වාදෙන ලදී. මහ බැංකුව මින් පසු එක්දින ප්‍රති මිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් යන පහසුකම් දෙකම සපයන හෙයින් ඒක්ෂණ මුදල් වෙළෙඳපොළේ චංචලතාවය අඩුවීම මගින් මූල්‍ය වෙළෙඳපොළේ වැඩි ස්ථායිතාවයක් ඇතිවනු ඇත.

1997 පසු භාගයේ සහ 1998 දී ඇති වූ සිදුවීම් වලින්, විදේශයන්හි ඇතිවන තත්ත්වයන් සහ දේශීය වෙළෙඳපොළවල් අතර සම්බන්ධතාවයද, ඒකාග්‍ර විනිමය හා මූල්‍ය ප්‍රතිපත්තීන් පවත්වා ගැනීමේ අවශ්‍යතාවයද පැහැදිලිව පෙන්නුම් කෙරුණි. නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදය සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් 1997 දෙවැනි භාගයේදී ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල ඇති වූ චංචලතාවය නිසා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි අවිනිශ්චිතතාවයක් ඇතිවිය. රුපියලෙහි විදේශ අගය විශාල වශයෙන් අඩුවීමක් වෙළෙඳපොළ විසින් අපේක්ෂා කළෙන්, මෙම අවිනිශ්චිතතාවය 1998 වර්ෂය දක්වාද ඉදිරියට ගියේය. මහ බැංකුව රුපියලේ එවැනි විශාල අවප්‍රමාණය වීමක් සිදු නොවන බව පැහැදිලිවම දැක්විය. වැඩිදුරටත්, සාපේක්ෂ වශයෙන් අඩු පොලී යටතේ ලබා ගන්නා ඒක්ෂණ වෙළෙඳපොළ අරමුදල් විදේශ විනිමය මිලට ගැනීමේ සමපේක්ෂණ කටයුතුවලට යොදා ගැනීම අධෛර්‍යවත් කිරීම සඳහා ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය 1997 දෙසැම්බර් මස පදනම් අංක 200 කින්ද 1998 ජනවාරි මස නැවතත් පදනම් අංක 100 කින්ද වැඩි කරන ලදී. මහ බැංකුවේ වට්ටම් සහ ප්‍රතිවට්ටම් අනුපාතික සහ එම අනුපාතික අතර පරතරයද, මෙම ප්‍රතිපත්ති දැඩි කිරීමට අනුකූල වන ලෙස ගලපන ලදී. මෙම පියවර, නැගෙනහිර ආසියාවේ මූල්‍ය වෙළෙඳපොළ සහ විනිමය අනුපාතික පිළිබඳ තත්ත්වය යම් තරමකට යහපත් අතකට හැරීමත් සමග එක්ව සමපේක්ෂණ පීඩනයන් අඩු කරලීමට සමත් විය. මාර්තු සහ අප්‍රේල් මාසවල වාණිජ බැංකු විසින් මහ බැංකුවට එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 54 ක් විකුණන ලදී. මේ අනුව ප්‍රතිපත්තීන් යම් පමණකට ලිහිල් කරලීමට හැකි වූ හෙයින්, එක් දින ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය, අප්‍රේල් මස අවසානයේ දී සියයට 12.00 සිට සියයට 11.65 දක්වා අඩු කරන ලදී. කෙසේ

වෙතත්, ජාත්‍යන්තර වෙළෙඳපොළවල චංචලතාවයක් සහ ඒ හා ආශ්‍රිතව දේශීය සමපේක්ෂණ ක්‍රියාවලියක් නැවත ඇතිවීම නිසා, මැයි මස මැද ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය නැවත සියයට 12.00 දක්වා වැඩි කිරීම මගින් ප්‍රතිපත්තීන් දැඩි කරලීමට මහ බැංකුවට සිදු විය.

1998 අවසාන කාර්තුවේදී යම් ලිහිල් කිරීමකට ඉඩ සැලසෙන තෙක්ම, ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය සියයට 12 කට ආසන්නව පවත්වාගෙන යන ලදී. වර්ෂයේ දෙවැනි භාගයේදී උද්ධමන වේගය සැලකියයුතු ලෙස මන්දගාමී වීමක් දක්නට ලැබුණි. විනිමය වෙළෙඳපොළේ අවිනිශ්චිතතාවය අඩුකර ලමින් නැගෙනහිර ආසියාතු අර්බුදය ලිහිල් විය. මේ නිසා වැඩිදුර අස්ථායිතාවයක් ඇති නොවන සේ, එක්දින ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය 1998 දෙසැම්බර් අවසානයේදී සියයට 11.25 ක් දක්වා පියවර කිහිපයකින් අඩු කරලීම මගින් මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය යම් පමණකට ලිහිල් කරලීමට මහ බැංකුවට හැකිවිය.

1998 මැයි 18 වැනි දින සිට, සිය භාණ්ඩාගාර බැඳුම්කර දැරීම්, එම බැඳුම්කරවල පරිණත වීමේ කාලය වසරකට වැඩි වුවත් සිය ද්‍රවශීල වත්කම්වල කොටසක් ලෙස ඇතුළු කරලීමට වාණිජ බැංකුවලට ඉඩ දෙන ලදී. එමෙන්ම, ඔවුනට මෙම බැඳුම්කර මහ බැංකුවේ ද්විතීයික කවුළුවේ ප්‍රතිමිලදී ගැනීම්, වට්ටම් සහ ප්‍රතිවට්ටම් ගණුදෙණු සඳහා යොදා ගැනීමටද අවසර දෙන ලදී. මෙම තීරණයට හේතුන් ගණනක් බලපෑවේය. මින්, මධ්‍යකාලීන රජයේ බැඳුම්කර වඩාත් වෙළෙඳපොළගත කිරීමට හැකිවන අතර, වාණිජ බැංකුවලට ද්‍රවශීල වත්කම් ලෙස දැරීම සඳහා පොලී උපයන උපකරණයක් සපයා දීම මෙන්ම මහ බැංකුවට මෙම බැඳුම්කර සිය විවෘත වෙළෙඳ කටයුතු සඳහා යොදා ගැනීමට ඇති හැකියාවද වැඩි කෙරේ.

1998 නොවැම්බර් මස 6 වැනි දින සිට මහ බැංකුව විසින් එක්දින ප්‍රතිවිකුණුම් පහසුකමක් හඳුන්වා දෙන ලදී. 1995 දී වෙළෙඳපොළ ද්‍රවශීලතා හිඟයක් නිසා ඒක්ෂණ වෙළෙඳපොළ පොලී අනුපාතික පිළිගත නොහැකි තරම් ඉහළ මට්ටමකට ඉහළ නැගීමේ ප්‍රවණතාවයක් දක්වූ අවස්ථාවක මහ බැංකුව විසින් සීමිත පදනමක් යටතේ ප්‍රතිවිකුණුම් පහසුකම මුල් වරට හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, සපයන අරමුදල් ප්‍රමාණය සීමිතවීම සහ වෙළෙඳපොළෙහි ඇතැම් ව්‍යුහාත්මක දුර්වලතා නිසා මෙම පහසුකම මගින් එහි අපේක්ෂිත අරමුණ වූ ඒක්ෂණ වෙළෙඳපොළෙහි පොලී අනුපාතිකයන්හි ඉහළ අන්තය ස්ථායි කිරීම ඉටුකර ගැනීමට නොහැකි විය. 1996 ජනවාරි මස එය භාවිතා කිරීම නවත්වන ලදී. 1998 නොවැම්බර් මාසයේදී හඳුන්වා දුන් නව පහසුකම කරුණු කිහිපයකින් මුලදී හඳුන්වා දුන් පහසුකමට වඩා වෙනස් විය. දැනට එම පහසුකම එක්දින ගණුදෙණුවලට සීමා වෙයි. එම පහසුකම වාණිජ බැංකුවලට පමණක් නොව, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ප්‍රාථමික වෙළෙඳුන් සඳහාද විවෘත වෙයි. ප්‍රධානතම වෙනස වන්නේ ස්ථාවර පොලී අනුපාතිකයක් යටතේ, නියමිත සුරැකුම් එනම් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සැපයිය හැකි අවස්ථාවන්හිදී, සීමාවකින් තොරව අරමුදල් ලබාගත හැකි වීමය. 1995 දී පහසුකම හඳුන්වා දෙන අවස්ථාවේ දැඩි ද්‍රවශීලතා හිඟයක් ඇතිව තිබුනත් 1998 දී වෙළෙඳපොළ ඉතා ද්‍රවශීල තත්ත්වයක පැවති හෙයින් මෙම පහසුකම නිතර භාවිතයට ගැනීමක් සිදු නොවීය. මෙම පහසුකම මගින් වෙළෙඳපොළ වෙත ක්ෂණිකව ද්‍රවශීලතාවය ලබා දීමකට වඩා පොලී අනුපාතික ස්ථායිතාවය සුරැකෙන බවට වෙළෙඳපොළ සාමාජිකයන්හට සහතික වීමත් සිදුවිය.

ද්‍රවශීලතාවය ඇද ගැනීම සඳහා වර්ෂය පුරාම ඕනෑම අවස්ථාවක මහ බැංකු සුරැකුම්පත් මිලදී ගැනීමට පහසුකම් සලසා තිබුණි. මෙම සුරැකුම්පත්වල පරිණත කාලය දින 7 ක් වූ අතර එලෙව දින 7 කට අදාළ ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකයට සමාන විය. කෙසේ වෙතත් මහ බැංකුවේ විවෘත වෙළෙඳ කටයුතු සඳහා එය සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණවත් වූයෙන් 1998 දී මෙම සුරැකුම්පත් යොදා ගත්තේ කලාතුරකිනි.

මැදි සහ දිගුකාලීන අරමුදල සහ වෙනත් කෙටිකාලීන පහසුකම් යටතේ ප්‍රතිමූල්‍ය නොසැපයීමේ ප්‍රතිපත්තිය මහ බැංකුව විසින් දිගටම ගෙන යන ලදී. අතීතයේ සපයා නොපියවා තිබූ ප්‍රතිමූල්‍ය ණය 1997 පැවති රුපියල් දශ ලක්ෂ 1,692 ක සිට 1998 අවසානයට රුපියල් දශ ලක්ෂ 1,122 ක් බවට පත් වූයේ අළුතින් ප්‍රතිමූල්‍ය සැපයීමක් නොවී, මහ බැංකුව වෙත දිගටම ණය ආපසු ගෙවීම් සිදු කෙරුන හෙයිනි.

## 10.2 මුදල් සැපයුම

මුදල් සැපයුමෙහි වර්ධනය 1998 දී අඩුවෙමින් පැවතුණි. ශුද්ධ විදේශීය ලැබීම් සැලකිය යුතු ලෙස පහත වැටීම සහ පෞද්ගලික අංශයට දුන් ණය අඩු වේගයකින්

**10.1 සංඛ්‍යා සටහන**
**මූල්‍ය සංඛ්‍යා සාරාංශය**


| ශීර්ෂය | 1998 අවසානයට රුපියල් බිලියන | වෙනස 1997 ප්‍රමාණය රු.බිලියන | % | 1998 ප්‍රමාණය රු.බිලියන | % |
|---|---|---|---|---|---|
| මූල්‍ය සමස්තයන් | | | | | |
| පටු මුදල් සැපයුම ($M_1$) | 96.3 | 7.6 | 9.8 | 10.4 | 12.1 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 316.2 | 35.1 | 13.8 | 27.9 | 9.7 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 377.7 | 45.0 | 15.6 | 44.1 | 13.2 |
| තුඩු දුන් සාධක(අ) | | | | | |
| දේශීය ණය | 369.5 | 30.7 | 10.5 | 46.5 | 14.4 |
| රජය (ශුද්ධ) | 64.6 | -1.9 | -4.0 | 19.4 | 42.8 |
| රාජ්‍ය සංස්ථා | 10.8 | -0.8 | -5.4 | -3.8 | -26.1 |
| පෞද්ගලික අංශය | 294.1 | 33.4 | 14.5 | 30.9 | 11.8 |
| විදේශීය වත්කම් (ශුද්ධ) | 105.6 | 27.4 | 43.5 | 15.2 | 16.7 |
| අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) | -97.4 | -13.1 | -19.5 | -17.5 | -22.0 |
| සංචිත මුදල් | 92.9 | -1.8 | -2.1 | 9.1 | 10.9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) $M_{2b}$ වෙනස්වීම කෙරේ තුඩුදුන් සාධක මෙහි දක්වේ.

## 10.1 රූප සටහන
## මූල්‍ය ප්‍රසාරණය

10.1.1 රූප සටහන
**වල මධ්‍යක පදනම මත මූල්‍ය වර්ධනය**




10.1.2 රූප සටහන
**ලක්ෂ්‍යමය පදනම මත මූල්‍ය වර්ධනය**




වර්ධනය වීම මගින් රාජ්‍ය අංශයට දුන් ණය වැඩිවීම සමහන් කරමින් පුළුල් මුදල් ප්‍රසාරණය කෙරෙහි, සංකෝචනාත්මක බලපෑමක් ඇති කෙරුණි. 1996 සහ 1997 දක්නට වූ තත්ත්වයනට ප්‍රතිවිරුද්ධව, පටු මුදල් වර්ධනය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතුණි. වර්ධන වේගයේ පහත වැටීමක් පිළිබිඹු කරමින්, දේශීය බැංකු ඒකක සහ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු (වි.ව්‍ය.මු.බැ.) ඒකක යන දෙවර්ගයම ඇතුලත් වන පුළුල් මුදල් සැපයුම ($M_{2b}$), 1997 දී වාර්තා වූ සියයට 15.6 ක වර්ධනයට සාපේක්ෂව 1998 දී සියයට 13.2 කින් වැඩිවිය. මුදල් සැපයුමෙහි මෙම අඩු වර්ධන වේගය, සැපයුම් අංශයෙහි වර්ධනයන්ද සමඟින්, උද්ධමන පීඩනයන් අඩු කරලීමට ඉවහල් විය.

### 10.2 සංඛ්‍යා සටහන
### මූල්‍ය සමස්තයන් 1997-1998 (අ)

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| කාලච්ඡේදය අවසානයට | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | | ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිශත වෙනස | | | | | | ප්‍රතිශත වෙනස | | | | | | ප්‍රතිශත වෙනස | | | |
| | 1997 | 1998 | ලක්ෂ්‍යමය පදනම මත | | වල සාමාන්‍යය | | 1997 | 1998 | ලක්ෂ්‍යමය පදනම මත | | වල සාමාන්‍යය | | 1997 | 1998 | ලක්ෂ්‍යමය පදනම මත | | වල සාමාන්‍යය | |
| | | | 1997 | 1998 | 1997 | 1998 | | | 1997 | 1998 | 1997 | 1998 | | | 1997 | 1998 | 1997 | 1998 |
| ජනවාරි | 77,889 | 85,527 | 5.6 | 9.8 | 9.2 | 5.8 | 253,157 | 289,017 | 11.0 | 14.2 | 16.9 | 11.9 | 288,640 | 335,827 | 10.8 | 16.3 | 17.8 | 12.5 |
| පෙබරවාරි | 77,597 | 87,262 | 0.2 | 12.5 | 8.3 | 6.8 | 254,967 | 291,450 | 8.9 | 14.3 | 15,8 | 12.3 | 291,487 | 338,718 | 8.2 | 16.2 | 16.5 | 13.2 |
| මාර්තු | 80,828 | 92,194 | -1.2 | 14.1 | 6.9 | 8.2 | 260,657 | 297,205 | 9.0 | 14.0 | 14.6 | 12.7 | 296,908 | 343,609 | 8.9 | 15.7 | 15.2 | 13.8 |
| අප්‍රේල් | 80,583 | 90,436 | 1.4 | 12.2 | 5.7 | 9.1 | 261,357 | 297,152 | 8.0 | 13.7 | 13.4 | 13.2 | 297.972 | 346,676 | 7.0 | 16.3 | 13.6 | 14.6 |
| මැයි | 80,240 | 91,177 | 4.7 | 13.6 | 5.1 | 9.8 | 262,188 | 298,472 | 8.3 | 13.8 | 12.3 | 13.6 | 299,265 | 349,938 | 7.9 | 16.9 | 12.3 | 15.3 |
| ජූනි | 79,670 | 90,126 | 4.9 | 13.1 | 4.7 | 10.5 | 265,104 | 296,943 | 10.3 | 12.0 | 11.5 | 13.8 | 302,031 | 348,566 | 10.9 | 15.4 | 11.5 | 15.7 |
| ජූලි | 79,535 | 92,264 | 4.4 | 16.0 | 4.1 | 11.5 | 267,601 | 298,677 | 11.5 | 11.6 | 11.0 | 13.8 | 307,086 | 349,416 | 12.9 | 13.8 | 11.1 | 15.7 |
| අගෝස්තු | 81,068 | 91,389 | 6.4 | 12.7 | 3.9 | 12.0 | 271,989 | 296,505 | 13.3 | 9.0 | 10.8 | 13.4 | 311,192 | 349,499 | 14.0 | 12.3 | 10.9 | 15.5 |
| සැප්තැම්බර් | 82,287 | 93,463 | 7.4 | 13.6 | 3.8 | 12.5 | 276.994 | 301,678 | 14.6 | 8.9 | 10.8 | 12.9 | 317,668 | 355,707 | 15.5 | 12.0 | 11.0 | 15.2 |
| ඔක්තෝබර් | 83,300 | 92,240 | 12.6 | 10.7 | 4.5 | 12.4 | 279,577 | 303,514 | 15.1 | 8.6 | 11.1 | 12.3 | 322,404 | 362,633 | 16.9 | 12.5 | 11.4 | 14.9 |
| නොවැම්බර් | 82,708 | 92,975 | 9.9 | 12.4 | 4.9 | 12.6 | 281,697 | 306,637 | 14.9 | 8.9 | 11.3 | 11.8 | 323,583 | 366,114 | 15.9 | 13.1 | 11.7 | 14.6 |
| දෙසැම්බර් | 85,851 | 96,268 | 9.8 | 12.1 | 5.4 | 12.7 | 288,258 | 316,174 | 13.8 | 9.7 | 11.6 | 11.5 | 333.668 | 377,740 | 15.6 | 13.2 | 12.1 | 14.4 |
| මාසික සාමාන්‍යය | 80,963 | 91,277 | 5.5 | 12.7 | | | 268.629 | 299,452 | 11.6 | 11.6 | | | 307,659 | 352,037 | 12.0 | 14.5 | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සම්මත ජාත්‍යන්තර පිළිවෙතට අනුකූල වන පරිදි 1990 සිට මූල්‍ය දත්ත ප්‍රතිවර්ගීකරණය කර ඇත. පරිශිෂ්ටයෙහි 104, 105 සහ 109 සංඛ්‍යා සටහන්වල ඇති සටහන් බලන්න.

**10.3 සංඛ්‍යා සටහන**

**මූල්‍ය සමස්තයන් සහ තුඩු දුන් සාධක 1996-1998 (අ)**

ප්‍රමාණය රුපියල් දශලක්ෂ

| | දෙසැ. 1996 | දෙසැ. 1997 | දෙසැ. 1998 | වෙනස 1997 ප්‍රමාණය | වෙනස 1997 ප්‍රතිශතය | වෙනස 1998 ප්‍රමාණය | වෙනස 1998 ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| මූල්‍ය සමස්තයන් | | | | | | | |
| මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 42,565 | 45,680 | 51,767 | 3,115 | 7.3 | 6,087 | 13.3 |
| මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු | 35,638 | 40,172 | 44,501 | 4,534 | 12.7 | 4,330 | 10.8 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 78,203 | 85,852 | 96,268 | 7,649 | 9.8 | 10,417 | 12.1 |
| වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු | 210,454 | 247,816 | 281,473 | 37,362 | 17.8 | 33,657 | 13.6 |
| දේශීය බැංකු ඒකක | 195,672 | 227,963 | 257,995 | 32,291 | 16.5 | 30,032 | 13.2 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | 14,782 | 19,853 | 23,478 | 5,071 | 34.3 | 3,625 | 18.3 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 288,657 | 333,668 | 377,741 | 45,011 | 15.6 | 44,074 | 13.2 |
| තුඩු දුන් සාධක | | | | | | | |
| ශුද්ධ විදේශ වත්කම් | 63,074 | 90,501 | 105,648 | 27,427 | 43.5 | 15,147 | 16.7 |
| මූල්‍ය අධිකාරිය | 73,541 | 89,936 | 101,744 | 16,395 | 22.3 | 11,808 | 13.1 |
| වාණිජ බැංකු | -10,467 | 565 | 3,904 | 11,032 | 105.4 | 3,339 | 591.0 |
| දේශීය බැංකු ඒකක | -4,186 | 2,095 | 1,141 | 6,281 | 150.0 | -954 | -45.5 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | -6,281 | -1,530 | 2,763 | 4,751 | 75.6 | 4,293 | 280.6 |
| ශුද්ධ දේශීය වත්කම් | 225,582 | 243,172 | 272,091 | 17,590 | 7.8 | 28,919 | 11.9 |
| දේශීය ණය | 292,395 | 323,046 | 369,517 | 30,651 | 10.5 | 46,471 | 14.4 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 47,131 | 45,250 | 64,618 | -1,881 | -4.0 | 19,368 | 42.8 |
| මූල්‍ය අධිකාරිය | 34,291 | 20,300 | 25,909 | -13,991 | -40.8 | 5,609 | 27.6 |
| වාණිජ බැංකු | 12,840 | 24,950 | 38,709 | 12,110 | 94.3 | 13,759 | 55.1 |
| දේශීය බැංකු ඒකක | 14,246 | 26,065 | 32,682 | 11,819 | 83.0 | 6,617 | 25.4 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | -1,406 | -1,115 | 6,027 | 291 | 20.7 | 7,142 | 640.5 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 15,491 | 14,658 | 10,835 | -833 | -5.4 | -3,823 | -26.1 |
| දේශීය බැංකු ඒකක | 9,938 | 10,338 | 9,485 | 400 | 4.0 | -853 | -8.3 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | 5,553 | 4,320 | 1,350 | -1,233 | -22.2 | -2,970 | -68.8 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 229,773 | 263,138 | 294,064 | 33,365 | 14.5 | 30,926 | 11.8 |
| දේශීය බැංකු ඒකක | 193,842 | 216,030 | 243,549 | 22,188 | 11.4 | 27,519 | 12.7 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | 35,931 | 47,108 | 50,515 | 11,177 | 31.1 | 3,407 | 7.2 |
| අනෙකුත් ශීර්ෂ(ශුද්ධ) | -66,813 | -79,874 | -97,426 | -13,061 | -19.5 | -17,552 | -22.0 |
| දේශීය බැංකු ඒකක | -47,798 | -50,944 | -60,248 | -3,146 | -6.6 | -9,304 | -18.3 |
| විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක | -19,015 | -28,930 | -37,178 | -9,915 | -52.1 | -8,248 | -28.5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සලකුණු වලින් ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) කෙරෙහි වූ බලපෑම් දැක්වේ.

1997 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 163 ක සමස්ත ශේෂයක් හා සැසැඳීමේදී 1998 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 37 ක් වූ පහත මට්ටමක සමස්ත ශේෂයක් වාර්තා වූයෙන්, විදේශීය අංශයෙහි වර්ධනයන්ගෙන් මුදල් සැපයුමට වඩා අඩු ප්‍රසාරණාත්මක බලපෑමක් ඇතිවිය. බැංකු අංශයෙහි ශුද්ධ විදේශීය වත්කම්, 1997 දී වාර්තා වූ සියයට 44 ක වර්ධනය හා සැසඳීමේදී 1998 දී සියයට 16.7 කින් වැඩිවිය. පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනයෙන් තුනෙන් එකකට විදේශීය වත්කම් දයක වූ අතර 1997 දී මෙම දයකත්වය සියයට 60 කි. 1998 දී මූල්‍ය අධිකාරීන්ගේ ශුද්ධ විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 11,808 කින් වර්ධනය විය. වෙළෙඳ බැංකු ශුද්ධ විදේශීය වත්කම් ද රුපියල් දශ ලක්ෂ 3,339 කින් වර්ධනය වූ අතර මෙයට මුළුමණින්ම හේතු වූයේ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමයි. මෙමගින් ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ විදේශීය අංශය වෙත තිබූ වගකීම් තියුණු ලෙස පහත වැටීමකි.


1998 දී මූල්‍ය සමස්තයන්හි වර්ධනයට බලපෑ ප්‍රධාන සාධකය වූයේ ශුද්ධ දේශීය වත්කම්හි වැඩිවීමයි. පෞද්ගලික අංශයට දුන් ණය 1997 හා සැසඳීමේදී සුළු වර්ධන වේගයකින් වැඩි වීම සහ රාජ්‍ය සංස්ථාවනට දුන් ණය පහත වැටුන තත්ත්වයක් යටතේ වුවද, රජයට දුන් ණයෙහි වැඩිවීම දේශීය ණය 1998 දී සියයට 14.4 කින් ඉහළ නැංවීමට හේතුවිය. මේ හා සැසඳීමේදී, 1997 දී දේශීය ණයෙහි වර්ධනය සියයට 10.5 ක් පමණක් විය. රටෙහි ආර්ථික ක්‍රියාකාරිත්වය අඩු වේගයකින් සිදුවීම සහ අපනයන සහ ආනයන වර්ධන වේගයන් සැලකිය යුතු ලෙස පහත වැටීම නිසා පෞද්ගලික අංශයට දුන් ණයෙහි වර්ධනය

1998 දී සියයට 11.8 කට සීමා වූයේ 1997 දී දක්නට වූ සියයට 14.5 ක වර්ධනයකට සාපේක්ෂවය. මෙම වර්ධන වේගයෙහි පහත වැටීම, විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක සම්බන්ධව වඩාත් කැපී පෙනුන අතර, එම ඒකකයන් විසින් පෞද්ගලික අංශයට සැපයූ ණය 1997 දී වාර්තා වූ සියයට 31 ක වර්ධනයට සාපේක්ෂව 1998 දී සියයට 7 කින් පමණක් ප්‍රසාරණය විය. විදේශීය ව්‍යවහාර මුදල් ඒකකයන් සැපයූ ණය වර්ධනය අඩුවීමට හේතුන් ගණනාවක් බලපෑවේය. විදේශීය මූල්‍ය වෙළෙඳපොළවල දිගටම පැවති අවිනිශ්චිතතාවය වි.ව්‍ය.මු.බැ. ඒකකයන්හි සමස්ත ක්‍රියාකාරිත්වය සංකෝචනය කිරීමකට මෙන්ම ඔවුන්ගේ ශුද්ධ විදේශීය වගකීම් වැඩි කර ගැනීම අධෛර්‍යවත් කිරීමටද හේතුවිය. විනිමය වෙළෙඳපොළවල පැවති චංචලතාව මෙන්ම, සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවති දේශීය පොලී අනුපාතිකයන්ද නිසා විදේශීය ව්‍යවහාර මුදල් ඒකකයන්ගෙන් ණය ලබා ගැනීම කෙරෙහි දේශීය ව්‍යවසායකයන් දක් වූ ආකර්ශණීයත්වය අඩුවිය. මේ අතර විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක, ශ්‍රී ලංකා රජයට එ. ජ. ඩොලර් දශ ලක්ෂ 100 ක සමූහ ණයක් (syndicate Loan) ලබාදීමටද සිය අරමුදල් යෙදවූහ. දේශීය බැංකු ඒකක විසින් සැපයූ ණය 1997 දී දක්නට වූ සියයට 11.4 වර්ධනයට සංසන්දනාත්මකව, 1998 දී සියයට 12.7 ක් වූ ඉහළ වර්ධන වේගයක් වාර්තා කළේ වි.ව්‍ය.මු.බැ. ඒකකයන් විසින් දෙන ලද ණයෙහි අඩුවීම යම් දුරකට සමනත් කරමිනි. ණය වර්ධනය කෙරේ වැඩි වශයෙන් දයක වූයේ විදේශීය බැංකු වලට වඩා දේශීය වාණිජ බැංකුය.

1997 දී දක්නට වූ සියයට 5.4 ක පහත වැටීමකට පසුව, 1998 දී රාජ්‍ය සංස්ථාවලට දුන් ණය සියයට 26.1 කින් අඩුවිය. කෙසේ වුවද, 1997 දී වූ අඩුවීම වි.ව්‍ය.මු.බැ. ඒකක වලින් වූ අතර 1998 දී දේශීය බැංකු ඒකක මෙන්ම වි.ව්‍ය.මු.බැ.ඒකක යන දෙඅංශයෙන්ම සැපයූ ණය පහත වැටීමක් මෙහිදී දක්නට විය. ඛනිජ තෙල් නිෂ්පාදිත, තිරිඟු සහ තිරිඟු පිටි සඳහා වූ ජාත්‍යන්තර මිල ගණන් පහත වැටීම නිසා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව සිය ක්‍රියාකාරිත්වයන් වැඩි දියුණු කර ගැනීමටත් එමගින් බැංකු අංශය වෙත වූ වගකීම් අඩුකර ගැනීමටත් සමත් වූහ.

1997 දී දක්නට වූ තත්ත්වයට සුවිශේෂ වශයෙන් ප්‍රතිවිරුද්ධව, 1998 දී රජයට දුන් ණය සැලකියයුතු ලෙස වර්ධනය විය. 1997 දී පෞද්ගලීකකරණයෙන් විශාල

**10.2 රූප සටහන**
**මූල්‍ය සමස්තයන්, සංසරණ ප්‍රවේගය සහ මුදල් ගුණකය**




වශයෙන් ලද විදේශීය අරමුදල් නිසා බැංකු ක්‍රමය වෙත වූ සිය වගකීම් අඩුකර ගැනීමට රජයට හැකිවිය. කෙසේ වෙතත් 1998 දී පෞද්ගලීකකරණයෙන් ලද විදේශීය මුදල් ප්‍රමාණය ඉතා අඩු මට්ටමක පැවතුණි. වැඩිදුරටත්, රජයේ ආදායම අයවැයෙන් අපේක්ෂිත ප්‍රමාණයට වඩා පහත වැටුන අතර වියදම් වැඩි වූයෙන් රජයට ණය ගැනීම් වැඩිකිරීමට සිදුවිය. මේ නිසා බැංකු අංශය විසින් රජයට දෙන ලද ණය වි.ව්‍ය.මු.බැ. ඒකකයන් විසින් දෙන ලද එ.ජ. ඩොලර් දශ ලක්ෂ 100 ක සමූහ ණය ඇතුළුව, සියයට 42.8 (රුපියල් දශ ලක්ෂ 19,368) කින් වර්ධනය විය. 1997 දී බැංකු අංශයෙන් රජයට දෙන ලද ණය සියයට 4 කින් හෙවත් රුපියල් දශ ලක්ෂ 1,881 කින් අඩුවිය.

### පදනම් මුදල්

සංචිත මුදල් (අධි බලැති මුදල් හෝ පදනම් මුදල්) 1997 දී වාර්තා වූ සියයට 2.1 (රුපියල් දශ ලක්ෂ 1,773) ක පහත වැටීමක් හා සැසඳීමේදී, 1998 දී සියයට 10.9 කින් හෙවත් රුපියල් දශ ලක්ෂ 9,130 කින් වර්ධනය විය. 1997 දී වාර්තා වූ අඩුවීමට හේතු වූයේ රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකකරණය කිරීම මගින් ලද අරමුදල් රජය විසින් මහ බැංකුවෙන් ලබාගෙන තිබූ ණය ගෙවීම සඳහා යොදා ගැනීමය. මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැදගත් අතරමැදි ඉලක්කයක් වශයෙන් මහ බැංකුව විසින් සංචිත මුදල් දිගටම යොදා ගන්නා ලදී. ආර්ථිකයේ උද්ධමන පීඩනයන් ගොඩ නැගෙනසේ සංචිත මුදල් අධික ලෙස ප්‍රසාරණයවීම වැලැක්වීම කෙරෙහි ප්‍රතිපත්ති යොමු කරන අතරම ද්‍රවශීලතා සංරෝධකයන්ගෙන් අවහිර නොවී ආර්ථික ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යෑම සඳහා වෙළෙඳපොළ වෙත සෑහෙන පරිදි ද්‍රවශීලතාවය ලබාදීම සඳහා ද අවධානය යොමු කෙරුණි. මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් වැඩිවීම සංචිත මුදල් වැඩිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය විය. ඒකාබද්ධ පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනයට වඩා අඩු වේගයකින් සංචිත මුදල් වර්ධනය වූයෙන් 1997 අගදී 3.98 ක් වූ ඒකාබද්ධ පුළුල් මුදල් ගුණකය 1998 අගදී 4.07 දක්වා පුළුව වශයෙන් වැඩිවිය. මෙමගින් 1998 දී මූල්‍ය ප්‍රතිපත්තිය සුළු වශයෙන් දැඩි කිරීමක් පිළිබිඹු විය. 1998 දී මුදලේ සාමාන්‍ය ආදායම් ප්‍රවේගය සියයට 2.9 ක් ව සාපේක්ෂ වශයෙන් ස්ථායිව පැවතුණි.

**10.3 රූප සටහන**
**මුදල් පදනම සහ මුදල් ගුණකය**




## 10.3 පොලී අනුපාතික

1997 අවසානයේදී පැවති පොලී අනුපාතිකවලට සාපේක්ෂව දැඩි මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් අනුපාතික ප්‍රතිශතාංක 1-2 කින් ඉහළ ගියද සාමාන්‍ය වශයෙන් 1998 දී පොලී අනුපාතික ස්ථායිව පැවතුණි. පොලී අනුපාතිකවල අඩු විචලතාවයන් පවත්වා ගැනීමට සාධක කිහිපයක්ම උපකාරි විය. අතිරික්ත ඉල්ලුම් පීඩනය මගහරිමින් පෞද්ගලික අංශයට දුන් ණයවල වර්ධනය සාපේක්ෂ ලෙස පහත් මට්ටමක පැවතුනි. දේශීය වෙළෙඳපොළ තුළින් රුපියල් අරමුදල් සඳහා වූ ඉල්ලුම අඩු කරමින් වසර අවසානයේදී රජය විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 100 ක සමූහ ණයක් රජය විසින් ලබා ගන්නා ලදී. මේ අතර, ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ අනුපාතිකයන්හි ඉහළ අන්තය ස්ථායී කිරීමේ පරමාර්ථයෙන් මහ බැංකුව විසින් එක් දින ප්‍රතිවිකුණුම් පහසුකම නැවත හඳුන්වා දෙන ලදී.

### කෙටිකාලීන පොලී අනුපාතික


ප්‍රාථමික වෙළෙඳපොල භාණ්ඩාගාර බිල්පත් එලද අනුපාතික වසර පුරා ක්‍රමයෙන් වැඩි වුවද වෙළෙඳපොල තුළට ද්‍රවශීලතා ගලා ඒම් හේතුවෙන් දෙසැම්බර් මාසයේ දී ඵලද අනුපාතිකයන්ගේ පහළ යාමක් පෙන්නුම් කෙරිණි. වසර ආරම්භයේදී සියයට 9.97 වූ ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් ඵලද අනුපාතිකය 1998 පෙබරවාරි මාසයේදී සියයට 11.00 දක්වා වර්ධනය වූ අතර 1998 ජූලි අග දක්වා එම මට්ටමේම පැවතුණි. ඉන්පසුව අනුපාතිකය සියයට 12 ක පමණ මට්ටමක ස්ථායිව පැවැතුණි. හය මාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතික සහ දොළොස් මාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතික ඒ හා සමානව ගමන් කිරීමක් පෙන්නුම් කෙරිණි. සය මාසික භාණ්ඩාගාර බිල්පත් සඳහා වර්ෂය ආරම්භයේදී සියයට 9.95 ක්වූ බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකය වසර අවසානයේදී සියයට 12.34 ක් විය. දෙළොස් මාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය වසර ආරම්භයේදී සියයට 10.24 සිට 1998 ඔක්තෝබර් අවසානයේදී සියයට 13.06 ක් දක්වා වර්ධනය වීමෙන් අනතුරුව වසර අවසානයේදී සියයට 12.59 ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණි.

ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින් අනෙකුත් කෙටිකාලීන අනුපාතිකද, එනම්, වට්ටම් අනුපාතිකය, ප්‍රතිවට්ටම් අනුපාතිකය සහ ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකයද වසර තුළදී මඳ වශයෙන් ඉහළ නැගුණි. වර්ෂය ආරම්භයේදී සියයට 9.72 ක්ව පැවැති ත්‍රෛමාසික වට්ටම් අනුපාතිකය නොවැම්බර් මැද වනවිට සියයට 12.50 දක්වා ක්‍රමයෙන් වර්ධනය වී අනතුරුව වසර අවසානයේදී සියයට 11.86 ක් දක්වා පහත වැටුණ අතර වර්ෂය ආරම්භයේදී සියයට

12.97 ක්ව පැවැති ත්‍රෛමාසික ප්‍රතිවට්ටම් අනුපාතිකය නොවැම්බර් මාසය මැදදී සියයට 15.65 කට වර්ධනයවී 1998 අවසානයේදී සියයට 15.01 ක් දක්වා පහත වැටුණි. දෙළොස් මාසික වට්ටම් අනුපාතිකය වර්ෂය ආරම්භයේදී සියයට 9.99 සිට දෙසැම්බර් අවසානයේදී සියයට 12.39 කට වර්ධනය වූ අතර මෙම අනුපාතිකය 1998 ඔක්තෝබර් අවසානයේදී සියයට 12.91 ක් දක්වා මට්ටමකට ඉහළ නැගුණි. දෙළොස් මාසික භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිවට්ටම් අනුපාතිකය සියයට 13.24 සිට වසර අවවසානයේදී සියයට 15.54 ක් දක්වා පහත වැටීමට පෙර අගෝස්තු මුලදී සියයට 16.39 ක් දක්වා වර්ධනය විය.

දැමීය. 1997 අවසානයේදී සියයට 11.0 ක් වූ එක්දින ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය ජනවාරි මාසයේදී සියයට 12.00 දක්වා වැඩ කරනු ලැබූ අතර එය මාර්තු අවසානය දක්වා එම මට්ටමේම පවත්වාගනු ලැබූ අතර ඉන්පසු විදේශීය විනිමය වෙළෙඳපොලෙහි වූ පීඩනය යම් පමණකින් ලිහිල් වීමත් සමග අප්‍රේල් මාසයේදී එය සියයට 11.65 ක් දක්වා පහත දමනු ලැබීය. මැයි මාසයේදී විනිමය වෙළෙඳපොලෙහි තවදුරටත් වූ විචලනයන් හේතුවෙන් නැවතත් එය සියයට 12.15 කට ඉහළ ගිය අතර ඔක්තෝබර් මාසය දක්වා සියයට 12.00 ට වඩා මඳක් වැඩියෙන් පවත්වා ගැනුණි. 1998 අවසාන භාගයේදී උද්ධමනයෙහි පහත යාම

**10.4 රූප සටහන**
**පොලී අනුපාතික**




පොලී අනුපාතික සඳහා මූලික සංඥාදීමේ යන්ත්‍රණයක් ලෙස 1993 දී ප්‍රථම වරට හඳුන්වා දුන් එක්දින ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය ඉතා වැදගත් මූල්‍ය ප්‍රතිපත්ති උපකරණයකි. එය ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි අනුපාතිකයන්හි පහළ අන්තය ස්ථායීකරණය කිරීම සඳහා උපකාරී වේ. 1997 අවසාන මාසයේදී සහ 1998 මුල් කාලයේදී මූල්‍ය ප්‍රතිපත්ති යම් පමණකින් දැඩි කිරීමක් නිසා එක් දින ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය ක්‍රමයෙන් ඉහළ

හා විනිමය වෙළෙඳපොලෙහි වැඩි ස්ථායීතාවත් නිසා 1998 අවසානයේදී එක්දින ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සියයට 11.25 ක් දක්වා ක්‍රමයෙන් පහත හෙළීමට හැකියාව ලැබුණි.

වසර තුළදී ඒක්ෂණ වෙළෙඳපොල අනුපාතික සාපේක්ෂ වශයෙන් අඩු විචලතාවක් පෙන්නුම් කෙරිණි. 1997 අවසානයේදී පැවැති සියයට 12.00-20.00 පරාසය සමඟ සසඳා බලන විට ඒක්ෂණ වෙළෙඳපොල අනුපාතික 1998 අවසානයේදී සියයට 13.00 - 14.00 පරාසයක පැවැතුනි.

ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකයෙහි සිදුවන වෙනස්වීම් ඒක්ෂණ වෙළෙඳපොළ අනුපාතිකයන්ගේ පහළ සීමාවන්ට විශාල ලෙස බලපෑමක් ඇති කෙරේ. වෙළෙඳපොල තුළවූ තාවකාලික ද්‍රවශීල ඌණතා පිළිබිඹු කරමින් ඒක්ෂණ වෙළෙඳපොල අනුපාතික මාර්තු, ජූලි සහ ඔක්තෝබර් මාසවලදී උපරිම සහ අවම අනුපාතික අතර සාපේක්ෂ වශයෙන් වැඩි පරතරයක් සහිතව තරමක ඉහළ මට්ටමකට ලඟා විය. ඉහළම අගය වූ සියයට 28.00 ජූලි මාසයේ වාර්තා විය.

මහ බැංකුව ඒක්ෂණ වෙළෙඳපොල පොලී අනුපාතිකයන්හි ඉහළ සීමාවේ ද තවදුරටත් ස්ථායීතාවයක් ඇති කරමින් මුදල් වෙළෙඳපොළෙහි කෙටිකාලීන අනුපාතික තවදුරටත් ස්ථායී කිරීමේ අදහස ඇතිව 1998 නොවැම්බර් මාසයේදී මහ බැංකුව ප්‍රතිවිකුණුම් පහසුකම නැවත හඳුන්වා දෙන ලදී. ප්‍රතිවිකුණුම් අනුපාතිකය දෛනික පදනම මත මහ බැංකුව විසින් තීරණය කරනු ලබන අතර එය බැංකුවෙහි ද්විතීයික කවුළුව තුළ දනට පවතින එක්දින වට්ටම් අනුපාතිකයට සමානය. ප්‍රතිවිකුණුම් පහසුකම ප්‍රථම වරට නොවැම්බර් මාසයේදී නැවත හඳුන්වා දෙන විට ප්‍රතිවිකුණුම් අනුපාතිකය 15.45 ක් වූ අතර ඉතිරි කාලපරිච්ඡේදය තුළදීද එය ඒ හා සමාන මට්ටමක පවත්වා ගන්නා ලදී.

විශේෂයෙන් වසරේ අවසාන භාගය තුළදී ද්‍රවශීලතාව වර්ධනය වීමේ හේතුවෙන්ද මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙළෙඳපොල කටයුතු නිසාද ඒක්ෂණ මුදල් වෙළෙඳපොලෙහි අනුපාතිකවල අඩු විචලතාවක් පෙන්නුම් කෙරිණි.

දින හතකින් කල්පිරෙන මහ බැංකු සුරැකුම්පත් ද වෙළෙඳපොලෙහි පැවැතිණ. මෙම සුරැකුම්පත් සඳහා වූ පොළී අනුපාතික දින හතක ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකයට සමාන විය. වර්ෂය තුල පොළී අනුපාතික සියයට 11.93 - 12.06 පරාසයක විය.

## තැන්පතු අනුපාතික

වාණිජ බැංකුවල තැන්පතු අනුපාතික භාණ්ඩාගාර බිල්පත් එලදව හා සමාන ප්‍රවනතාවයක් දැඩි ලෙස අනුගමනය නොකළද වාණිජ බැංකුවල තැන්පතු අනුපාතික වසර පුරා පහත් මට්ටමක පැවැතුණි. 1997 අවසානයේදී සියයට 3.00-11.00 ක පරාසයක පැවැති වාණිජ බැංකුවල ඉතිරිකිරීම් තැන්පතු අනුපාතික පෙබරවාරි අවසානයේදී මඳ වශයෙන් සියයට 3.00-10.00 අතර පරාසයකට පහත වැටී, තවදුරටත් එය සියයට 2.00-10.00 පරාසයකට පැමිණි අතර වසරේ ඉතිරි කාලය තුළදී එම පරාසය තුලම පැවතුණි. 1997 අවසානයේදී සියයට 8.50-15.25 පරාසයක පැවැති එක් අවුරුදු ස්ථිර තැන්පතු අනුපාතික 1998 ජනවාරි මාසයේදී සියයට 8.50-12.50 ක පරාසයකට පහත වැටුණි. මෙම අනුපාතිකයන් තවදුරටත් සුළු වශයෙන් 1998 පෙබරවාරි මාසයේදී සියයට 8.50-12.00 ක පරාසයකට පහත වැටීමක් පෙන්නුම් කළ අතර එය දෙසැම්බර් මාසයේදී සියයට 9.00-13.00 පරාසයකට පැමිණෙන තෙක් එය ආසන්න වශයෙන් ඉහත මට්ටමේම පැවැතුණි. වාණිජ බැංකුවල පොලී දරණ සියලුම තැන්පතු මත ගෙවනු ලබන පොලී අනුපාතික පදනම් කොටගෙන මාසිකව ගණනය කරනු ලබන බර තබන ලද සාමාන්‍ය තැන්පතු අනුපාතිකය 1997 දෙසැම්බර් මාසයේදී සියයට 10.00 සිට 1998 දෙසැම්බර් මාසයේදී සියයට 9.2 ක් දක්වා ක්‍රමයෙන් අඩුවුනි. සාමාන්‍ය බර තබන ලද ස්ථිර තැන්පතු අනුපාතිකයද 1997 දෙසැම්බර් මාසයේදී සියයට 11.50 ක සිට 1998 දෙසැම්බර් මාසයේදී සියයට 10.70 ක් දක්වා අඩුවිය.

ජාත්‍යන්තර ප්‍රවනතාවයන් අනුගමනය කරමින් විදේශීය මුදල් ඉතිරි කිරීමේ තැන්පතු සඳහා වූ පොලී අනුපාතික වසර තුළදී යම් පමණක විචලතාවයක් පෙන්වීය. එක්සත් ජනපද ඩොලර් ඉතිරි කිරීම් තැන්පතු සඳහා වූ අනුපාතික ජාත්‍යන්තර අනුපාතිකයන් අඩුවීමත් සමග සැප්තැම්බර් මාසයේදී සියයට 2.75-6.25 පරාසයකට පහත වැටීමට පෙර වසර ආරම්භයේදී වූ සියයට 2.50-5.50 පරාසයක සිට ජූලි මාසයේදී සියයට 3.00-6.25 පරාසයකට ඉහළ නැගුණි. බ්‍රිතාන්‍ය පවුම් තැන්පතු සඳහා තරමක් ඉහළ අනුපාතිකයක් ගෙවූ අතර 1998 ආරම්භයේදී එම අනුපාතික වසරකට සියයට 3.00-8.00 අතර පරාසයක පැවැතුණි. 1998 අවසානයේදී එම අනුපාතික සියයට 4.50-6.00 ක පටු පරාසයක විය. ස්ථිර තැන්පතු සම්බන්ධයෙන්ද මේ හා සමාන ප්‍රවණතාවක් දක්නා ලදී. එක්සත් ජනපද ඩොලර් වලින් වූ එක් අවුරුදු ස්ථිර තැන්පතු අනුපාතික 1998 ජනවාරි මාසයේදී වසරකට සියයට 5.20-6.00 ක පරාසයක සිට වසර අවසානයේදී සියයට 4.00-6.25 පරාසයක විය. බ්‍රිතාන්‍ය පවුම් වලින් යුක්ත වූ එක් අවුරුදු ස්ථිර තැන්පතු සඳහා වූ අනුපාතික එම කාලපරිච්ඡේදය තුළදී වසරකට සියයට 5.75-7.00 පරාසයක සිට සියයට 4.65-6.63 පරාසයක වාර්තා විය. මේ අතර වසර අවසානයේදී විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් පිරිනමන ලද එක්සත් ජනපද ඩොලර් තැන්පතු සඳහා වූ අනුපාතික සියයට 4.00-6.00 අතර පරාසයක වූ අතර බ්‍රිතාන්‍ය පවුම් තැන්පතු සඳහා වූ පොළී අනුපාතික සියයට 5.25-7.00 අතර පරාසයක විය.

වෙළෙඳපොලෙහි අනිකුත් බොහෝ පොලී අනුපාතික සඳහා බලපෑම් කරනු ලබන්නාවූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉතිරි කිරීම් තැන්පතු අනුපාතික 1997 අවසානයේ දී වාර්ෂිකව සියයට 10.80 සිට 1998 ජනවාරි මාසයේදී සියයට 9.60 ක් දක්වා අඩුවීමෙන් පසු එය ජූනි මස අවසානය දක්වා එම මට්ටමේම පැවැති නැවත එය සියයට 10.50 ක් දක්වා ඉහළ ගිය අතර එය දෙසැම්බර් අවසානය දක්වා එම මට්ටමේ පැවතුණි. එක් අවුරුදු ස්ථිර තැන්පතු සඳහා වූ අනුපාතිකද ඒහා සමාන ප්‍රවනතාවයක් පෙන්වීය. මෙම අනුපාතිකය 1997 අවසානයේදී සියයට 11.00 සිට 1998 ජනවාරි මාසයේදී සියයට 10.00 දක්වා අඩුවිය. එය ජූලි මාසයේදී සියයට 11.00 ක් දක්වා ඉහළ නැංවුන අතර ඉතිරි කිරීම් තැන්පතු අනුපාතික මෙන් නොව ඔක්තෝබර් මාසයේදී නැවත සියයට 11.50 තෙක් ඉහළ නැංවීමෙන් අනතුරුව 1998 අවසානය දක්වාම එම මට්ටමේම පවත්වා ගැණුනි.

## ණය පොලී අනුපාතික

වාණිජ බැංකු විසින් තම ප්‍රමුඛ ගණුදෙනුකරුවන් සඳහා පිරිනමන අනුපාතිකයන් මත පදනම් වූ සාමාන්‍ය බර තබන ලද ප්‍රමුඛ ණය අනුපාතිකය 1997 දෙසැම්බර් මාසයේදී සියයට 14.20 සිට 1998 ජනවාරි මාසයේදී සියයට 15.00 දක්වා වර්ධනය විය. ජූලි මාසයේදී සියයට 15.80 ක ඉහළම අගයක් සමග 1998 වැඩි කාලයක් තුළ සාමාන්‍ය බර තබන ලද ප්‍රමුඛ ණය අනුපාතිකය සියයට 15.00 ආසන්නයේ පැවැතුනි. සාමාන්‍ය බර තබන ලද ප්‍රමුඛ ණය අනුපාතිකය 1997 අවසානයේදී සියයට 14.50 සිට 1998 අවසානයේදී සියයට 14.90 දක්වා වර්ධනය විය. බැංකු අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වූ සාමාන්‍ය බර තබන ලද ණය අනුපාතිකය 1997 සැප්තැම්බර් අවසානයේදී වූ සියයට 20.50 සිට 1998 සැප්තැම්බර් මාසය අවසානයේදී සියයට 19.60 ක් දක්වා පහත වැටුණි.

විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් අයකරනු ලබන පොලී අනුපාතික සාමාන්‍ය වශයෙන් ලන්ඩන් අන්තර් බැංකු පිරිනැමුම් අනුපාතිකය මත පදනම් වේ. එක්සත් ජනපද ඩොලර් වලින් වූ ණය සඳහා වූ අනුපාතික සියයට 3.50-8.75 අතර පරාසයක විය. ආයෝජන මණ්ඩලය යටතට යටතේ නොවන අපනයනකරුවනට සපයනු ලබන විදේශීය මුදල් ණය සඳහා වන පොලී අනුපාතික 1998 දී සියයට 6.18-10.50 අතර පරාසයක පැවතුණි.

කෙටිකාලීන අරමුදල් සපයා ගැනීම සඳහා යොදගනු ලබන ආයතනික ණය උපකරණයක් වන වාණිජ පත් සඳහා වන අනුපාතිකයන්හිද පහළ යාමක් පෙන්නුම් කළ අතර එය පෙර වසරේ සියයට 10.00-27.60 පරාසයකට සංසන්දනාත්මකව අදල වසරේදී සියයට 11.00-18.00 අතර පරාසයක පැවැතුණි. මේ අතර, ණය කාඩ්පත් මගින් කරනු ලබන ගෙවීම් සඳහා වාණිජ බැංකු විසින් අයකරනු ලබන පොලී අනුපාතික පෙර වසරේ මෙන් සියයට 20.00-33.00 අතර පරාසයක පැවැතුණි.

1990 අංක 6 දරණ සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත සහ 1990 අංක 2 දරණ ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 23 වන වගන්තිය යටතේ මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන නෛතික පොලී අනුපාතිකය සහ වෙළෙඳපොළේ පොලී අනුපාතිකය යන දෙකම 1998 දී සියයට 11.5 ක් විය. එම දෙකම පෙර වසරේදී සියයට 12.7 ක් විය.

## දිගුකාලීන පොලී අනුපාතික

දිගුකාලීන පොලී අනුපාතිකවලට රුපියල් සුරැකුම්පත් පොලී අනුපාතික, භාණ්ඩාගාර බැඳුම්කර ඵලද අනුපාතික, දිගුකාලීන ණය දීමේ ආයතනයන්ගේ ණය පොලී අනුපාතික සහ ණයකර පොලී අනුපාතිකද ඇතුලත් වේ. වසර තුළදී අවුරුදු 4-5, පස් අවුරුදු, අවුරුදු 5-6, අවුරුදු 6-7 සහ අවුරුදු 9-10 පරිණත කාලයකින් යුත් රුපියල් ණය නිකුත් කෙරිණ. අදල පොලී අනුපාතික බලධාරීන් විසින් තීරණය කරනු ලබන අතර ඒවා සියයට 11.00-12.25 අතර පරාසයක පැවැතුණ අතර දිගුකාලීන පරිණතියකින් යුත් ණය සඳහා ඉහළ අනුපාතිකයක් පැවැතුණි. බොහොමයක් නිකුතූන් අවුරුදු 6-7 කල්පිරෙන ඒවා විය. රුපියල් ණය සඳහා 1998 දී ප්‍රදනය කරන ලද අනුපාතිකය 1997 දීට වඩා ඉහළ අගයක් විය. 1998 දෙසැම්බර් අගදී වසර 6-7 කාලසීමාවකින් කල්පිරෙන රුපියල් ණය සියයට 12.25 ක පොලී අනුපාතිකයට නිකුත් කරන ලදී. ඒ හා සංසන්දනාත්මකව ඊට සමාන කාලසීමාවකින් කල්පිරෙන 1997 සැපැතැම්බර් මාසයේදී නිකුත් කරනු ලැබූ රුපියල් ණය සඳහා පොලිය සියයට 11.75 ක් විය.

මහ බැංකුව අවුරුදු 2, අවුරුදු 3 සහ අවුරුදු 4 ක කාල පරිණතියකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලදී. මෙම බැඳුම්කර සඳහා කූපන් අනුපාතයක් තිබෙන අතර (පොලී අර්ධ වාර්ෂිකව ගෙවනු ලැබේ) ඒවා වෙන්දේසි කරනු ලැබේ. වසර තුළදී වසර දෙකකින් කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර කූපන් අනුපාතිකය සියයට 11.00 ක් වූ අතර වෙන්දේසියේදී තීරණය කරනු ලැබූ බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකය සියයට 10.81-13.94 ක් විය. වසර තුනෙහි භාණ්ඩාගාර බැඳුම්කර සියයට 11.50 ක කූපන් අනුපාතිකයක් සහිත වූ අතර බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකය සියයට 12.44-13.93 අතර පරාසයක පැවැතින. වසර තුළදී වසර හතරකින් කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර සියයට 12 ක කූපන් අනුපාතිකයකට නිකුත් කළ අතර ඵලද අනුපාතිකයන් සියයට 12.93-13.94 අතර පරාසයක පැවැතුනි.

1998 දී, දිගුකාලීන ණය දෙන ආයතන විසින් අය කරනු ලබන පොලී අනුපාතිකයන්ද සුළු වශයෙන් පහත වැටිණ. වසර තුළදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව තම ණය පොලී අනුපාතික ප්‍රතිශතාංක 2 කින් පහත හෙළන ලදී. වසර අවසානයේදී මෙම බැංකුවෙහි ණය පොලී අනුපාතිකයන් සියයට 15.00-18.00 අතර පරාසයක පැවැතින. ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව එහි පොලී අනුපාතික 1997 අවසානයේදී සියයට 13.00-22.00 පරාසයක සිට 1998 අවසානයේදී සියයට 13.00-20.50 පරාසයකට පහත දැමීය. මේ හා සමාන ප්‍රවනතාවක් අනුගමනය කරමින් ජාතික සංවර්ධන බැංකුවද තම ණය පොලී අනුපාතික පෙර වසරේ වූ සියයට 11.50-25.00 සිට සියයට 9.60-20.00 දක්වා පහත හෙලන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ණය සඳහා අය කරනු ලැබූ පොලී අනුපාතික 1997 දී පැවැති සියයට 10.00-15.00 පරාසයකට සංසන්දනාත්මකව 1998 දී සියයට 10.00-16.00 අතර පරාසයක විය. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණය පොලී අනුපාතික ප්‍රතිශතාංක 1.5 කින් අඩු කළ අතර එය 1998 අවසානයේදී සියයට 14.00-15.00 අතර පරාසයක පැවැතින.

වෙළෙඳපොල තුළ වූ නව සිදුවීමක් වූයේ ලැයිස්තුගත ණයකර නිකුතූන්හි වැඩි වීමය. වසර තුළදී දේශීය පෞද්ගලික බැංකු තුනක් විසින් වසර පහකින් කල්පිරෙන ණයකර නිකුත් කරන ලදී. නිකුතූන් 4 ක් විය. මින් දෙකක ස්ථිර පොලී අනුපාතිකයක් වූ අතර (කාර්තුමය ගෙවීම් සහිතව වසරකට සියයට 13.5) එක් නිකුතුවක් සඳහා ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකයට එක් ප්‍රතිශතාංකයක් එකතු කිරීමෙන් ගණනය කරනු ලැබූ වල අනුපාතිකයක් විය. අනෙක් නිකුතුව සඳහා පොලිය ස්ථිර පොලී අනුපාතිකයක් හෝ එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් අනුපාතයට ප්‍රතිශතාංක 1 ක් එකතු කරනු ලැබූ වල අනුපාතිකයක් සහිතය. ලැයිස්තුගත කළ වෙනත් සමාගම් තුනක්ද ස්ථිර පොලී සහිත ලැයිස්තුගත ණයකර නිකුත් කළ අතර ඒවායෙහි පොලී අනුපාතික වසරකට සියයට 15.00-18.00 අතර පරාසයක විය.

## 10.4 වාණිජ බැංකු කටයුතු

වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකක වර්ෂය තුළදී සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කළ අතර, විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල (වි.ව්‍ය.මු.බැ.) කටයුතු පසුබෑමකට ලක්විය. දේශීය ආර්ථික වර්ධනය අඩුවීම සහ ආනයන සහ අපනයන වර්ධනයෙහි අඩුවීම, බැංකු අංශයෙහි වර්ධනයට බාධාකාරී විය. මීට අමතරව, අන්තර්ජාතික මූල්‍ය වෙළෙඳපොළවල පැවති අස්ථාවරභාවය සහ සාපේක්ෂ වශයෙන් දේශීය පොලී අනුපාතික පහත මට්ටමක පැවතීම නිසා විදේශ ව්‍යවහාර මුදල් වලින් ණය ගැනීම ආකර්ශනීයත්වයෙන් අඩුවීම, වි.ව්‍ය.මු.බැ.ඒකකවල කටයුතු සංකෝචනය වීමට බලපෑවේය. වාණිජ බැංකුවල දේශීය ඒකකයන්හි මුළු වත්කම්, පසුගිය වසරේ පැවති වර්ධන වේගයට සමානව සියයට 13 කින් වර්ධනය විය. වි.ව්‍ය.මු.බැ. ඒකකවල මුළු වත්කම් පසුගිය වසරෙහි වූ සියයට 17.6 ක සැලකියයුතු වර්ධනයට ප්‍රතිවිරුද්ධව සියයට 9 කින් පහත වැටුණි. වි.ව්‍ය.මු.බැ. ඒකකවලින් දේශීය අංශය වෙත අරමුදල් සැපයීම පහත බැසීම කැපී පෙනෙන ලක්ෂණයක් විය. ශ්‍රී ලංකා රජයට එ.ජ.ඩොලර් දශලක්ෂ 100 ක සාමූහික ණය මුදලක් දී තිබියදීත් 1998 දී වි.ව්‍ය.මු.බැ.ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් ප්‍රමාණයෙහි වැඩිවීමක් සිදුවිය. මේ අතර විදේශීය වගකීම් වැඩිවීම නිසා දේශීය බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් පහත වැටුණි. විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතුවල සැලකියයුතු වැඩිවීමක් විදේශීය වගකීම් ඉහළ මට්ටමක පැවතීමට මූලික වශයෙන් බලපෑවේය. අන්තර්ජාතික මූල්‍ය වෙලෙඳපොලවල පැවති අස්ථාවර ස්වභාවය සහ රුපියලෙහි විශාල අවප්‍රමාණයවීමක් අපේක්ෂා කිරීම නිසා සමහර නේවාසිකයින් ඔවුන්ගේ තැන්පතු විදේශීය ව්‍යවහාර මුදලින් පවත්වා ගෙන යාමට දැක්වූ කැමැත්ත මෙමගින් පිළිබිඹු විය.

රජයේ සුරැකුම්පත් සඳහා වූ පොලී අනුපාතික ප්‍රතිශතාංක 2 කින් පමණ ඉහළ ගිය මුත් වාණිජ බැංකුවල සාමාන්‍ය ණය පොලී අනුපාතිකවල සැළකියයුතු අඩුවීමක් දක්නට නොලැබුණි. තැන්පතු අනුපාතික නොවෙනස්ව පැවතීමක් හෝ සමහර අවස්ථාවල අඩුවීමක් දක්නට ලැබුණි. ඒ අනුව, බැංකුවල ආන්තිකයන් වැඩිවූ අතර, බැංකු කිහිපයක ලාභ අනුපාතිකවල වර්ධනය පිරිවැටුමෙහි වර්ධනය අභිබවා ඇති බව වාර්තා වී ඇත. කෙසේවුවද, තැන්පත්කරුවන් විදේශීය ව්‍යවහාර මුදල්වලින් තැන්පතු පවත්වාගෙන යාමට පැවති කැමැත්ත සහ ආර්ථික කටයුතුවල පහත වැටීමක් පැවතීම පිළිබිඹු කරමින් දේශීය බැංකු ඒකකවල ඉල්ලුම් තැන්පතු සහ කාලීන හා ඉතුරුම් තැන්පතු යන දෙකින් සමන්විත රුපියල් තැන්පතුවල වර්ධනය වර්ෂය තුළ පහත වැටුණි. මීට ප්‍රතිවිරුද්ධව, දේශීය ඒකකයන් සමග පැවති විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතුවල සීඝ්‍ර වර්ධනයක් පෙන්විය (1997 පැවති සියයට 22 වර්ධනය හා සසඳන විට 1998 දී සියයට 41). වි.ව්‍ය.මු.බැ. ඒකකවලින් දුන් ණයවල අඩු වර්ධනය තරමක්දුරට පිළිබිඹු කරමින්, වාණිජ බැංකුවල දේශීය ඒකකයන්ගෙන් පෞද්ගලික අංශයට ලබාදුන් ණය පසුගිය වර්ෂය හා සසඳන විට මඳ වශයෙන් ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය. ණය වර්ධනයෙන් වැඩි කොටසක් සඳහා දේශීය බැංකු දායක විය. විදේශීය ව්‍යවහාර මුදල් වලින් ණය ගැනීම සඳහා අඩු ආකර්ශණයක් පැවතීම පිළිබිඹු කරමින් ආයෝජන මණ්ඩලය යටතේ නොවන අපනයනකරුවන් සඳහා වාණිජ බැංකු මගින් ලබා දුන් ණය 1997 දී වූ එ.ජ.ඩොලර් දශලක්ෂ 254 සිට 1998 දී එ.ජ.ඩොලර් දශලක්ෂ 177 දක්වා පහත වැටුණි.

වර්ෂය අගදී රජය වි.ව්‍ය.මු.බැ. ඒකකවලින් එ.ජ.ඩොලර් දශලක්ෂ 100 ක සාමූහික ණය මුදලක් ලබා ගැනීම දේශීය වෙළෙඳපොළ පොලී අනුපාතික සඳහා පැවති පීඩනය අඩුකිරීමට උපකාරී විය.

### වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම් ව්‍යුහය

වාණිජ බැංකුවල දේශීය ඒකකයන්හි මුළු වත්කම් ප්‍රමාණය 1997 වාර්තා වූ රුපියල් දශලක්ෂ 52,994 (සියයට 13.6) ක වැඩිවීම හා සසඳන විට 1998 දී රුපියල් දශලක්ෂ 58,892 (සියයට 13.3) කින් වර්ධනය විය. ණය වර්ධනය අඩුවීම ආනයන සහ අපනයනවල අඩු වර්ධනය තුළින් විද්‍යාමාන විය. වාණිජ බිල්පත්ද ඇතුලත් වූ වාණිජ බැංකුවල මුළු ණය සහ අත්තිකාරම් සියයට 14.6 කින් වර්ධනය වී වාණිජ බැංකුවල මුළු වත්කම්වල වර්ධනයට සියයට 57 කින් දායක විය. විදේශීය කටයුතුවලින් වූ ලැබීම්වල සැලකියයුතු අඩුවීම පිළිබිඹු කරමින්, වාණිජ බැංකුවල විදේශීය වත්කම්වල වැඩිවීම මුළු වත්කම්වල වැඩිවීමට සිදු කළ දායකත්වය 1997 වාර්තාගත සියයට 36 හා සැසඳීමේදී 1998 දී සියයට 18 ක් පමණක් විය. මෙය සහ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන පහත වැටීම, වාණිජ බැංකුවල ද්‍රවශීල වත්කම්වල අඩු වර්ධනයක් පැවතීමට හේතුවිය. මේ අනුව, සමස්ත ද්‍රවශීල වත්කම් (1998 මැයි 18 දින සිට බලපැවැත්වෙන පරිදි ද්‍රවශීල වත්කම් ලෙස සලකනු ලැබූ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනද ඇතුලත්ව) මුළු වත්කම්වල අනුපාතයක් ලෙස දරූ කොටස, 1997 දී පැවති සියයට 40 සිට 1998 දී සියයට 33 දක්වා පහත වැටුණි.

1997 දී සියයට 9.5 කින් වර්ධනය වූ අපනයන බිල්පත්, ආනයන බිල්පත් සහ දේශීය බිල්පත් ඇතුලත් වූ වාණිජ බිල්පත් දැරීම ඒ හා සසඳන විට, 1998 දී සියයට 36.4 දක්වා ඉහළ අනුපාතිකයකින් වර්ධනය විය. මෙම වැඩිවීම මුළුමනින්ම පිළිබිඹු වූයේ ආනයන බිල්පත් දැරීම තුළිනි. වර්ෂය තුළදී අපනයන වර්ධනයෙහි පහත වැටීම විද්‍යාමාන කරමින් අපනයන බිල්පත්වල ආයෝජනය කිරීම 1997 දී වූ සියයට 12.2 වර්ධනය හා සසඳන විට 1998 දී සියයට 2.1 කින් අඩුවිය.

වත්කම්වල අඩු වර්ධනය හා සමගාමීව යමින්, වාණිජ බැංකු දේශීය ඒකකවල වගකීම් 1997 ට සාපේක්ෂව 1998 දී අඩු වේගයකින් වර්ධනය විය. මුළු තැන්පතු වගකීම් 1997 දී පැවති සියයට 15.4 වර්ධනය හා සසඳනවිට 1998 දී සියයට 12.3 කින් වර්ධනය විය. මේ අතර, අන්තර් බැංකු ණය ගැනීම් පසුගිය වර්ෂයේ වාර්තා කළ සියයට 7.8 ක වැඩිවීම හා සසඳන විට සියයට 17.6 කින් වර්ධනය විය. මෙම වර්ධනයන්ට අනුව පොලී අනුපාතිකයන් පසුගිය වර්ෂය හා සැසඳීමේදී මඳ වශයෙන් ඉහළ මට්ටමක පැවතුනි.

**10.4 සංඛ්‍යා සටහන**

**වාණිජ බැංකු වත්කම් සහ වගකීම්වල තෝරාගත් ශීර්ෂ**

| ශීර්ෂය | වෙනස | | | |
|---|---|---|---|---|
| | 1997 දෙසැම්බර්/1996 දෙසැම්බර් | | 1998 දෙසැම්බර්/1997 දෙසැම්බර් | |
| | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | සියයට ගණන |
| වත්කම් වර්ගීකණය | | | | |
| 1. ද්‍රවශීල වත්කම් | 21,428 | 21.9 | 19,306 | 16.2 |
| අතැති මුදල් | 540 | 7.8 | 865 | 11.6 |
| මහ බැංකුවෙන් අය වියයුතු ශේෂය | -5,228 | -15.3 | 2,303 | 7.9 |
| අතැති විදේශීය ව්‍යවහාර මුදල් | 19,385 | 87.1 | 10,596 | 25.5 |
| භාණ්ඩාගාර බිල්පත් | 4,960 | 31.9 | -6,938 | -33.9 |
| භාණ්ඩාගාර බැඳුම්කර(අ) | | | 5,008 | |
| වාණිජ බිල්පත් | 1,771 | 9.5 | 7,472 | 36.4 |
| දේශීය බිල්පත් | -61 | -44.4 | -66 | -85.6 |
| ආනයන බිල්පත් | 1,072 | 8.7 | 7,687 | 57.1 |
| අපනයන බිල්පත් | 760 | 12.2 | -150 | -2.1 |
| 2. ආයෝජන | 8,454 | 31.4 | -3,193 | -9.0 |
| භාණ්ඩාගාර බිල්පත් | 4,960 | 31.9 | -6,938 | -33.9 |
| රජයේ සුරැකුම්පත් | 1,776 | 211.3 | 2,733 | 104.5 |
| අනෙකුත් ආයෝජන | 1,718 | 16.2 | 1,012 | 8.2 |
| 3. මුළු ණය සහ අත්තිකාරම් | 27,766 | 13.7 | 33,588 | 14.6 |
| ණය | 19,968 | 17.0 | 15,869 | 11.5 |
| අයිරා | 6,027 | 9.1 | 10,247 | 14.2 |
| වාණිජ බිල්පත් | 1,771 | 9.5 | 7,472 | 36.4 |
| 4. ස්ථාවර හා අනෙකුත් වත්කම් | 2,937 | 3.6 | 8,786 | 10.3 |
| වගකීම් වර්ගීකරණය | | | | |
| 1. ප්‍රාග්ධන ගිණුම් | 5,131 | 13.1 | 5,851 | 13.2 |
| 2. මුළු තැන්පතු | 40,340 | 15.4 | 37,214 | 12.3 |
| ඉල්ලුම් තැන්පතු | 3,837 | 7.9 | 4,528 | 8.6 |
| කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු | 36,502 | 17.1 | 32,686 | 13.1 |
| 3. ණය ගැනීම් | -786 | -2.8 | 4,630 | 16.9 |
| දේශීය ණය ගැනීම් | -2,037 | -7.8 | 4,242 | 17.6 |
| විදේශීය ණය ගැනීම් | 1,251 | 63.0 | 388 | 12.0 |
| 4. අනෙකුත් වගකීම් | 8,310 | 13.7 | 11,197 | 16.3 |
| මුළු වත්කම්/වගකීම් | 52,994 | 13.6 | 58,892 | 13.3 |

*මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව*

(අ) 1998 මැයි 18 සිට බලපැවැත්වෙන පරිදි භාණ්ඩාගාර බැඳුම්කර, ද්‍රවශීල වත්කම්වල කොටසක් ලෙස සැලකේ.

ප්‍රාග්ධන ගිණුම් ශේෂයන්හි 1997 දී වූ සියයට 13.1 ක (රුපියල් දශලක්ෂ 5,131) වර්ධනය හා සසඳනවිට 1998 දී සියයට 13.2 කින් (රුපියල් දශලක්ෂ 5,851) වර්ධනය විය. කොටස් හිමිකරුවන්ගේ අරමුදල් මුළු වත්කම් වලින් සියයට 10 ක් ලෙස 1997 දී පැවති මට්ටමේම පවත්වාගෙන යන ලදී.

විදේශීය ගලාඒම්වල අඩුවීමත් සමඟ, දේශීය ඒකකයන්හි විදේශීය වත්කම් 1997 දී සියයට 70.2 ක වර්ධනය හා සසඳනවිට 1998 දී සියයට 21.5 ක අඩු වේගයක වර්ධනයක් පෙන්වීය. විදේශීය බැංකු සමඟ පැවති වත්කම් 1998 වර්ෂය අගදී ආසන්න වශයෙන් සියයට 25 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 22,760 ක් විය. සංසන්දනාත්මකව, මෙම වත්කම් 1997 දී සියයට 109 කින් වැඩිවිය. වි.ව්‍ය.මු.බැ. ඒකක සමග වූ තැන්පතු ආසන්න වශයෙන් සියයට 27 කින් වැඩිවී 1998 වර්ෂය අගදී රුපියල් දශලක්ෂ 28,927 ක් විය. වාණිජ බැංකුවල දේශීය ඒකකයන්හි විදේශීය වගකීම්වලින් සියයට 81 ක් සඳහා දායක වූ අනේවාසික විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු, නේවාසික විදේශිකයින්ගේ ව්‍යවහාර මුදල් තැන්පතු සහ නේවාසික විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතුවල 1997 දී වූ සියයට 18.7 ක වැඩිවීම හා සැසඳීමේදී 1998 දී සියයට 34.0 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 54,409 ක් විය. ඒ අනුව දේශීය ඒකකයන්හි ශුද්ධ විදේශීය වත්කම් තත්ත්වය පිරිහුනි.

වි.ව්‍ය.මු.බැ. ඒකක සංඛ්‍යාව 1998 වර්ෂයේදීද 26 ක් වශයෙන් පැවතුණි. කෙසේවුවද, සැලකිය යුතු වර්ධනයක් (සියයට 26) පැවති 1997 දී මෙන් නොව 1998 දී මෙම ඒකක වල මුළු වත්කම්/වගකීම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 155 කින් (සියයට 9) අඩුවී සංකෝචනය වීමක් පෙන්නුම් කළේය. වි.ව්‍ය.මු.බැ. ඒකකවල අරමුදල් මූලයන් ප්‍රධාන වශයෙන් දේශීය බැංකු ඒකක සමඟ ඇති විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු වලින් සහ ආයෝජන මණ්ඩලයට අයත් ආයතනවල තැන්පතු වලින් සමන්විත වූ දේශීය මූලයන් විය. වි.ව්‍ය.මු.බැ. ඒකකවල අරමුදල් භාවිතා කළ ප්‍රධාන අංශයන් වූයේ අනේවාසික ව්‍යවසායකයින් සමග පැවති ආයෝජනයන් සහ ආයෝජන මණ්ඩල ව්‍යවසායකයින්ට දුන් ණය සහ අත්තිකාරම්ය. අපනයන වර්ධනය අඩුවීම සහ විදේශීය ව්‍යවහාර මුදල් ණය ලබා ගැනීමට අඩු ආකර්ශණයක් පැවතීම යම් දුරකට පිළිබිඹු කරමින් වි.ව්‍ය.මු.බැ. ඒකක වලින් ආයෝජන මණ්ඩල ව්‍යවසායකයන් සඳහා දුන් ණය 1997 දී පැවති සියයට 20 ක වර්ධනයට ප්‍රතිවිරුද්ධව 1998 දී සියයට 3 කින් අඩුවිය. දේශීය බැංකු හතරක සහ විදේශීය බැංකුවක වි.ව්‍ය.මු.බැ. ඒකක විසින් සාමූහිකව 1998 නොවැම්බර් මසදී රජයට එ.ජ.ඩොලර් දශලක්ෂ 100 ක ණයක් සපයන ලදී. 1997 අගදී එ.ජ.ඩොලර් දශලක්ෂ 25 ක ශුද්ධ හිඟයක් පෙන්නුම් කළ වි.ව්‍ය.මු.බැ.ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් තත්ත්වය 1998 අගදී එ.ජ.ඩොලර් දශලක්ෂ 41 ක ශුද්ධ අතිරික්තයක් දක්වා වැඩිවීමක් වාර්තා කළේය. විදේශීය වත්කම් සහ විදේශීය වගකීම් යන දෙකෙහිම අඩුවීමක් පැවතියද, වගකීම් වඩාත් ඉහළ අනුපාතිකයකින් අඩුවීම මෙම ශුද්ධ වර්ධනයට හේතු විය.

වි.ව්‍ය.මු.බැ. ඒකකවල මුළු දළ වත්කම් 1998 දී සියයට 9 කින් අඩුවී වර්ෂය අගදී එ.ජ.ඩොලර් දශලක්ෂ 1,526 ක් විය. මෙය, අනේවාසිකයින් සඳහා වූ ණය සියයට 30 කින් අඩුවීමෙහි සහ නේවාසිකයින් සඳහා වූ ණය සියයට 8 කින් වැඩිවීමෙහි ප්‍රතිඵලයක් විය. විදේශීය බැංකු සමඟ පැවති තැන්පතු සියයට 35 කින් අඩුවූ අතර බැංකු නොවන අංශයට දුන් ණය සියයට 5 කින් වැඩිවිය. වි.ව්‍ය.මු.බැ. ඒකකවලින් පෞද්ගලික අංශයට දුන් ණය පසුගිය වර්ෂය හා සසඳන විට සියයට 3 කින් අඩුවී 1998 අගදී එ.ජ.ඩොලර් දශලක්ෂ 745.3 ක් විය. කෙසේ වුවද, රුපියල් අගය අනුව වර්ෂ දෙක අතර රුපියල් දශ ලක්ෂ 3,407 ක වැඩිවීමක් පැවතුණි. වි.ව්‍ය.මු.බැ. ඒකක වලින් පෞද්ගලික අංශයට දුන් මුළු ණය වලින් තුනෙන් දෙකක් සපයන ලද්දේ දේශීය බැංකුවල වි.ව්‍ය.මු.බැ.ඒකක මගිනි.

වි.ව්‍ය.මු.බැ.ඒකක පිහිටුවීමේ මූලික අරමුණක් වූයේ ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යවසායකයින්ට ණය පහසුකම් සැපයීමයි. මෙම අරමුණ ඉටු කරමින්, එසේ සැපයූ ණය වි.ව්‍ය.මු.බැ.ඒකකවල වත්කම් වලින් විශාලම කොටස විය. කෙසේවුවද, ලංකාවේ අපනයනවල පැවති අඩු වර්ධනය පිළිබිඹු කරමින් ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායකයන්ට සැපයූ ණය පසුගිය වර්ෂයේ පැවති සියයට 20 ක වර්ධනය හා සැසඳීමේදී 1998 දී සියයට 3 කින් අඩුවිය. මේ අතර, අනෙකුත් නේවාසිකයින්ට සැපයූ ණය (රජයට දුන් එ.ජ. ඩොලර් දශලක්ෂ 100 ණය මුදල හැර) සියයට 46 කින් අඩුවිය. මෙම අඩුවීම ප්‍රධාන වශයෙන් රාජ්‍ය සංස්ථාවලට සැපයූ ණය වර්ෂය තුළදී එ.ජ.ඩොලර් දශලක්ෂ 50 කින් අඩුවීම තුළින් පිළිබිඹු විය. මෙය මූලික වශයෙන් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව විසින් බැංකුවලට පැවති සිය වගකීම් අඩුකිරීම නිසා සිදුවිය.

වාණිජ බැංකුවලට ඔවුන්ගේ දේශීය ඒකක හෝ වි.ව්‍ය.මු.බැ.ඒකක මගින් ආයෝජන මණ්ඩල නොවන අපනයනකකරුවන් හට ණය සැපයීමට ලබාදුන් විශේෂ පහසුකම යටතේද ණය සැපයීමෙහි අඩුවීමක් දක්නට ලැබුණි. 1997 දී ලබාදුන් එ.ජ.ඩොලර් දශලක්ෂ 254 හා සැසඳීමේදී 1998 දී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 177 ක ණය ප්‍රමාණයක් ලබාදී ඇත. මෙම පහසුකම යටතේ ලබාදුන් ණය වලින් සියයට 95 ක්ම සපයනු ලැබුවේ වි.ව්‍ය.මු.බැ.ඒකක වලින් නොව දේශීය බැංකු ඒකක වලිනි.

වි.ව්‍ය.මු.බැ.ඒකකවල වගකීම්වල පැවති අඩුවීම, නේවාසික නොවන වගකීම් එ.ජ.ඩොලර් දශලක්ෂ 269 කින් අඩුවීම, නේවාසික වගකීම් එ.ජ.ඩොලර් දශලක්ෂ 105 කින් අඩුවීම සහ අභ්‍යන්තර ගිණුම් එ.ජ.ඩොලර් දශලක්ෂ 9 කින් වැඩිවීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. නේවාසික වගකීම්වලින් ප්‍රධාන කොටස දේශීය ඒකක මගින් කරනු ලැබූ අරමුදල් තැන්පත් කිරීම් විය.

## වාණිජ බැංකුවල දේශීය ඒකකයන්හි අරමුදල් ප්‍රභවයන් සහ භාවිතය

වර්ෂය තුළ ආර්ථික කටයුතුවල පැවති පසුබෑස්ම වාණිජ බැංකුවල මුළු ශුද්ධ සම්පත් ලැබීම් වලින් පිළිබිඹු විය. 1997 දී මුළු වත්කම්වල වැඩිවීම වූ රුපියල් දශ ලක්ෂ 30,074 හා සසඳන විට මෙම වත්කම් 1998 දී වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 15,830 කිනි. 1997 දී පෞද්ගලික අංශය ප්‍රධාන ශුද්ධ අරමුදල් ප්‍රභවයක්ව පැවති තත්ත්වයට ප්‍රතිවිරුද්ධව 1998 දී විදේශීය අංශය සහ අනෙකුත් වත්කම් සහ අනෙකුත් වගකීම් අංශයන් ශුද්ධ අරමුදල්වල වැඩිවීමෙන් සියයට 92 ක් සඳහා දයක විය. 1997 දී ශුද්ධ අරමුදල් වලින් සියයට 50 කටත් වඩා වැඩි ප්‍රමාණයකට දයක වූ දේශීය පෞද්ගලික අංශය 1998 දී දයක වූයේ ශුද්ධ අරමුදල් වලින් සියයට 8 ක් සඳහා පමණි. අරමුදල් වලින් විශාලතම කොටස (සියයට 42) භාවිතයට ගනු ලැබුවේ රාජ්‍ය අංශය වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් වලින් සියයට 20 ක් භාවිතා කරන ලදී.

පසුගිය වර්ෂයට ප්‍රතිවිරුද්ධව වර්ෂය තුළදී විදේශීය අංශය ප්‍රධාන අරමුදල් ප්‍රභවය බවට පත්විය. ගල්ෆ් යුද්ධයෙන් බලපෑමට ලක්වූ කුවේට් සේවකයින්ට දුන් වන්දිද ඇතුලත් වූ නේවාසික සහ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවල වැඩිවීම, වාණිජ බැංකුවල විදේශීය ගලාඒම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවිය. විදේශීය තැන්පතු සහ ණයගැනීම්වල වූ මුළු ශුද්ධ ලැබීම් 1998 දී රුපියල් දශ ලක්ෂ 7,376 ක් විය. කෙසේවුවද, අරමුදල් භාවිතා කරන ප්‍රධාන අංශයන් වන අපනයන බිල්පත්ද ඇතුලත් විදේශීය ශේෂයන්හිද, 1997 දී රුපියල් දශ ලක්ෂ 20,047 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 10,447 දක්වා භාවිතයෙහි අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

**10.5 සංඛ්‍යා සටහන**

**වාණිජ බැංකුවල සම්පත් ප්‍රභවයන් සහ උපයෝජනය**

| අංශය සහ විස්තර විශ්ලේෂණය | වෙනස (අ) | | | |
|---|---|---|---|---|
| | 1997 | | 1998 | |
| | ප්‍රභවය | භාවිතය | ප්‍රභවය | භාවිතය |
| 1. රාජ්‍ය අංශය | | **12,797** | | **6,618** |
| රජයේ සුරැකුම්පත් දැරීම | | 6,736 | 4,205 | |
| තැන්පතු | 827 | | | 2,083 |
| ආනයන බිල්පත් | | 1,920 | | 9,414 |
| කෙටිකාලීන ණය | | 406 | | 901 |
| අයිරාවන් | | 4,562 | 1,576 | |
| 2. මහ බැංකුව | **5,413** | | | **3,129** |
| ණය ගැනීම් | 725 | | 39 | |
| සංචිත | 5,228 | | | 2,303 |
| මහබැංකු සුරැකුම්පත්හි ආයෝජන | | | | |
| කැට මුදල් | | 540 | | 865 |
| 3. රාජ්‍ය සංස්ථා | | **973** | | **4,301** |
| තැන්පතු | | 573 | | 5,153 |
| අත්තිකාරම් | | 400 | 853 | |
| 4. සමුපකාර | **425** | | | **482** |
| තැන්පතු | 621 | | | 332 |
| අත්තිකාරම් | | 196 | | 150 |
| 5. අනෙකුත් දේශීය | | | | |
| පෞද්ගලික අංශය | **15,081** | | **1,229** | |
| තැන්පතු (ආ) | 32,455 | | 27,667 | |
| දේශීය බිල්පත් | 248 | | 383 | |
| ආනයන බිල්පත් | | 490 | 1,460 | |
| අයිරාවන් | | 1,731 | | 10,966 |
| ණය මුදල් | | 17,323 | | 17,234 |
| සුරැකුම්පත් හා | | 1,718 | | 1,013 |
| බැඳුම්කරවල ආයෝජන | | | | |
| ණයකර | 3,640 | | 930 | |
| 6. අන්තර් බැංකු ගණුදෙනු | | **5,023** | | **1,300** |
| දේශීය බැංකුවල ඇති ශේෂයන් | 535 | | | 5,291 |
| දේශීය බැංකුවල තැන්පතු හා ණයගැනීම් | | 5,558 | 3,991 | |
| 7. විදේශීය අංශය | | **11,281** | **7,376** | |
| ණය ගැනීම් | 1,251 | | 388 | |
| තැන්පතු | 7,515 | | 17,434 | |
| අපනයන බිල්පත් ද ඇතුළුව විදේශීය ශේෂයන් | | 20,047 | | 10,447 |
| 8. අනෙකුත් වත්කම් | **9,155** | | **7,225** | |
| හා අනෙකුත් වගකීම් | | | | |
| ප්‍රාග්ධන හා සංචිත | 5,131 | | 5,851 | |
| ස්ථාවර වත්කම් | | 1,436 | | 1,821 |
| දිගුකාලීන රජයේ පිලිණපත් | 1,000 | | | |
| ප්‍රතිව්‍යුහගත කරන පිලිණපත් | | | | |
| අනෙකුත් වත්කම් | | 2,501 | | 6,965 |
| අනෙකුත් වගකීම් | 6,962 | | 10,160 | |
| මුළු ශුද්ධ සම්පත් ලැබීම් / භාවිතය | **30,074** | **30,074** | **15,830** | **15,830** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තද කළු අකුරින් දක්වා ඇති සංඛ්‍යාවන්ගෙන් එක් එක් අංශයෙහි ශුද්ධ සම්පත් ලැබීම් හෝ භාවිතය දක්වේ.

(ආ) විශේෂ ඉතිරිකිරීමේ යෝජනා ක්‍රමය යටතේ රාජ්‍ය අංශයේ බැංකු දෙක විසින් රාශීකරණය කරන දිගුකාලීන තැන්පතු ද ඇතුළත් වේ.

අනෙකුත් වත්කම් සහ වගකීම් අංශය 1997 දී මෙන්ම ශුද්ධ අරමුදල් සපයන්නා විය. වාණිජ බැංකු ඔවුන්ගේ ප්‍රාග්ධනය සහ සංචිත වැඩිකළ බැවින් බැංකු ක්‍රමයෙහි ස්ථාවරභාවය වර්ධනය විය. එයට අමතරව, බැංකු විසින් නිකුත් කළ ණයකර වලින් වූ ලැබීම්ද ඇතුලත් වූ අනෙකුත් වගකීම් අරමුදල් ලැබීමේ මූලයක් විය. වර්ෂය තුළදී මූලික වශයෙන් තැන්පතුවල අඩුවීම සහ අයිරාවන්හි වැඩිවීම හේතුවෙන් දේශීය පෞද්ගලික අංශය අරමුදල් ලැබීමේ මූලයක් ලෙස වැදගත්කමින් අඩුවිය. මෙම අංශය මගින් 1997 දී සැපයූ රුපියල් දශ ලක්ෂ 15,081 ක ශුද්ධ අගය හා සසඳන විට 1998 දී සපයනු ලැබූ ශුද්ධ අගය රුපියල් දශ ලක්ෂ 1,229 ක් පමණි.

රජය සහ මහ බැංකුව ප්‍රධාන අරමුදල් භාවිතා කරන්නන් විය. 1997 දී මෙන් නොව වර්ෂය තුළදී වාණිජ බැංකු විසින් රජයේ සුරැකුම්පත් දැරීම් අඩුකළ නිසා රජයේ සුරැකුම්පත් දැරීම අරමුදල් ලැබීමේ මූලයක් විය. කෙසේවුවද, රජයේ ආනයන බිල්පත් වට්ටම් කිරීම් වැඩිවීම, කෙටිකාලීන ණය සැපයීම සහ රජයේ තැන්පතුවල අඩුවීම නිසා රජය 1998 වර්ෂය තුළදී වාණිජ බැංකුවල සම්පත් වලින් සියයට 42 ක් ප්‍රයෝජනයට ගනිමින් ප්‍රධාන අරමුදල් භාවිතා කරන්නා බවට පත්විය. රුපියල් දශ ලක්ෂ 2,303 ක් ව්‍යවස්ථාපිත සංචිත වශයෙන් ලබා ගනිමින් මහ බැංකුව 1998 වර්ෂය තුළදී විශාල වශයෙන් අරමුදල් භාවිතා කරන්නකු බවට පත්විය.

## වාණිජ බැංකු ණය සහ අත්තිකාරම්

වාණිජ බැංකුවල ණය සහ අත්තිකාරම් සඳහා වූ කාර්තුමය සමීක්ෂණයට අනුව මුළු ණය සැපයීමෙන් වෙළෙඳ සහ කාර්මික අංශවලට ලබාදුන් ණය සහ අත්තිකාරම්වල කොටසෙහි අඩුවීමක් පෙන්නුම් කරන අතර ප්‍රධාන වශයෙන් පරිභෝජන සහ නිවාස අංශ සඳහා දුන් ණයවල වැඩිවීමක් වර්ෂය තුළදී වාර්තා විය. වෙළෙඳ සහ කාර්මික යන අංශ වලට දුන් කොටසෙහි අඩුවීම ආනයන සහ අපනයනයන්හි වර්ධනය පහත බැසීමෙහි ප්‍රතිඵලයක් විය. අනෙකුත් සියළුම අංශ සඳහා මුළු ණයවලින් දුන් ප්‍රමාණයන්හි සුළු වර්ධනයන් පෙන්නුම් කර ඇත. එක් එක් අංශ සඳහා වූ ණය වර්ධනයෙහි සාපේක්ෂ වැදගත්කම අනුව සලකා බලනවිට පරිභෝජන, නිවාස, සංචාරක, මූල්‍ය, අනෙකුත් සහ කෘෂිකාර්මික යන අංශ පිළිවෙලින් ප්‍රධාන වැඩිවීම් වාර්තා කර ඇත.

පෙරදී මෙන්ම 1998 වර්ෂය තුළදී වෙළෙඳ අංශය විසින් බැංකු ණය වලින් විශාලතම කොටස ලබා ගන්නා ලදී. පසුගිය වර්ෂය අගදී නොගෙවා ඉතිරිව ඇති මුළු ණය ප්‍රමාණයට මෙම අංශයෙන් වූ දයකත්වය වූ සියයට 45

* බැංකුවල ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු මත මෙම විග්‍රහය සිදුකර ඇති අතර 1998 සැප්තැම්බර් මස අග දක්වා පැවති දේශීය බැංකු ඒකකවල දත්ත මත පදනම් වේ.

## 10.6 සංඛ්‍යා සටහන

## අරමුණු හා කල්පිරීම් රටාව අනුව වර්ග කරන ලද වාණිජ බැංකු අත්තිකාරම් (අ)

| වර්ගීකරණය | කෙටි කාලීන | | මැදි කාලීන | | දිගු කාලීන | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | (1) ප්‍රමාණය රුපියල් දශලක්ෂ | (2) (1), (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (3) ප්‍රමාණය රුපියල් දශලක්ෂ | (4) (3), (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (5) ප්‍රමාණය රුපියල් දශලක්ෂ | (6) (5), (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (7) ප්‍රමාණය රුපියල් දශලක්ෂ | (8) (7)එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| 1. වෙළෙඳ | | | | | | | | |
| සැප්තැම්බර් | 70,429 | 75.7 | 17,839 | 19.2 | 4,708 | 5.1 | 92,976 | 45.1 |
| දෙසැම්බර් | 73,364 | 74.0 | 20,682 | 20.9 | 5,126 | 5.2 | 99,172 | 45.8 |
| සැප්තැම්බර් | 73,453 | 73.6 | 21,204 | 21.2 | 5,142 | 5.2 | 99,799 | 43.1 |
| 2. මූල්‍ය | | | | | | | | |
| සැප්තැම්බර් | 4,346 | 57.5 | 2,563 | 33.9 | 655 | 8.7 | 7,563 | 3.7 |
| දෙසැම්බර් | 4,059 | 53.3 | 2,711 | 35.6 | 844 | 11.1 | 7,614 | 3.5 |
| සැප්තැම්බර් | 5,878 | 67.2 | 1,894 | 21.7 | 974 | 11.1 | 8,745 | 3.8 |
| 3. කෘෂිකාර්මික | | | | | | | | |
| සැප්තැම්බර් | 6,974 | 64.7 | 2,808 | 26.1 | 996 | 9.2 | 10,778 | 5.2 |
| දෙසැම්බර් | 7,668 | 65.2 | 3,085 | 26.2 | 1,001 | 8.5 | 11,755 | 5.4 |
| සැප්තැම්බර් | 7,811 | 64.0 | 3,257 | 26.7 | 1,144 | 9.4 | 12,211 | 5.3 |
| 4. කාර්මික (ආ) | | | | | | | | |
| සැප්තැම්බර් | 18,333 | 72.0 | 4,407 | 17.3 | 2,706 | 10.6 | 25,445 | 12.3 |
| දෙසැම්බර්. | 18,508 | 73.1 | 4,796 | 18.9 | 2,022 | 8.0 | 25,326 | 11.7 |
| සැප්තැම්බර් | 19,245 | 72.0 | 5,401 | 20.2 | 2,080 | 7.8 | 26,725 | 11.6 |
| 5. සංචාරක | | | | | | | | |
| සැප්තැම්බර් | 1,470 | 45.0 | 663 | 20.3 | 1,131 | 34.7 | 3,264 | 1.6 |
| දෙසැම්බර් | 1,650 | 49.7 | 695 | 21.0 | 973 | 29.3 | 3,319 | 1.5 |
| සැප්තැම්බර් | 1,563 | 40.5 | 830 | 21.5 | 1,462 | 37.9 | 3,855 | 1.7 |
| 6. නිවාස | | | | | | | | |
| සැප්තැම්බර් | 6,498 | 25.3 | 10,014 | 39.0 | 9,159 | 35.7 | 25,671 | 12.4 |
| දෙසැම්බර් | 6,260 | 24.9 | 10,614 | 42.3 | 8,225 | 32.8 | 25,099 | 11.6 |
| සැප්තැම්බර් | 7,820 | 25.3 | 10,951 | 35.5 | 12,095 | 39.2 | 30,866 | 13.3 |
| 7. පරිභෝජන | | | | | | | | |
| සැප්තැම්බර් | 11,483 | 62.9 | 3,631 | 19.9 | 3,140 | 17.2 | 18,254 | 8.8 |
| දෙසැම්බර් | 12,414 | 63.7 | 4,126 | 21.2 | 2,945 | 15.1 | 19,484 | 9.0 |
| සැප්තැම්බර් | 14,977 | 64.2 | 4,678 | 20.0 | 3,685 | 15.8 | 23,340 | 10.1 |
| 8. අනිකුත් ණය | | | | | | | | |
| සැප්තැම්බර් | 15,037 | 67.1 | 4,828 | 21.5 | 2,558 | 11.4 | 22,423 | 10.9 |
| දෙසැම්බර් | 14,510 | 58.1 | 5,043 | 20.2 | 5,404 | 21.7 | 24,957 | 11.5 |
| සැප්තැම්බර් | 17,397 | 67.5 | 5,615 | 21.8 | 2,768 | 10.7 | 25,780 | 11.1 |
| 9. එකතුව | | | | | | | | |
| සැප්තැම්බර් | 134,570 | 65.2 | 46,753 | 22.7 | 25,052 | 12.1 | 206,375 | 100.0 |
| දෙසැම්බර් | 138,432 | 63.9 | 51,752 | 23.9 | 26,540 | 12.2 | 216,724 | 100.0 |
| සැප්තැම්බර් | 148,142 | 64.0 | 53,829 | 23.3 | 29,350 | 12.7 | 231,321 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) අත්තිකාරම්වලට, එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් හැර ණය, අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත් ය.

(ආ) ඉංජිනේරු සහ ගොඩනැගිලි ව්‍යාපාර, කැණීම් සහ ධීවර කර්මාන්තය සඳහා දෙන ලද අත්තිකාරම් ඇතුළත් වේ.

සමඟ සසඳන විට සැප්තැම්බර් මස අවසානයේදී එය සියයට 43 ක් විය. මේ අතර, මෙම අංශයට ලබාදුන් ණය ප්‍රමාණය සියයට 7 කින් වැඩිවිය.

නිවාස සහ දේපල සංවර්ධන අංශය මුළු ණයවලින් සියයට 13 ක් ලබා ගනිමින් දෙවැනි විශාලතම ණය ලබාගත් අංශය වූ අතර මෙම අංශයට ලබාදුන් ණය ප්‍රමාණය සියයට 20 කින් වැඩිවිය. මූල්‍ය සමාගම් වලින් දුන් ණය වලින්ද දක්නට ලැබුණ පරිදි නිවාස අංශයට දුන් ණයවල වර්ධනයක් පවත්නා බැවින් ඒ පිළිබඳව සුපරීක්ෂාකාරීවීම, එම අංශයට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ආවරණයක් ලබාදීම නිසා ඇතිවිය හැකි වත්කම් මිල ගණන් කෘතිම ලෙස ඉහළ නැගීම සහ කෙටිකාලීන අරමුදල් ප්‍රභව පවත්නා ආයතනවලට ඇතිවිය හැකි පරිණත කාල පිළිබඳ නොගැලපීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැක.

වාණිජ බැංකු ණයවල කාර්මික ණය සඳහා වන කොටස 1997 සැප්තැම්බර් අවසානයේදී සියයට 12 ක්වූ අතර එය 1998 සැප්තැම්බර් අවසානයේදී එම මට්ටමෙහිම පැවතුනි.

සංචාරක, මූල්‍ය, කෘෂිකාර්මික සහ අනෙකුත් අංශ සඳහා සැපයූ ණය පිළිවෙලින් සියයට 18.1, සියයට 15.6, සියයට 13.3 සහ සියයට 14.9 වශයෙන් වැඩිවුන අතර මෙම සියළු අංශ ඒකාබද්ධව ගත්කල මුළු ණය වලින් ඒ සඳහා වූ කොටස 1997 වාර්තාවුන සියයට 21.4 හා සසඳන විට 1998 දී සියයට 21.9 ක් විය. පරිභෝජන ණය සියයට 28 කින් වැඩිවුන අතර 1997 දී ආසන්න වශයෙන් සියයට 9 ක් වූ මුළු ණයවලින් එහි කොටස 1998 දී සියයට 10 දක්වා වැඩිවිය.

සුරැකුම් සම්බන්ධයෙන් බලන කල සියයට 88 ක ණය සුරැකුම් සහිත වූ අතර මුළු ණය වලින් සියයට 26 ක් නිශ්චල දේපල, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ඇප වශයෙන් තබාගෙන නිකුත් කර තිබුණි. ණයවලින් සියයට 16 ක් පමණ පෞද්ගලික ඇපවීම් සහ පොරොන්දු නෝට්ටු මගින් ආවරණය වී ඇත.

කල්පිරීමේ ව්‍යුහයෙහි, මුළු ණයෙන් 1997 දී සියයට 65 ක් වූ කෙටිකාලීන ණය 1998 දී සියයට 64 දක්වා අඩුවීමක් පිළිබිඹු කෙරේ. මුළු ණය වලින් මැදි කාලීන ණය සහ දිගුකාලීන ණයවල කොටස් පිළිවෙලින් සියයට 22.7 සිට සියයට 23.3 දක්වාත්, සියයට 12.1 සිට සියයට 12.7 දක්වාත් වැඩිවිය.

## 10.5 මහ බැංකු කටයුතු

1998 වර්ෂයෙහිදී වඩා දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වාගෙන යාම සඳහා මහ බැංකුව විසින් තරමක් දුරට සංකෝචනාත්මක ප්‍රතිපත්තියක් භාවිතා කරන ලදී. මෙම අරමුණ සඳහා යොදගත් ප්‍රධාන උපකරණය වූයේ ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතිකයයි. පොලී අනුපාතික තරමක්දුරට ඉහළ

10.7 සංඛ්‍යා සටහන

**සුරැකුම් වර්ගය අනුව අත්තිකාරම් (අ) සැප්තැම්බර් 1997 - සැප්තැම්බර් 1998**

| | සුරැකුම් වර්ගය | 1997 සැප්තැම්බර් 30 | | 1997 දෙසැම්බර් 31 | | 1998 සැප්තැම්බර් 30 | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය රුපියල් දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| 1. | ලේඛනගත බිල්පත් | 6,032 | 2.9 | 6,186 | 2.9 | 6,398 | 2.8 |
| 2. | රජයේ සුරැකුම්පත් | 2,684 | 1.3 | 2,560 | 1.2 | 3,608 | 1.6 |
| 3. | බද්ධ ව්‍යාපාර වස්තු සමාගම්වල කොටස් බැඳුම්කර, ණයකර,ජීවිත රක්ෂණ සහතිකවල මූල්‍ය වටිනාකම ඇතුළුව අනෙකුත් | 2,139 | 1.0 | 2,763 | 1.3 | 3,448 | 1.5 |
| 4. | ස්ථාවර, ඉතිරිකිරීම් සහ තැන්පතු සහතික ඇතුළු අනිකුත් මුදල් තැන්පතු | 20,860 | 10.1 | 21,705 | 10.0 | 24,974 | 10.8 |
| 5. | වෙළෙඳ භොග | 16,597 | 8.0 | 18,546 | 8.6 | 17,494 | 7.6 |
| 6. | නිශ්චල, දේපල යන්ත්‍ර සහ උපකරණ | 52,384 | 25.4 | 55,748 | 25.7 | 60,522 | 26.2 |
| 7. | පොරොන්දු නෝට්ටු සහ පෞද්ගලික ඇපවීම් | 31,543 | 15.3 | 34,389 | 15.9 | 37,874 | 16.4 |
| 8. | භාර කුවිතාන්සි | 11,407 | 5.5 | 12,092 | 5.6 | 10,585 | 4.6 |
| 9. | කුලී පිට ගැනුම් ගිවිසුම් | 1,301 | 0.6 | 876 | 0.4 | 1,118 | 0.5 |
| 10. | ට්‍රැක්ටර් සහ මෝටර් රථ | 2,791 | 1.4 | 2,563 | 1.2 | 2,798 | 1.2 |
| 11. | අනෙකුත් සුරැකුම්පත් | 32,046 | 15.5 | 31,777 | 14.7 | 35,621 | 15.4 |
| 12. | සුරැකුම් රහිත | 26,591 | 12.9 | 27,518 | 12.7 | 26,881 | 11.6 |
| | එකතුව | 206,375 | 100.0 | 216,724 | 100.0 | 231,321 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් සහ සහතික මිල යෝජනා ක්‍රමය යටතේ මිලදී ගැනීම් සඳහා ප්‍රදානය කළ අත්තිකාරම් හැර.

මට්ටමක පැවති අතර එය වර්ෂය තුළදී විදේශීය වත්කම් කෙරේ ආයෝජනයන් මාරුවීම වැළැක්වීමට උපකාරී විය. වෙළෙඳපොළ ස්ථාවරභාවය ඇතිකිරීම සඳහා තවත් පියවරක් ලෙස මහ බැංකුව විසින් ප්‍රති විකුණුම් පහසුකම නැවත හඳුන්වා දෙන ලදී. මහ බැංකුවේ විදේශීය වත්කම් තත්ත්වය වර්ධනය වූ අතර මෙය මූලික වශයෙන් ආයෝජන වලින් වූ ලැබීම්, රජය මගින් වි.ව්‍ය.මු.බැ.ඒකක වලින් ගත් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 100 ක ණය මුදල මහ බැංකුවට විකිණීම සහ ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වල අනුපාතික නෝට්ටු නිකුත් කර ලබාගත් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 65 මහ බැංකුවට විකිණීම නිසා සිදුවිය. මහ බැංකුව ප්‍රාථමික වෙන්දේසිවලදී රුපියල් දශ ලක්ෂ 25,999 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් ගත් නමුත්, ඉන්පසු මේවායින් වැඩි කොටසක් ද්විතීයික වෙළෙඳපොළෙහි මුදහරින ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1998 දී භාණ්ඩාගාර බිල්පත් දැරීම වැඩිවූයේ රුපියල් දශ ලක්ෂ 1,016 කින් පමණි.

## වත්කම් සහ වගකීම් ව්‍යුහය

මහ බැංකුවේ මුළු වත්කම්හි 1997 දී පැවති සියයට 1.3 (රුපියල් දශ ලක්ෂ 2,332) ක වර්ධනය සමඟ සසඳන විට 1998 දී සියයට 2.6 (රුපියල් දශ ලක්ෂ 4,774) කින් රුපියල් දශ ලක්ෂ 188,673 දක්වා වර්ධනය විය. මෙයින් සැලකියයුතු කොටසක් ලැබුණේ ශුද්ධ විදේශීය වත්කම්වල රුපියල් අගය ඉහළයාම තුළිනි.

වත්කම් අංශය දෙස බලන විට, එහි වැඩිවීම මුළුමනින්ම මහ බැංකුවේ විදේශීය වත්කම්හි වැඩිවීමේ ප්‍රතිඵලයකි. මහ බැංකුවේ මුළු විදේශීය වත්කම්හි අගය රුපියල් දශ ලක්ෂ 127,177 වෙමින් වර්ෂය තුළ සියයට 6.9 ක (රුපියල් දශ ලක්ෂ 8,178) වර්ධනයක් පෙන්වීය. මෙය පිළිබිඹු කරමින් ගෙවුම් ශේෂයෙහි එ.ජ.ඩොලර් දශලක්ෂ 37 ක අතිරික්තයක් 1998 දී වාර්තා විය. මීට සාපේක්ෂව, 1997 දී විදේශීය වත්කම් සියයට 15 කින් (රුපියල් දශ ලක්ෂ 15,755) වැඩිවිය.

මේ අතර, මහ බැංකුවේ දේශීය වත්කම් 1997 දී වාර්තා කළ රුපියල් දශ ලක්ෂ 13,423 ක (සියයට 17) අඩුවීම සමඟ සසඳන විට 1998 දී රුපියල් දශ ලක්ෂ 3,401(සියයට 5) කින් අඩුවිය. චක්‍රීය ණය පහසුකම යටතේ රජයට ලබාදුන් ණය සහ අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 1,885 කින් (සියයට 7) වැඩිවිය. රජය පෞද්ගලිකරණය තුලින් වූ ලැබීම්වලින් රුපියල් දශ ලක්ෂ 10,000 ක භාණ්ඩාගාර බිල්පත් විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් දැරීම 1997 දී සියයට 58 කින් අඩුවීමට ප්‍රතිවිරුද්ධව 1998 දී මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් දැරීම රුපියල් දශ ලක්ෂ 1,016 (සියයට 4) කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 8,238 ක් විය.

වගකීම් අංශය දෙස බලනවිට, මහ බැංකුවේ මුළු තැන්පතු වගකීම් 1997 දී සියයට 4 කින් (රුපියල් දශ ලක්ෂ 3,277) අඩුවීම හා සසඳනවිට 1998 දී සියයට 5 කින් (රුපියල් දශ ලක්ෂ 3,701) අඩුවිය. මෙය ප්‍රධාන වශයෙන් 1998 දී රජයේ තැන්පතු සියයට 52 කින් (රුපියල් දශ ලක්ෂ 3,367) අඩුවීමෙහි ප්‍රතිඵලයක් විය. 1997 දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාත අඩුකිරීම නිසා මහ බැංකුවෙහි තිබෙන වාණිජ බැංකු සතු තැන්පතු සියයට 15 ක අඩුවීම හා සසඳන විට 1998 දී එම තැන්පතු සියයට 7 කින් වැඩිවිය.

බැංකුවෙහි මුළු ව්‍යවහාර මුදල් නිකුතුවෙහි පසුගිය වසරේ පැවති සියයට 7.4 ක වැඩිවීම හා සසඳනවිට වර්ෂය තුළ සියයට 13.1 (රුපියල් දශ ලක්ෂ 6,952) වැඩිවීමක් වාර්තා විය. මුදල් නෝට්ටු නිකුත් කිරීම පසුගිය වසරේ පැවති සියයට 7.4 ක වර්ධනය හා සැසඳීමේදී සියයට 13.1 කින්ද, කාසි නිකුත් කිරීම 1997 දී සියයට 7.8 හා සසඳනවිට සියයට 12.3 කින්ද 1998 වර්ෂය තුළදී වැඩිවිය.

## 10.6 බැංකු සංවර්ධනය

රටෙහි ක්‍රියාත්මක වූ මුළු වාණිජ බැංකු සංඛ්‍යාව 26 ක් ලෙස වසර තුළ නොවෙනස්ව පැවැතුණි. මින් 8 ක් දේශීය බැංකු සහ 18 ක් විදේශීය බැංකු ශාඛා විය. 1998 වසර තුළදී වූ ඉතා වැදගත් සිදුවීම නම් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ප්‍රතිව්‍යුහගත කරමින් ඒවා ප්‍රාදේශීය සංවර්ධන බැංකු නමින් පිහිටුවනු ලැබීමයි. රටෙහි සෑම පළාතකම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක් පිහිටුවනු ලැබේ. එම බැංකු විසින් අදල පළාතේ පවතින ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ව්‍යාපාරික කටයුතු පවරා ගනු ලබයි. මෙයින් රටෙහි සෑම පළාතකම සංවර්ධන බැංකුවක් ක්‍රියාත්මක වන බව සහතික කෙරෙන අතර එමගින් එම ප්‍රදේශයෙහි බැංකු පහසුකම් සපයනු ලබයි. ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රථම පියවර ලෙස 1997 අංක 6 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ගාල්ල, මාතර හා හම්බන්තොට යන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ඒකාබද්ධ කරමින් 'රුහුණ' සංවර්ධන බැංකුව නමින් ප්‍රථම ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිහිටුවනු ලැබීය. ඉන්පසුව 1998 දී තවත් ප්‍රාදේශීය සංවර්ධන බැංකු දෙකක් එනම් "කඳුරට" සංවර්ධන බැංකුව සහ "රජරට" සංවර්ධන බැංකුව පිහිටුවනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1997 අවසානයේදී 17 ක් වූ මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 1998 අවසානයේදී 9 ක් දක්වා අඩු විය. බැංකු පනත යටතේ මෙම ප්‍රාදේශීය සංවර්ධන බැංකු වලට විශේෂිත බැංකු ලෙස කටයුතු කිරීමට බලපත්‍ර නිකුත් කර ඇත.

## ශාඛා ව්‍යාප්තිය

ප්‍රධාන ශාඛාවන් (උකස් මධ්‍යස්ථාන 185 හැර) කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා, කච්චේරි ශාඛා, ව්‍යාප්ති කාර්යාල සහ විදේශයන්හි පිහිටුවා ඇති ශාඛාද ඇතුලත්ව මුළු වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව පෙර වසර අවසානයේදී 998 සිට 1998 අවසානයේදී 1,037 දක්වා වර්ධනය විය. මින් 37 ක් දේශීය බැංකු ශාඛාද, 2 ක් විදේශීය බැංකු ශාඛාද විය. වසර තුළදී සීමාසහිත ලංකා කොමර්ෂල් බැංකුව සහ සීමාසහිත හැටන් නැෂනල් බැංකුව පිළිවෙලින් නව ශාඛා 12 ක් සහ 10 ක් බැගින් විවෘත කරනු ලැබූ අතර සීමාසහිත සම්පත් බැංකුව, සීමාසහිත යූනියන් බැංකුව

සහ සීමාසහිත පැන් ඒෂියා බැංකුව ශාඛා 3 බැගින් විවෘත කරන ලදී. මීට අමතරව, දේශීය බැංකු විසින් ව්‍යාප්ති කාර්යාල අටක් විවෘත කරනු ලැබූ අතර ලංකා බැංකුවේ කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා 2 ක් ප්‍රධාන ශාඛා ලෙස අධිශ්‍රේණිගත කරනු ලැබීය. දේශීය බැංකු ශාඛා සංඛ්‍යාව 956 සිට 1998 අවසානයේදී 993 දක්වා වර්ධනය විය. සීමාසහිත මුස්ලිම් කොමර්ෂල් බැංකුව සහ සීමාසහිත හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් විසින් එක් ශාඛාව බැගින් පිහිටුවීමත් සමඟ විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව 2 කින් ඉහළ නැගුණි. මීට අමතරව, වසර තුළදී මහජන බැංකුව විසින් උකස් මධ්‍යස්ථාන 18 ක් සහ සේවා මධ්‍යස්ථාන 3 ක් විවෘත කරනු ලැබීය. මෙම ශාඛා සංඛ්‍යාවෙහි වර්ධනය බැංකු සේවා සැපයීම වර්ධනය කළ අතර එක් බැංකු ශාඛාවක් විසින් සේවා ලබාදුන් පුද්ගලයින් සංඛ්‍යාව (උකස් මධ්‍යස්ථාන හැර) 1997 දී 18,589 සිට 1998 දී පුද්ගලයින් 18,104 දක්වා අඩුවිය. සමහර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ප්‍රාදේශීය සංවර්ධන බැංකු ලෙස ඒකාබද්ධ කිරීම නිසා මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා සංඛ්‍යාව 1997 අවසානයේදී 176 සිට 1998 අවසානයේදී 96 ක් දක්වා පහත වැටුණි. ඒ හා සමානව

**10.8 සංඛ්‍යා සටහන**

**බැංකු ශාඛා ව්‍යාප්තිය**

| | වර්ගීකරණය | 1996 | 1997 | 1998 (අ) |
|---|---|---|---|---|
| 1. | ආයතන සංඛ්‍යාව | 44 | 44 | 39 |
| | වාණිජ බැංකු | 26 | 26 | 26 |
| | දේශීය බැංකු | 8 | 8 | 8 |
| | විදේශීය බැංකු | 18 | 18 | 18 |
| | ඉතිරිකිරීමේ බැංකු | 1 | 1 | 1 |
| | ප්‍රා.ග්‍රා.සං.බැංකු (ආ) | 17 | 17 | 9 |
| | ප්‍රාදේශීය සංවර්ධන බැංකු(ඇ) | - | - | 3 |
| 2. | බැංකු ශාඛා සංඛ්‍යාව (ඈ) | 1,230 | 1,273 | 1,313 |
| | වාණිජ බැංකු ශාඛා | 958 | 998 | 1,037 |
| | දේශීය බැංකු ශාඛා | 919 | 956 | 993 |
| | ප්‍රධාන ශාඛා | 828 | 858 | 889 |
| | කෘ.සේ.ම.ශාඛා | 17 | 14 | 12 |
| | කච්චේරි ශාඛා | 23 | 23 | 23 |
| | ව්‍යාප්ති/ගෙවීම් කාර්යාල | 47 | 57 | 65 |
| | එතෙර ශාඛා | 4 | 4 | 4 |
| | විදේශීය බැංකු ශාඛා (ඉ) | 39 | 42 | 44 |
| | උකස් මධ්‍යස්ථාන | 101 | 167 | 185 |
| | ජා.ඉ.බැ.ශාඛා | 97 | 99 | 100 |
| | ප්‍රා.ග්‍රා.සං.බැංකු ශාඛා | 175 | 175 | 96 |
| | ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා | - | - | 80 |

*මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව*

(අ) තාවකාලිකය.
(ආ) 1985 අංක 15 දරණ ප්‍රා.ග්‍රා.බැංකු පනත යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පිහිටුවන ලදී.
(ඇ) 1997 අංක 6 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවන ලදී.
(ඈ) ප්‍රධාන කාර්යාල ද ඇතුළත් ය.
(ඉ) උප ශාඛාවන් ඇතුලත්ය.

මුළු ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා සංඛ්‍යාව 1998 අවසානයේදී 80 ක් විය. වසර තුළදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව තම ශාඛා ජාලය 100 ක් දක්වා පුළුල් කෙරිණ.

## බැංකු පහසුකම්

ආර්ථිකයේ ප්‍රසාරණය සහ මූල්‍ය අංශයේ සංකීර්ණතාව ප්‍රසාරණය වර්ධනයවීමත් සමඟ වාණිජ බැංකු වල කටයුතුද තරඟකාරී වාතාවරණයක් තුළ වර්ධනය විය. විදුලි සංදේශ සහ පරිගණක තාක්ෂණයේ සීඝ්‍ර දියුණුව නිසා බැංකු කර්මාන්තයේ ස්වයංක්‍රීයකරණය තවදුරටත් පුළුල් වූ අතර වාණිජ බැංකු බොහොමයක් ඔවුන්ගේ කටයුතු වලින් වැඩි ප්‍රමාණයක් පරිගණක ගත කරනු ලැබීය. බැංකු කිහිපයක්ම පරිගණක ජාලය තුළින් තම ශාඛා එකිනෙකට සම්බන්ධ කරන ලදී. තම ගණුදෙනුකරුවන් හට දුරකථන බැංකු පහසුකම් ලබාදීමෙන් හෝ තම පෞද්ගලික පරිගණක තුළින් ඕනෑම අවස්ථාවක ඔවුන්ගේ ගිණුම්වල තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ලබා දෙමින් ගණුදෙනුකරුවන්ට සපයනු ලැබූ සේවාවන් පුළුල් කරනු ලැබිණ.

ප්ලාස්ටික් මුදල් වර්ගයක් එනම්, ඇතැම් විට විද්‍යුත් මුදල් පසුම්බිය ලෙස හඳුන්වනු ලබන ස්මාට් කාඩ් පත (Smart Card) ශ්‍රී ලංකාවේ මුල් වරට 1998 වසර මැදදී මහජන බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. ස්මාට් කාඩ් පත් විවිධ කාර්යයන් සඳහා යොදගත හැකි කාඩ්පතක් වන අතර මෙම කාඩ්පත් දරන්නා හට එය විද්‍යුත් මුදල් පසුම්බියක් ලෙසද, ණය කාඩ් පතක් සහ ස්වයංක්‍රීය ටෙලර් කාඩ්පතක් ලෙසද පාවිච්චි කිරීමට ඉඩකඩ ඇත. ස්මාට් කාඩ්පත්හි ඇති විද්‍යුත් පසුම්බිය තුළ මුදල් තැන්පත් කිරීමෙන් තම ඉතිරිකිරීම් තැන්පතු එහි පවත්වාගෙන යා හැකිය. ගණුදෙනුකරුවකුට ඕනෑම ස්මාට් කාඩ්පත් පිළිගන්නා වෙළෙඳසැලකින් හෝ බැංකු ශාඛාවක් මගින් ස්මාට් කාඩ් පත්හි විද්‍යුත් පසුම්බිය තුළින් මුදල් ලබාගැනීමට හෝ ඒ තුළ මුදල් තැන්පත් කිරීමට හැකිය. මීට අමතරව, ස්මාට් කාඩ්පත් භාවිතා කරන්නන් හට මුදල් නැවත ඇතුලත් කරගත හැකි ස්ථානයන්හි ඇති සිය ගිණුම් වලින් විද්‍යුත් මුදල් නැවත කාඩ්පතට ඇතුලත් කර ගැනීමට හැකිය. මේ අතර, සීමාසහිත සම්පත් බැංකුව විසින් සෙට්/සිරස්/මයිස්ත්‍රෝ පහසුකම් සහිත හර කාඩ්පත් නිකුත් කිරීම කරගෙන යන ලදී. 1998 වාණිජ බැංකු 11 ක් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 68 ක් සවිකළ අතර එමගින් 1998 අවසානයේදී, මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 270 දක්වා වැඩිවිය. වාණිජ බැංකු 9 ක් ණය කාඩ් පත් පහසුකම් සැපයීම දිගටම කරගෙන යන ලදී. 1998 දෙසැම්බර් අවසානයේදී ආසන්න වශයෙන් ණය කාඩ්පත් 85,964 ක් නිකුත් කර තිබිණි.

මහජන බැංකුව නව තැන්පතු ක්‍රම දෙකක් හඳුන්වා දුනි. මින් එකක් 'ස්වර්ණ ප්‍රසාද' ආයෝජන ගිණුම වූ අතර එහි මූලිකව එකවර මුදල් ප්‍රමාණයක් තැන්පත් කිරීමෙන් හෝ මාසිකව ගෙවීම් කිරීමෙන් හෝ එම ගිණුම ආරම්භ කළහැකිය. දෙවැන්න 'ඉසුරු උදන' නමින් වූ බාල වයස්කරුවන් උදෙසා වූ ගිණුම් ක්‍රමයකි. මහජන බැංකුව

**විශේෂ සටහන II**

## ශ්‍රී ලංකාවේ ණය කාඩ්පත් භාවිතය

ලොව පුරා වූ තාක්ෂණික දියුණුව සහ 1977 අවසන් භාගයේ ආරම්භ කළ මූල්‍ය අංශයේ කටයුතුවල ක්‍රමික ලිහිල් කිරීමත් සමඟ වඩාත් ගතික හා නවෝත්පාදක බැංකු කර්මාන්තයක් ඇති කරලීමට ශ්‍රී ලංකාව විසින් පියවර රැසක් ගනු ලැබීය. එවැනි එක් පියවරක් වූයේ මුදල් රහිත සමාජයක් කරා ගමන් කිරීමේ ශ්‍රී ලංකාවෙහි මුල් පියවර සනිටුහන් කරමින් ණය කාඩ්පත් හඳුන්වා දීමය. ණය කාඩ්පතක ක්‍රියාකාරිත්වය සඳහා පාර්ශවයන් හතරක් සම්බන්ධ වේ. එනම්, කාඩ්පතෙහි වෙළෙඳ ලකුණ හිමි ණය කාඩ්පත් සමාගම, කාඩ්පත් නිකුත් කරනු ලබන බැංකුව, වෙළෙඳ ආයතන සහ කාඩ්පත් හිමියාය. ණය කාඩ්පතක් නිකුත් කිරීමේදී, නිකුත් කරනු ලබන බැංකුව සහ ණය කාඩ්පත් ඉල්ලුම්කරු ණය කාඩ්පත් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ වගන්ති සහ කොන්දේසි ඇතුලත් සම්මුතියකට එළඹේ. කාඩ්පත් හිමියකු බැංකුවක ගිණුම් හිමියකු වීම අවශ්‍යම නොවේ.

ශ්‍රී ලංකාවේ, මුල්ම වරට 1980 ගණන්වල මුල් කාලයේදී පෞද්ගලික සමාගමක් විසින් ණය කාඩ්පත් හඳුන්වා දෙනු ලදී. මෙම කාඩ්පත 'ගෝල්ඩන් කී ණය කාඩ්පත' යනුවෙන් නම් කෙරිණි. මෙම කාඩ්පතට ලැබුණු සීමිත පිළිගැනීම, ප්ලාස්ටික් මුදල් භාවිතා කිරීමේ ප්‍රයෝජන පිළිබඳව ගණුදෙනුකරුවන්ට හා වෙළෙඳ ආයතනවලට ඒත්තු ගැන්වීමේ අපහසුතාව සහ ණය කාඩ්පත් පිළිබඳව පුද්ගලයන්ගේ දැනීම අඩුකම හේතුවෙන් මෙම කාඩ්පතෙහි භාවිතය මුල් අවස්ථාවේදී සීමාසහිත විය. කෙසේ වුවද, ණය කාඩ්පත් සඳහා වූ පිළිගැනීම පසුගිය වර්ෂ තුළ වැඩි විය. නව මූල්‍ය උපකරණ සමූහයක් හඳුන්වා දීමත් සමඟ වාණිජ බැංකු විසින් 1980 ගණන්වල ණය කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලදී. මේවා මුලින් දේශීය ගනුදෙනු සඳහා පමණක් භාවිතා කළහැකි ඒවා විය. ශ්‍රී ලංකාව 1994 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 8 වන ව්‍යවස්ථාව පිළිගැනීමත් සමඟ වූ ජංගම ගිණුම නිදහස් කිරීමත් සමඟ, අන්තර්ජාතික වශයෙන් වලංගු කාඩ්පත් ද නිකුත් කිරීම බැංකු විසින් ආරම්භ කරන ලදි. ණය කාඩ්පත්වල ඇති වාසි පිළිබඳ දැනුම වැඩිවීමත් සමඟ ණය කාඩ්පත් පිළිබඳව මහජනයා අතර වූ ජනප්‍රියතාවය වැඩිවිය. කාඩ්පත් නිකුත් කරනු ලැබූ බැංකු විසින් සපයනු ලැබූ විවිධ පහසුකම් හා ප්‍රතිලාභයන්ද සමඟ දැඩි ප්‍රචාරක ව්‍යාපාරයන්ද ණය කාඩ්පත් ප්‍රචලිත කිරීමට හේතුවිය.

වීසා සහ මාස්ටර්කාඩ් වැනි ප්‍රසිද්ධ ජාත්‍යන්තර වෙළෙඳ නාම යටතේ වර්තමානයේ, ශ්‍රී ලංකාවේ දේශීය බැංකු හයක් සහ විදේශීය බැංකු තුනක් විසින් ණය කාඩ්පත් නිකුත් කරනු ලැබේ. වර්තමානයේ, මෙම බැංකු විසින් විවිධ වර්ගයේ කාඩ්පත් නිකුත් කරනු ලැබේ. උදා, 'ක්ලැසික්ස්' කාඩ්පත්, 'ගෝල්ඩ්' කාඩ්පත් සහ 'බිස්නස්' කාඩ්පත් සමහර කාඩ්පත් දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද භාවිතා කිරීම සඳහා වලංගු වන අතර සමහර කාඩ්පත් දේශීය ගණුදෙනුවලදී පමණක් වලංගු වේ.

විශාල වශයෙන් ණය කාඩ්පත් භාවිතය බැංකු අංශයෙන් සම්ප්‍රදායික ණය ලබා ගැනීම සඳහා වන ඉල්ලුම අඩුවීමට හේතුවිය හැකිය. ණය කාඩ්පත් විශාල ලෙස භාවිතා කිරීම පෞද්ගලික අංශයට දුන් ණය වැඩි වේගයකින් වර්ධනය වීමටද හේතු වේ. ණය ලබාගෙන මාසයක් ඇතුලත පියවුවහොත් එම ණය, වාණිජ බැංකුවල ශේෂ පත්‍රයන්හි පිළිබිඹු නොවේ. මීට අමතරව ගණුදෙනු සඳහා අඩු මුදල් ප්‍රමාණයක් මහජනයාට අවශ්‍ය වන බැවින් මහජනයා විසින් දරනු ලබන මුදල් ප්‍රමාණය

**වාණිජ බැංකු විසින් නිකුත් කරනු ලැබූ ණය කාඩ්පත්**

| | 1997 | 1998 (අ) | වෙනස % |
|---|---|---|---|
| නිකුත් කරනු ලැබූ මුළු ණය කාඩ්පත් සංඛ්‍යාව | 52,882 | 85,964 | 63 |
| දේශීය | 29,985 | 59,043 | 97 |
| ජාත්‍යන්තර | 22,897 | 26,921 | 18 |
| වර්ෂය අවසානයට නොපියවා ඇති ණය (රු.ද.ල.) | 874 | 1,482 | 70 |
| දේශීය | 358 | 317 | -11 |
| ජාත්‍යන්තර | 516 | 1,165 | 126 |
| කල් ඉකුත්වූ ණය (නොපියවා ඇති ණයවල ප්‍රතිශතයක් ලෙස) | 9 | 19 | - |
| කල් පසුවූ ණය (නොපියවා ඇති ණයවල ප්‍රතිශතයක් ලෙස) | 21 | 7 | - |
| පොලී අනුපාතිකය ( %) | 20.0-33.0 | 20.0-33.0 | - |
| වෙළෙඳ ආයතනවලින් ලබා ගන්නා කොමිස් මුදල් (%) | 0.2-5.0 | 0.2-5.0 | - |

මූලයන් : අදාළ ආයතනයන්

අ. තාවකාලික

**විශේෂ සටහන - II (සම්බන්ධයි)**

අඩුවිය හැකිය. මහජනයා විසින් දරණු ලබන මුදල් ප්‍රමාණය අඩුවීම මුදල් ගුණකයේ වැඩිවීමකට හේතු වේ. එමෙන්ම, ලෝකයේ බොහෝ රටවල කාඩ්පත් පිළිගැනීම නිසා සංචාරකයන්ට ඉමහත් පහසුවක් ඇතිවේ.

ණය කාඩ්පත් භාවිතය ශ්‍රී ලංකාවේ ජනප්‍රිය වෙමින් පවතී. මෙම කාඩ්පත් භාවිතයෙන් බොහෝ වාසි සිදුවන අතරම කාඩ්පත් භාවිතා කරන්නා විශාල ලෙස ණය වීමට පත්වීම සහ එමගින් මූල්‍ය ආපදාවලට මුහුණදීම වැනි අවාසිද තිබේ. කල් ඉකුත් වූ ණය (එක් මාසයක සිට මාස 3 දක්වා වඩා හිඟ වාරික ඇති ණය) මුළු නොපියවා ඇති ණය කාඩ්පත් ශේෂයන්ගෙන් සියයට 19 ක් පමණ හා කල් පසු වූ ණය (මාස 3 කට වඩා හිඟ වාරික ඇති ණය) මුළු නොපියවා ඇති ණය කාඩ්පත් ශේෂයන්ගෙන් සියයට 7 ක් පමණ වන බව ඉතා මෑත තොරතුරු වලින් පෙන්නුම් කරයි. ණය කාඩ්පත් හිමියන් ණය කාඩ්පත් භාවිතයේදී සැලකිය යුතු සුපරීක්ෂාවන් නොහැරීම නිසා වංචා සහගත ණය කාඩ්පත් භාවිතයද සිදුවිය හැක.

විසින් කෘෂිකර්මය, ග්‍රාමීය සංවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ යෝජනාක්‍රම, ස්වයං රැකියා හා පරිභෝජන වැනි ද සඳහා ද ණය ප්‍රදනය කිරීමට නව ණය යෝජනාක්‍රම කිහිපයක්ම දියත් කරන ලදී.

ලංකා බැංකුව වසර තුළදී කුඩා තේ වතු අංශය සහ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම පිණිස නව ණය යෝජනාක්‍රම කිහිපයක්ම හඳුන්වා දුනි. ලංකා බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයනු ලැබූ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල සහ ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ නියෝජ්‍යත්ව ආයතනයෙන් ලබාගත් අරමුදල් වලින් ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ණය සැපයීමේ සහභාගිත්ව ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක විය. පොල් වගා සංවර්ධන ණය වැඩසටහන යටතේ වන ආහාර සහ පෝෂණය නැංවීමේ යෝජනා ක්‍රමය යටතේ මහජන බැංකුව සහ ලංකා බැංකුව යන දෙකම ණය සපයනු ලැබීය.

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව පුද්ගලයනට රන් මිලදී ගැනීමට සහ ඒවා ගිණුම් තුළ තබා ගැනීමට හැකිවන පරිදි "රන් ආයෝජන ගිණුම" නමින් නව තැන්පතු ක්‍රමයක් හඳුන්වා දුනි. තැන්පත්කරුට ගිණුමෙහි එකතු වී ඇති රන් ආපසු ගැනීමට හෝ එම රන් ආපසු හැටන් නැෂනල් බැංකුවට විකිණීමට හැකිය. රන් ගිණුම් හිමිකරුවකුට රන් ආයෝජන ගිණුමෙහි පවතින ශේෂයන් සුරැකුම් ලෙස පවත්වා ගෙන ණය පහසුකම් ලබා ගැනීමට ද පහසුකම් ඇත. මීට අමතරව, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විධායක නිලධාරීන්ට වාහන කල්බදු පහසුකම් ද, කල්පවත්නා පාරිභෝගික ද්‍රව්‍ය මිලට ගැනීම සඳහාද, අධ්‍යාපන කටයුතු සහ දේපල මිලට ගැනීම සඳහාද පෞද්ගලික ණය ක්‍රමයක් හඳුන්වා දුනි. මෙම බැංකුව මගින් දුරකථන බැංකු පහසුකමද හඳුන්වා දුණි. 1998 දී ණයකර නිකුතුව තුළින් අරමුදල් සපයා ගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම වාණිජ බැංකුව මෙම බැංකුව විය.

සීමාසහිත ලංකා කොමර්ෂල් බැංකුව වසර තුළදී නව තැන්පතු ක්‍රම හඳුන්වා දුන් අතර, ඒවා නම් වශයෙන් "අරුණළු" බාලවයස්කාර ඉතිරිකිරීමේ ගිණුම් ක්‍රමය, 'ඉසුරු-2' යන බාලවයස්කාර ඉතිරිකිරීම් සහ එකවර මුදල් තැන්පත් කිරීමේ යෝජනා ක්‍රමයද විය. සීමාසහිත ලංකා කොමර්ෂල් බැංකුව එහි එක් ශාඛාවක් තැන්පතු භාර ගැනීම, ගිණුම් විවෘත කිරීම, සංචාරක චෙක්පත්, විදේශීය මුදල් නෝට්ටු, අණකර සහ ගෙවුම් ඇණවුම් නිකුත් කිරීම සහ මුදල් කිරීම සහ උපයෝජන බිල්පත් ගෙවීමේ පහසුකම් වැනි සීමිත සේවාවන් ලබාදීම පිණිස සති අන්ත සහ නිවාඩු දිනවල ව්‍යාපාරික කටයුතු සඳහා විවෘතව තබා ගැනීමට කටයුතු කෙරිණ. මෙම බැංකුවද රුපියල් දශ ලක්ෂ 250 බැගින් වන ණයකර නිකුතුන් දෙකක් කරනු ලැබීය.

සීමාසහිත සෙලාන් බැංකුව, එකම ඒකකයක ව්‍යාපාරික පරිශ්‍රයක් සහ නිවසක් තමන් සතුව පවත්වා ගැනීමට කැමැති ගණුදෙනුකරුවන් හට පහසුකම් සැලසීම පිණිස දැනට පවතින 'පියස' නිවාස ණය යෝජනා ක්‍රමය තවදුරටත් ව්‍යාප්ත කරමින් "පියස වෙළෙඳ නිවස" නමින් නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම යෝජනා ක්‍රමය තුළින් ගණුදෙනුකරුවන්ට රුපියල් 50,000 සිට රුපියල් දශ ලක්ෂ 10 ක් දක්වා ණය ලබා ගැනීමට හැකිවන අතර එම ණය ආපසු ගෙවීමේ කාලය වසර 6-25 දක්වා කාලයක් වේ. සහනදායී පොලී අනුපාතික යටතේ මෙම ණය සඳහා උපරිම සහන කාලය වසර 4 කි. සහනදායී කාලය තුළදී අය කරනු ලබන පොලී අනුපාතිකය සියයට 16.2 ක් වන අතර ඉන්පසුව එය සියයට 19 කි. සෙලාන් බැංකුව, පිට පිටම කන්න දෙකක් වී වගා කළ නොහැකි වූ කිරිදි ඔය ව්‍යාපාරයේ ගොවීන් සඳහා ඔවුන් ගේ වී වගා බිම්වලින් කොටසක් කෙසෙල් වගාව සඳහා යෙදවීමට ණය පහසුකම් සැපයීම සඳහා ණය යෝජනා ක්‍රමයක්ද හඳුන්වා දුනි. මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 6.9 ක් ගණුදෙනුකරුවන් 258 ක් සඳහා අනුමත කෙරිණි. මේ සඳහා අය කළ පොලී අනුපාතිකය සියයට 22 ක් විය. සෙලාන් බැංකුවද තම මධ්‍ය හා දිගුකාලීන ණය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ණයකර නිකුතුවක් තුළින් අරමුදල් රැස් කරගනු ලැබීය.

සීමාසහිත පෑන් ඒෂියා බැංකුව 'පූර්ණ' මාසික ආදායම් සැලැස්ම නමින් නවතම තැන්පතු විශේෂයක් හඳුන්වා දුන් අතර ඒ සඳහා වන පොලී අනුපාතිකය වසරකට සියයට

10.75 සිට 13.50 අතර විය. මෙහි පොලිය තැන්පතුවේ පරිණත කාලය හා තැන්පතු මුදලේ වටිනාකම අනුව තීරණය වේ. සීමාසහිත පැන් ඒෂියා බැංකුව විසින් වසර තුළදී උකස් ව්‍යාපාර කටයුතුද පටන් ගන්නා ලදී. මේ අතර සීමාසහිත යුනියන් බැංකුව ළමා අධ්‍යාපන ඉතුරුම් ගිණුම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දුනි.

## 10.7 ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය

1990 අංක 18 දරණ ණය තොරතුරු කාර්යාංශ පනත යටතේ ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (ශ්‍රී.ල.ණ.තො.කා.) 1998 වර්ෂයේදී එහි අටවන සාර්ථක අවුරුද්ද නිමාවට පත් කළේය. පනත මගින් බලය ලබාදී ඇති පරිදි ණය තොරතුරු රැස් කිරීම සැසැඳීම, ණය ගැණුම්කරුවන් සහ ණය ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින ණය ගැණුම්කරුවන් පිළිබඳ මූල්‍ය තොරතුරු එක්රැස්කර එම තොරතුරු කාර්යාංශයේ කොටස් හිමියන් වන ණය දෙන ආයතන වලට සැපයීම කරගෙන යනු ලැබීය.

කාර්යාංශය රුපියල් 100,000 සහ ඊට ඉහළ අවිධිමත් ණය සහ රුපියල් 500,000 සහ ඊට ඉහළ විධිමත් ණය සඳහා තොරතුරු වර්තමානයේ රැස් කරයි. ඊට පසුව කාර්යාංශය සියළුම ණයදෙන ආයතනයන්හි අවිධිමත් ණය තොරතුරු සහ බස්නාහිර පලාතේ රාජ්‍ය බැංකුවල විධිමත් ණය තොරතුරු මාසිකව ද, අනෙකුත් ණයදෙන ආයතනයන්හි විධිමත් ණය තොරතුරු කාර්තුමය වශයෙන්ද යාවත්කාලීන කරනු ලැබේ. වඩාත් කාලීන ණය තොරතුරු සේවාවන් සැපයීමේ අරමුණින් ශ්‍රී.ල.ණ.තො.කා. ය සපයනු ලබන තම ණය තොරතුරු වාර්තාවල ගුණාත්මක බව සහ විස්තරාත්මක බව වැඩි කර ගෙන යනු ලැබේ.

ණයදෙන ආයතනයන්ගෙන් ණය තොරතුරු වාර්තා ඉල්ලුමේ සැලකියයුතු ඉහළයාමක් පෙන්නුම් කෙරිණ. 1998 වර්ෂය තුළදී කාර්යාංශය ණය තොරතුරු වාර්තා 125,928 ක් නිකුත් කළ අතර, එය පසුගිය වසරේ නිකුත් කළ 102,175 හා සසඳන කල සියයට 23 ක ඉහළයාමක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1998 වර්ෂය තුළදී ණය තොරතුරු වාර්තා සැපයීමෙන් ලද ආදයම සියයට 33 ක ඉහළයාමක් සිදුවිය. වර්ෂය තුළ කාර්යාංශය රුපියල් දශ ලක්ෂ 3.7 ක ලාභයක් ලැබුවත් තවදුරටත් පාඩු ඇතිව ක්‍රියාත්මක වේ. 1998 වර්ෂය තුළදී එක ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක් සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් කාර්යාංශයේ කොටස්කරුවන් බවට පත්විය. වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ මූල්‍ය සමාගම් කාර්යාංශයේ කොටස්කරුවන් වේ.

## 10.8 ග්‍රාමීය බැංකු කටයුතු සහ ග්‍රාමීය ණය සමස්ත උපනතීන් හා සංවර්ධනයන්

ග්‍රාමීය ණය ලබා ගැනීමට ග්‍රාමීය ජනතාවට තවදුරටත් අවස්ථාව ලබා දීමේ අටියෙන්, ගම් මට්ටමෙහි පුළුල්ව ව්‍යාප්ත වන ග්‍රාමීය බැංකු ජාලයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම දිරි ගැන්වීම අරමුණු කොට ගත් ප්‍රතිපත්තිය 1998 වසර තුළදී උද්‍යෝගිමත් ලෙස ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රතිපත්තිය පසුගිය වසරේ ඒ සම්බන්ධයෙන් තබන ලද පියවර එනම්, ප්‍රජා පදනමැති සුළු ව්‍යවසායයන් මූල්‍යකරණය කිරීමේ සංවිධාන ඇති කිරීම, සංවර්ධන බැංකු සහ ඉතිරි කිරීමේ බැංකු ස්ථාපිත කිරීමෙහිලා පෞද්ගලික අංශය දිරිගැන්වීම සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ඒකාබද්ධ කොට පළාත් පදනමක් සහිත ප්‍රාදේශීය සංවර්ධන බැංකු වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම තවදුරටත් ඉදිරියට ගෙන යාමක් විය.

ප්‍රජා පදනමැති සංවිධාන ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගත් කල, සමෘද්ධි බැංකු සංගම් පිහිටුවීමත්, ඉසුරු සංවර්ධන සමිති පිහිටුවීමත් නොකඩවා සිදු වූ අතර, ඒවා මේ දක්වා පැවති යෝජනා ක්‍රමයන්හි පථයට ඇතුල් නොවූ භූමි ප්‍රදේශයන් දක්වා ද ව්‍යාප්ත විය. පෞද්ගලික සංවර්ධන බැංකු සහ ඉතිරි කිරීමේ බැංකු එනම්, සණස සංවර්ධන බැංකුව, ප්‍රමුඛ ඉතිරි කිරීමේ හා සංවර්ධන බැංකුව සහ සෙලින්කෝ සංවර්ධන බැංකුව විසින් සිය ශාඛාවන් පිට පළාත්හි විවෘත කිරීමද දිගටම කරගෙන යන ලදී. මීට අමතරව ජාතික සංවර්ධන බැංකුව සහ ඩීඑෆ්සීසී බැංකුව විසින්ද සිය බැංකු ශාඛා ව්‍යාප්තිකරණ වැඩසටහන පුළුල් කරමින්, රටෙහි දුර බැහැර පළාත්වල ජනතාවට සිය සේවාවන් සපයන ලදී. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ප්‍රතිව්‍යුහකරණය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබේ. මෙබඳු ප්‍රාදේශීය සංවර්ධන බැංකු තුනක් 1998 අවසානය වනවිට පිහිටුවා තිබුණි. මහ බැංකුවේ කොටස් හිමිකාරත්වයට අමතරව මෙම නව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවල හිමිකාරත්වය රාජ්‍ය බැංකු දෙක, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ සේවක අර්ථසාධක අරමුදල අතරෙහි විවිධාංගීකරණය කරමින් ඒවායේ ප්‍රාග්ධන පදනම පුළුල් කරන ලදී. තවද, මේවායේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් බැංකු අංශයේ වෘත්තිමය සුදුසුකම් ඇති සාමාන්‍යාධිකාරී වරයෙකු පත් කිරීමට ඉඩකඩ සැලසීම තුළින් වෘත්තීයමය බැංකු කළමනාකාරිත්වයද මෙම බැංකුවලට හඳුන්වා දෙන ලදී.

වී සහ අනෙකුත් අතිරේක ආහාර බෝග අංශයන් සඳහා ණය සපයනු ලබන, දනට පවත්නා කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය වන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය, සහභාගිත්ව ණය දෙන ආයතනවල අරමුදල් යොදගනිමින් රජය විසින් සපයන පොලී සහනාධාර පහසුකම යටතේ තවදුරටත් ක්‍රියාත්මක විය. ඒ හා සමාන තවත් පොලී සහනාධාර පහසුකමක් කුඩා ව්‍යවසායි මූල්‍යකරණය මඟින් ස්වයං රැකියා උත්පාදනය අරමුණු කොටගත් ණය යෝජනා ක්‍රමය වන 'සුරතුර' දෙවන අදියර සඳහාද රජය විසින් සපයන ලදී. විමර්ශනයට භාජනය වන වර්ෂය තුළදී කෘෂිකාර්මික ණය සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණ තුනක් ගනු ලැබුණි. මෙයින් පළමුවැන්න වනුයේ නව සපිරි ග්‍රාමීය ණය යොජනා ක්‍රමය යටතේ 1991 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ වාර්ෂික පොලී අනුපාතිකය වන සියයට 16, සංවර්ධන ණය සඳහා වාණිජ බැංකු විසින් අය කරනු

ලබන වාර්ෂික පොලී අනුපාතිකවල සාමාන්‍ය පහත වැටීම හා සැසඳෙන අයුරින් 1998 යල කන්නයේ සිට සියයට 12 දක්වා අඩු කිරීමයි. දෙවැන්න වනුයේ ණය දෙන ආයතන විසින් ප්‍රදානය කරනු ලබන කෘෂිකාර්මික ණයවල අරමුදල් පිරිවැය අඩු කිරීම පිණිස රජය විසින් සපයනු ලබන ප්‍රතිශතාංක 7.5 ක් වන පොලී සහනාධාරය ප්‍රතිශතාංක සියයට 10 දක්වා වැඩි කිරීමයි. තෙවැන්න වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යන ලද ඇප ආවරණ ක්‍රමය වෙනුවට රජය විසින් අරමුදල් සම්පාදිත කෘෂිකාර්මික ණය ඇප ආවරණ අරමුදලක් පිහිටුවීමයි. මෙම නව අරමුදල මගින් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක කරනු ලබන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සහ අනෙකුත් කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමයන් යටතේ, සහභාගී වන බැංකු මගින් ප්‍රදානය කරනු ලබන පැහැර හැරි ණය වෙනුවෙන්, හිඟ හිටි මුදලින් සියයට 60 ක වන්දි මුදලක් ගෙවනු ලැබේ.

නිරීක්ෂණයට භාජනය වන වර්ෂය තුළදී, සමාගම් ආඥා පනත යටතේ සීමාසහිත වගකීම් සමාගම් වශයෙන් ලියාපදිංචි වූ පුත්තලම, ගාල්ල හා මාතර දිස්ත්‍රික්කයන්හි ඉසුරු සංවර්ධන සමිති විසින් සිය දිස්ත්‍රික් සංගමයන් පිහිටුවා ගන්නා ලදී. මෙම පියවරෙහි අරමුණු වූයේ එක් අතකින් එම සමිති මූල්‍ය වශයෙන් සවිමත් කිරීමත්, අනික් අතින් සම්බන්ධීකාරක ආයතනයන් වශයෙන් ස්වයං නියෝජනය කිරීමට හැකි මූල්‍ය ශක්‍යතාවයකින් යුතු ආයතන බවට පත් කිරීමත්ය. මෙතුලින් සනාථ වන කරුණ වන්නේ දුප්පතුන් නිසි ලෙස දිරි ගැන්වීම තුලින්, ඔවුන් සාමූහිකව අරමුණු මුදුන්පමුණුවා ගන්නා බවත්, එතුලින් ලබන පරිචය තුළින් සිය ජීවන තත්ත්වය උසස් කර ගැනීමෙන්, දුප්පත්කම නමැති උගුලෙන් ගැලවීමට ඔවුනට ඉඩකඩ සැලසෙන බවත්ය.

## නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මගින් වී සහ අතිරේක ආහාර බෝග වගා කිරීම සඳහා දිවයින පුරා විසිරී සිටින ගොවීන් හට කෙටිකාලීන වගා ණය සැපයීම තවදුරටත් සිදු කෙරිණි. මේ යටතේ, 1998 වර්ෂය තුළදී ගොවීන් 10,343 ක් වෙත රුපියල් දශ ලක්ෂ 442 ක් මුදා හැර තිබුණි. මෙම යෝජනා ක්‍රමය යටතේ ණය දෙන බැංකුවලට සිය අරමුදල් යොදා ගනිමින් සියයට 12 ක වාර්ෂික පොලී අනුපාතිකයකට ණය ලබා දීමට හැකි වනු පිණිස වර්ෂයකට ප්‍රතිශතාංක 10 ක පොලී සහනාධාරයක් රජය විසින් ලබා දෙන ලදී. විමර්ශනයට භාජනය වන වර්ෂය තුළදී, 1994/95 මහ කන්නයේ සිට 1998 යල කන්නය දක්වා නොකඩවා වගා කන්න හයක් තුළදී ප්‍රදානය කරන ලද රුපියල් දශ ලක්ෂ 1,849 ක් වන ණය වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 24.7 ක පොලී සහනාධාරයක් රජය විසින් ණය දෙන බැංකු වෙත ගෙවන ලදී.

**10.9 සංඛ්‍යා සටහන**

**නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද වගා ණය (1998.12.31 දින ට පැවැති තත්ත්වය)**

රුපියල් දශලක්ෂ

| වගා කන්නය | රාජ්‍ය බැංකු | | | දේශීය පෞද්ගලික බැංකු (අ) | | | ප්‍රා.ග්‍රා.සං.බැංකු (ආ) | | | මුළු ණය මුදල | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව | වී | අතුරු ආහාර බෝග | එකතුව |
| 1993/1994 මහ | 308 | 85 | 393 | 23 | 22 | 45 | 122 | 73 | 195 | 453 | 180 | 633 |
| 1994 යල (ඇ) | 136 | 64 | 200 | 8 | 35 | 43 | 62 | 38 | 100 | 207 | 136 | 343 |
| වගා වර්ෂය 1994 | 444 | 149 | 593 | 31 | 57 | 88 | 184 | 111 | 295 | 660 | 316 | 976 |
| 1994/1995 මහ | 516 | 182 | 698 | 18 | 18 | 36 | 37 | 22 | 59 | 571 | 222 | 793 |
| 1995 යල | 179 | 131 | 310 | 8 | 23 | 31 | 34 | 22 | 56 | 221 | 176 | 397 |
| වගා වර්ෂය 1995 | 695 | 313 | 1,008 | 26 | 41 | 67 | 71 | 44 | 115 | 792 | 398 | 1,190 |
| 1995/1996 මහ | 265 | 76 | 341 | 18 | 28 | 46 | 25 | 33 | 58 | 308 | 137 | 445 |
| 1996 යල | 71 | 33 | 104 | 3 | 12 | 15 | 14 | 8 | 22 | 88 | 53 | 141 |
| වගා වර්ෂය 1996 | 336 | 109 | 445 | 21 | 40 | 61 | 39 | 41 | 80 | 396 | 190 | 586 |
| 1996/1997 මහ | 233 | 59 | 292 | 18 | 28 | 46 | 24 | 36 | 60 | 275 | 123 | 398 |
| 1997 යල | 72 | 35 | 107 | 20 | 32 | 52 | 16 | 13 | 29 | 108 | 80 | 188 |
| වගා වර්ෂය 1997 | 305 | 94 | 399 | 38 | 60 | 98 | 40 | 49 | 89 | 383 | 203 | 586 |
| 1997/1998 මහ(ඈ) | 145 | 37 | 182 | 14 | 22 | 36 | 19 | 37 | 56 | 178 | 96 | 274 |
| 1998 යල (ඈ) | 69 | 32 | 101 | 16 | 25 | 41 | 14 | 12 | 26 | 99 | 69 | 168 |
| වගා වර්ෂය 1998 (ඈ) | 214 | 69 | 283 | 30 | 47 | 77 | 33 | 49 | 82 | 277 | 165 | 442 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) හැටන් නැෂනල් බැංකුව, කොමර්ෂල් බැංකුව සහ සෙලාන් බැංකුව පමණි.
(ආ) 1998 සංඛ්‍යාවන්හි ප්‍රාදේශීය සංවර්ධන බැංකු වල දත්තයන් ඇතුලත්ය.
(ඇ) 1994 අප්‍රේල් මාසයේ දී ප්‍රතිමූල්‍ය ක්‍රමය ඉවත් කර ඒ වෙනුවට පොලී සහනාධාර ක්‍රමය ආරම්භ කරන ලදී.
(ඈ) තාවකාලික

1994 වර්ෂයේදී රජය විසින් හඳුන්වා දෙන ලද ගොවි සහන වැඩපිළිවෙල 1998 ජුනි මස සිට 1998 දෙසැම්බර් මස දක්වා දීර්ඝ කරන ලද හෙයින්, වන්දි හිමි බැංකුවලට මුළු වර්ෂය පුරාම වන්දි ගෙවීම සිදු කරන ලදී. මෙම පහසුකම යටතේ, 1978 වර්ෂයේ සිට 1993/94 මහ කන්නය දක්වා කාලය තුළ ණය පැහැර හරින ලද ගොවීන් හට ණය සමාවක් දීම වශයෙන් ඔවුන්ගේ නමින් බැංකුවල හිඟ හිටුවා ඇති මුදලින් සියයට 25 ක ගෙවීමක් කිරීමට එකඟ වීමේ කොන්දේසියට යටත්ව සහන සලසා දී තිබේ. එවැනි ණය සම්බන්ධයෙන්, ඉතිරි වන හිඟ මුදල වන සියයට 75, මහ බැංකුවේ සියයට 37.5 ක දයකත්වයෙන්ද, රජයේ සියයට 18.75 ක දයකත්වයෙන්ද, අදාල ණය දෙන බැංකුවල සියයට 18.75 ක දයකත්වයෙන්ද කපා හරිනු ලැබිණි. මෙම ගොවි සහන වැඩපිළිවෙල යටතේ, 1998 වසර අවසානය වනවිට ගොවීන් 32,359 ක් සහන ලබා තිබුණි.

විමර්ශනයට භාජනය වන වසර තුළදී, මෙම පහසුකම යටතේ රජය විසින් රුපියල් දශ ලක්ෂ 9 ක්ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇප ආවරණ ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 5.8 ක්ද ගෙවන ලදී. ඒ අනුව, 1998 වසර අවසානය වනවිට රජය හා මහ බැංකුව විසින් ණය දෙන බැංකු වෙත ගෙවන ලද සමුච්චිත මුදල් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 42 ක් හා රුපියල් දශ ලක්ෂ 83 ක් විය.

## වගා රක්ෂණ යෝජනා ක්‍රම

කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් වී, අතිරේක ආහාර බෝග හා පශු සම්පත් යන අංශයන්ට රක්ෂණ ආවරණ සැපයීම විමර්ශනයට භාජනය වන වසර තුළදීද නොකඩවා පවත්වාගෙන යන ලදී. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සම්පාදිත දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ණය පහසුකම් සපයනු ලබන පළතුරු බෝග 11 ක් සඳහා විශේෂ රක්ෂණ ආවරණ ක්‍රමයක් මෙම වසර තුළදී ක්‍රියාවට නැඟුණි. එසේම, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රමයක් යටතේ මූල්‍යකරණය කරනු ලබන බෝග සඳහාද එවැනිම වූ රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. තවද, කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් දක්ෂිණ ලංකා සංවර්ධන අධිකාරිය සමඟ එක්ව බඩ ඉරිඟු සඳහා විශේෂ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයක් පර්යේෂණ පදනමක් මත ක්‍රියාත්මක කර ඇති අතර, එය ඉදිරියේදී දිවයිනෙහි අනෙකුත් පළාත් දක්වා ද ව්‍යාප්ත කරනු ඇත. මෙයට අමතරව තේ

**10.10 සංඛ්‍යා සටහන**

**තැන්පතු සහ අත්තිකාරම් - ග්‍රාමීය අංශය**

රුපියල් දශලක්ෂ

| | සමුපකාර ග්‍රාමීය බැංකු | | කෘෂි සේවා මධ්‍යස්ථානවල ඇති ලංකා බැංකු උප කාර්යාල | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (අ) | | සකසුරුවම් සහ ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති (සනස) | | සර්වෝදය | | ජනශක්ති බැංකුව හම්බන්තොට | | සමෘද්ධි බැංකු සමිති | | සණස සංවර්ධන බැංකුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1997(ආ) | 1998(ඇ) | 1997(ආ) | 1998(ඇ) | 1997 | 1998(ඇ) | 1997 | 1998(ඇ) | 1997 | 1998(ඇ) | 1997 | 1998(ඇ) | 1997 | 1998(ඇ) | 1997 | 1998(ඇ) |
| 1. මුළු ඉතිරිකිරීම්(ඈ) | 9,871 | 10,518 | 305 | 316 | 2,504 | 7,827 | 3,895 | 3,506 | 206 | 293 | 14 | 43 | 132 | 458 | 386 | 678 |
| ඉතිරිකිරීම් | 7,343 | 9,093 | 257 | 256 | 1,612 | 1,881 | 1,715 | 1,543 | 159 | 227 | 11 | 13 | 24 | - | 18 | 115 |
| විශේෂ ඉතිරිකිරීම් | - | - | 10 | 29 | 118 | 111 | 847 | 762 | 47 | 65 | 3 | 15 | 25 | 194 | - | 1 |
| ස්ථාවර තැන්පතු | 2,528 | 2,445 | 37 | 32 | 773 | 5,835 | 493 | 443 | - | - | 1 | 1 | - | - | 231 | 410 |
| කොටස් | - | - | - | - | 1 | 1 | 840 | 756 | - | - | - | 15 | 83 | 263 | 138 | 151 |
| 2. ප්‍රදානය කළ මුළු ණය(ඉ) | 3,363 | 3,907 | 151 | 170 | 3,929 | 9,194 | 2,335 | 1,868 | 1,010 | 1,352 | 313 | 58 | 27 | 827 | 20 | 339 |
| කෘෂිකර්මය | 879 | 341 | 14 | 16 | 662 | 4,156 | 290 | 232 | 290 | 319 | 170 | 29 | 6 | 57 | 1 | 10 |
| සත්ව පාලනය | 489 | 149 | 1 | 1 | 49 | 155 | 46 | 36 | 37 | 48 | 32 | 13 | - | 1 | - | 1 |
| ධීවර | 98 | | - | - | 31 | 20 | - | - | - | - | 8 | 3 | - | 177 | - | - |
| කුඩා කර්මාන්ත | 130 | 213 | 2 | 3 | 356 | 644 | 93 | 74 | 81 | 89 | 70 | 4 | - | - | 2 | 99 |
| නිවාස තැනීම, විදුලිය ලබාදීම සහ ජල සැපයුම | 1,358 | 2,011 | 3 | 3 | 134 | 179 | 253 | 202 | - | - | 14 | 6 | - | - | - | 32 |
| ව්‍යාපෘති/වාණිජ | 209 | 406 | 56 | 70 | 705 | 1,152 | 511 | 409 | 77 | 98 | - | - | 21 | - | 11 | 155 |
| වෙනත් | 199 | 787 | 75 | 77 | 1,992 | 2,887 | 1,143 | 914 | 525 | 798 | 19 | 3 | - | 593 | 6 | 43 |

(අ) 1998 දත්තවල ග්‍රාමීය සංවර්ධන බැංකු දත්ත ඇතුලත්ව ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික දත්ත
(ඈ) 1997 සහ 1998 වර්ෂ අවසානයට ඉතුරුම්
(ඉ) 1997 සහ 1998 වර්ෂයන්හි ප්‍රදානය කළ ණය මුදල්

මූලයන් : මහජන බැංකුව
ලංකා බැංකුව
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව
ප්‍රාදේශීය සංවර්ධන බැංකු
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය
සණස සංවර්ධන බැංකුව
සණස
සර්වෝදය
කාන්තා සංවර්ධන පදනම - හම්බන්තොට

පර්යේෂණ ආයතනය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අනුදැනුම සහිතව තේ වවන්නන් සඳහා ද රක්ෂණ ක්‍රමයක් සකස් කිරීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී. කෘෂි රක්ෂණ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන එකම පෞද්ගලික රක්ෂණ ආයතනය වන සෙලින්කෝ රක්ෂණ සමාගම වී, සෝයා බෝංචි, මිරිස්, කෙසෙල්, බඩ ඉරිඟු සහ උක් වගාවන් ආවරණය කරමින් සිය රක්ෂණ සේවා තවදුරටත් පුළුල් ලෙස ව්‍යාප්ත කළේය. එමෙන්ම, බහුවාර්ෂික බෝග සහ පළතුරු බෝග වැඩි ප්‍රමාණයක් ආවරණය වන පරිදි සිය කෘෂි රක්ෂණ කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය මූලික පියවරය රැසක් සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම විසින් දැනටමත් ගෙන තිබේ.

1997 වසරෙහි රක්ෂණය කරන ලද කුඹුරු බිම් ප්‍රමාණය වන හෙක්ටයාර 21,000 හා සංසන්දනය කරන කල 1998 වසර තුළදී කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණය කර ඇත්තේ හෙක්ටයාර 14,000 කි. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගී වන ණය දෙන බැංකු වෙත ප්‍රතිමූල්‍ය සැපයීමේ වැඩපිළිවෙල නවතා දැමීමේ සහ කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් දිවයිනෙහි සමහර ප්‍රදේශවල වර්ෂා පෝෂිත කුඹුරු බිම් වෙනුවෙන් සපයන ලද රක්ෂණ ආවරණය ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 1996 වසරේ සිට කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ ආවරණ සපයන ලද කුඹුරු බිම් ප්‍රමාණයෙහි ක්‍රමික අඩු වීමක් පෙන්නුම් කරයි. 1998 වසර තුළදී කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ වාරික වශයෙන් රුපියල් දශ ලක්ෂ 9.25 ක් එකතු කළ අතර, රුපියල් දශ ලක්ෂ 1.55 ක් වන්දි මුදල් වශයෙන් ගෙවීය. අනෙකුත් අතුරු බෝග වෙනුවෙන් හෙක්ටයාර 1,713 ක භූමි ප්‍රමාණයක් ආවරණය කළ අතර, එකතු කරන ලද රක්ෂණ වාරිකවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 0.64 කි. සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම හෙක්ටයාර 1,000 ක කුඹුරු බිම් ප්‍රමාණයක් රක්ෂණය කරන ලද අතර රුපියල් දශ ලක්ෂ 0.74 ක් රක්ෂණ වාරික වශයෙන් ලබාගෙන ඇත. වී වගා පාලු වෙනුවෙන් එම සමාගම විසින් ගෙවන ලද වන්දි මුදල රුපියල් දශ ලක්ෂ 0.6 කි. තවද, මෙම සමාගම විසින් රක්ෂණය කරන ලද අනෙකුත් බෝග වගා කරන ලද භූමි ප්‍රමාණය හෙක්ටයාර 653 කි. ඒ යටතේ රුපියල් දශ ලක්ෂ 0.72 ක් රක්ෂණ වාරික වශයෙන් එකතු කරන ලද අතර, රුපියල් දශ ලක්ෂ 0.56 ක් වන්දි වශයෙන් ගෙවා ඇත.

කෘෂි රක්ෂණ මණ්ඩලය හා සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම මෙම වසර තුළදී ද, පශු සම්පත් රක්ෂණ ආවරණ සපයන ලදී. මේ යටතේ 1998 වසරේදී කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් එකතු කරන ලද වාරික ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2.6 ක් වන අතර, ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1.05 කි. සෙලින්කෝ රක්ෂණ සමාගම විසින් පශු සම්පත් රක්ෂණය වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 0.7 ක් වාරික වශයෙන් එකතු කළ අතර, රුපියල් දශ ලක්ෂ 0.22 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි

මෑත කාලයේදී, වගා රක්ෂණය විවිධ බෝග වර්ග හා නිෂ්පාදන ආවරණය කරමින් ව්‍යාප්ත විය. එසේ වුවද, එමගින් සැපයෙන ආවරණ, වන්දි මට්ටම් සහ ඒවායේ ශක්‍යතාවය බලාපොරොත්තු වන මට්ටම දක්වා මෙතෙක් ළඟා වී ඇතැයි සැළකිය නොහැක. ප්‍රධාන කෘෂි රක්ෂකයා වන කෘෂි රක්ෂණ මණ්ඩලය, සිය වගා රක්ෂණ යෝජනා ක්‍රමයන්හි ආවරණ සැපයීම හා වන්දි ගෙවීම තීරණය කිරීමේදී තවදුරටත් රාජ්‍ය අරමුදල් මත යැපෙනු දැකිය හැකි අතර අතීතයේ සිටම ප්‍රකට වී ඇති මෙම ස්වභාවය නිසා, එමගින් ගොවි ජනතාවට ප්‍රමාණවත් පරිදි සේවාවක් සැලසිය හැකිද යන්න පිළිබඳව කුකුසක් මතු වී ඇත. අනෙක් අතින් බලන කල කෘෂි රක්ෂණ මණ්ඩලය වෙත ව්‍යවස්ථාපිතව පැවරී ඇති ඒකාධිකාරී තත්ත්වය කරණකොටගෙන පෞද්ගලික අංශයේ රක්ෂකයන් පවා කෘෂි රක්ෂණ ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වීමට මැළි කමක් දක්වන බව පෙනේ. එබැවින් අඩු රක්ෂණ වාරික අනුපාතිකයන් යටතේ, ඉහළ වන්දි මට්ටම් ලැබෙන පරිදි කෘෂි රක්ෂණ ක්ෂේත්‍රයේ තරඟකාරිත්වයක් ඇති කළහොත්, එතුලින් ගොවි ජනතාව වැඩි ඵල ප්‍රයෝජනයක් ලබනු ඇතැයි අපේක්ෂා කළහැක.

## කුඩා ව්‍යවසායී මූල්‍යකරණ හා ඉතිරි කිරීම් ව්‍යාපෘති

### කුඩා ව්‍යවසායී ණය දීම් මගින් ස්වයං රැකියා දිරි ගැන්වීම (සුරතුර ව්‍යාපෘතිය)

රැකියා විරහිත තරුණ තරුණියන් හට කුඩා පරිමාණයේ ණය මුදල් ලබා දීම අරමුණු කොටගත් සුරතුර දෙවන අදියර, ලංකා බැංකුව, මහජන බැංකුව හා සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යන සහභාගිත්ව වන ණය දෙන

**10.11 සංඛ්‍යා සටහන**

**සුරතුර ව්‍යාපෘතිය - 1998 අවසානයට ප්‍රගතිය**

| බැංකුව | පළමු අදියර | | | දෙවන අදියර | | |
|---|---|---|---|---|---|---|
| | ණය සංඛ්‍යාව | වටිනාකම (රුපියල් දශලක්ෂ) | අයකර ගැනීමේ අනුපාතිතය % (අ) | ණය සංඛ්‍යාව | වටිනාකම (රුපියල් දශලක්ෂ) | අයකර ගැනීමේ අනුපාතිතය % (අ) |
| ලංකා බැංකුව | 3,740 | 150 | 69 | 5,050 | 221 | 65 |
| මහජන බැංකුව | 4,042 | 150 | 59 | 9,759 | 341 | 67 |
| හැටන් නැෂනල් බැංකුව | 1,257 | 50 | 89 | 307 | 13 | 45 |
| එකතුව | **9,039** | **350** | - | **15,116** | **575** | - |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1998.06.30 දිනට තත්ත්වය.

ආයතනවල අරමුදල් දයකත්වය සහිතව 1998 වර්ෂය තුළදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙය, රජයේ ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ඉහත බැංකු තුනෙහි සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරන ලද සුරතුර පළමුවැනි අදියර තවදුරටත් ව්‍යාප්ත කිරීමකි. සුරතුර දෙවන අදියර යටතේද, සියයට 10 ක වාර්ෂික ණය පොලී අනුපාතිකයක් පවත්වාගෙන යාමට හැකි වනු පිණිස, සහභාගී වන බැංකු විසින් ප්‍රදානය කරන ලද ආපසු අය වන ක්‍රියාකාරී ණය වෙනුවෙන් ප්‍රතිශතාංක 10 ක පොලී සහනාධාරයක් රජය විසින් ගෙවන ලදී. 1998 අවසානයේදී සුරතුර ව්‍යාපෘතිය ලබා ඇති ප්‍රගතිය පහතින් දක්වේ.

## සමෘද්ධි සංවර්ධන ණය යෝජනා ක්‍රමය

සමෘද්ධි ව්‍යාපාරයේ අනු කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරී පනත යටතේ ප්‍රතිෂ්ඨාපනය කරන ලද, සමෘද්ධි බැංකු සංගම්, ස්වයං උපකාරක කණ්ඩායම් වශයෙන් සංවිධානය වූ සමෘද්ධි සාමාජිකයන්ගේ ඉතිරි කිරීම් රාශීකරණය කිරීම හා ආදයම් උත්පාදන කාර්යයන් සඳහා ණය සැපයීම කෙරේ තවදුරටත් යොමු වූහ. 1998 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 263 ක් වටිනා සමෘද්ධි බැංකු සංගම් වල කොටස් 639,106 ක් සාමාජිකයන් වෙත නිකුත් කර තිබුණි. එම දිනට, නිකුත් කරනු ලැබූ කොටස් වල වටිනාකමද ඇතුළත්ව සමෘද්ධි බැංකු සංගම්වල මුළු තැන්පතු රුපියල් දශ ලක්ෂ 458 ක් විය. ණය මුදා හැරීම සම්බන්ධයෙන් ගත් කල, කෘෂිකර්මය, කුඩා ව්‍යාපාර, ධීවර, පාරිභෝජන හා සුළු වශයෙන් දෙන ලද හදිසි ආපද සහන ණය යනාදී කුඩා ව්‍යවසායී ණය 68,474 ක් වෙනුවෙන් නිදහස් කරන ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 238 කි. මෙයින් පිළිබිඹු වන්නේ ප්‍රදානය කරන ලද ණය පහසුකම්වල සාමාන්‍ය අගය රුපියල් 3,471 වැනි කුඩා මුදල් ප්‍රමාණයක් බවයි. තවද, සමෘද්ධි බැංකු සංගම් විසින් පවත්වාගෙන යනු ලබන සමස්ත ණය ආපසු අය කර ගැනීමේ අනුපාතිකය සියයට 96 ක් පමණ බව වාර්තා වී ඇත. මෙයට අමතරව විමර්ශනයට භාජනය වන වසර තුළදී සමෘද්ධි සංවර්ධන ණය යෝජනා ක්‍රමය (සසණ) සහ සමෘද්ධි සුළු ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (සවණ) යටතේද රාජ්‍ය බැංකු දෙකෙහි අනුග්‍රහය සහිතව ණය මුදා හරින ලදී. මෙම යෝජනා ක්‍රම දෙක යටතේ ණය 82,725 වෙනුවෙන් මුදා හරින ලද ණය මුදල්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 589 කි. 1998 අවසානය වනවිට සසණ හා සවණ ණය යෝජනා ක්‍රමයන්හි ණය ආපසු අය කර ගැනීමේ අනුපාතිකයන් පිළිවෙලින් සියයට 66 ක් හා සියයට 98 ක් විය.

සමෘද්ධි ව්‍යාපාරය යටතේ, සමෘද්ධි නියාමකවරුන් සහ සමෘද්ධිලාභීන් වෙනුවෙන් තවත් ණය යෝජනා ක්‍රම දෙකක් 1998 වසර තුළදී ක්‍රියාත්මක කරන ලදී. එයින් පළමුවැන්න සමෘද්ධි නියාමකවරුන්ගේ සහ සමෘද්ධිලාභීන්ගේ හදිසි සහ සුළු ණය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා චක්‍රීය අරමුදලක් වශයෙන් ක්‍රියාත්මක වේ. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 1998 වසර අවසාන වනවිට ණය 94,917 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 78 ක් මුදා හැර තිබුණි. දෙවැනි ණය යෝජනා ක්‍රමය, සමෘද්ධිලාභීන් හා නියාමකයන්හට වතුර පොම්ප, ත්‍රීරෝද රථ හා රෝද දෙකේ ට්‍රැක්ටර් වැනි උපකරණ සහ වාහන විශේෂ කල්බදු පහසුකමක් යටතේ ලබා දීම සඳහා විය. 1998 වසර අවසානයේදී මේ යටතේ ලබා දුන් ණය සංඛ්‍යාව 508 වූ අතර, ඒ වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 122 ක මුදලක් මුදා හැර ඇත. මෙයට අමතරව, 1998 අවසානයේදී 897,803 ක් වූ සමෘද්ධිලාභීන්ගේ, අනිවාර්ය ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,818 ක් වූ අතර එයින් රුපියල් දශ ලක්ෂ 2,909 ක් රාජ්‍ය බැංකු දෙකෙහි විශේෂ ඉතිරි කිරීම් ගිණුම්වල තැන්පත් කර තිබුණි. මෙය 1997 වසර අවසානයේදී පැවැති ඉතිරි කිරීම් ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 1,094 ට වඩා සියයට 40 ක වර්ධනයක් පෙන්නුම් කරයි. තවද, නිරීක්ෂණයට භාජනය වන වර්ෂය තුළදී සිය ආර්ථික තත්ත්වයන්හි වර්ධනයන් හේතුකොටගෙන සමෘද්ධි ප්‍රතිලාභ ලැබීමේ අවම ආදයම් සීමාවන් ඉක්මවන ලද බැවින් සමෘද්ධි සහන ක්‍රමයෙන් ඉවත් වූ සමෘද්ධිලාභීන්ගේ සංඛ්‍යාව 20,233 ක් විය.

## ගැමි පුබුදුව යෝජනා ක්‍රමය

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් හඳුන්වා දෙන ලද නව ආරක සම්බන්ධීකාරක බැංකු විධි ක්‍රමය වන ගැමි පුබුදුව යෝජනා ක්‍රමය 1998 දී සිය නව වැනි වසර සම්පූර්ණ කළේය. 1998 වසර අවසානය වනවිට මෙම යෝජනා ක්‍රමය යටතේ කුඩා සහ සුළු ව්‍යාපෘති 27,500 ක් මූල්‍යකරණය කිරීම පිණිස රුපියල් දශ ලක්ෂ 876 ක් මුදා හැර තිබුණි. මෙම ණය වලින් වැඩි කොටසක් අදාළ ණයලාභීන් විසින් නියමිත පරිදි ආපසු ගෙවන ලද බැවින්, 1998 වසර අවසානයේදී මුදා හරින ලද ණයවල නොපියවා පැවති ශේෂය වූයේ ව්‍යාපෘති 10,900 ක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද රුපියල් දශ ලක්ෂ 277 ක් පමණකි. මෙම යෝජනා ක්‍රමය, ණය මුදා හැරීමේ සහ ආපසු අය කර ගැනීමේ නියැලුණු ක්ෂේත්‍ර නිලධාරීන් 114 දෙනෙකුගෙන් සමන්විත වූ ණය මුදා හැරීමේ ඒකක 99 ක් මගින් ක්‍රියාත්මක වේ. ගැමි පුබුදුව ණය යෝජනා ක්‍රමය සියයට 97.2 ක ණය ආපසු අය කර ගැනීමේ ප්‍රතිශතයක් අඛණ්ඩව පවත්වාගෙන යන අතර, එය වැඩි අවදනම් සහිත සුළු ව්‍යවසායී මූල්‍යකරණ ව්‍යාපෘති සම්බන්ධයෙන් ගත් කල ඉතා සතුටුදයක මට්ටමකි. ගැමි පුබුදුව ණය යෝජනා ක්‍රමය තවදුරටත් ව්‍යාප්ත කිරීමක් වශයෙන්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් පාසැල් හැර ගිය උගත් තරුණ තරුණියන් හට සහ විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයන් හට ස්වයං රැකියා සඳහා මූල්‍ය පහසුකම් සැලසීමේ වැඩපිළිවෙලක්ද දියත් කර ඇත.

## සකසුරුවම් සහ සමුපකාර ණය දෙන සමිති (සණස) ණය යෝජනා ක්‍රම

1998 වසර තුළදී සණස සංවර්ධන හා ඉතිරි කිරීමේ බැංකුව සහ සණස දිස්ත්‍රික් හා ප්‍රාථමික සමිති මගින් සණස ණය ක්‍රම ක්‍රියාත්මක කරන ලදී. සමුපකාර හා සංවර්ධනය අරමුණු කොටගත් මූල්‍ය සේවා සැපයීම තුළින්

විශේෂ සටහන 12

## ඉසුරු ව්‍යාපෘතිය : සුළු ණය සහ උපකාරක සේවා ලබාදීම තුළින් දිළිඳුකම පිටුදැකීම සඳහා කළ නව අත්හද බැලීමක්

දිළිඳුකම දක්වෙන පිරමිඩයෙහි පහළම ස්ථරය නියෝජනය කරන දුගී දුප්පතුන් බැංකු කටයුතු පිළිබඳවද, ණය පහසුකම් ලබා ගැනීම සහ ආපසු ගෙවීම පිළිබඳවද, ප්‍රමාණවත් පළපුරුද්දක් නොලබා ඇති බවට විධිමත් වූ බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ පවත්නා විශ්වාසය නිසා ඔවුන් සිය මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සාම්ප්‍රදයික, අවිධිමත් වූ පුද්ගලික අංශ කෙරෙහි යොමු වී ඇත. එමෙන්ම ණය ලබා ගැනීමේදී සහ ණය කළමනාකරණයේදී මෙම දිළිඳු ජනතාව තුළ දක්නට නොලැබෙන මූල්‍ය විනයද, ණය ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ඇප සුරැකුම් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමද, සුළු ණය කළමනාකරණයේදී බැංකු ආයතනවලට දැරීමට සිදුවන ඉහළ ණය පරිපාලන වියදම ද විධිමත් බැංකු ක්ෂේත්‍රය දුගී දුප්පත් ජනතාව සිය ණය ක්‍රම වලින් ඉවත් කිරීමට මූලික සාධක ලෙස ඉදිරිපත් කර ඇත.

හැත්තෑව දශකයේ අග භාගය වනවිට ජාත්‍යන්තර ණය දෙන ආයතනවල මූලික අවධානය යොමු වූයේ පහළම ස්ථරයේ සිටින මෙම දුගී දුප්පතුන්ගේ දිළිඳුකම පිටුදැකීම සඳහා විධිමත් මූල්‍ය ආයතන හා බැංකු මගින් අත්‍යවශ්‍ය ණය පහසුකම් ලබා දියහැකි ක්‍රමයක් හඳුන්වා දීමටයි. මෙම කාර්යභාරයේදී කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර අරමුදල (IFAD) සහ ආසියා පැසිපික් ග්‍රාමීය සහ කෘෂිකර්ම ණය සංගමය (APRACA) පුරෝගාමී මෙහෙවරක් ඉටු කළහ. මෙම වකවානුව වනවිට බංග්ලාදේශ ග්‍රාමීය බැංකුවේ ප්‍රධානියා වන මහාචාර්ය මොහොමඩ් යුනුස් මෙම සමාජ ගැටළුව විසඳීම සඳහා සාර්ථක විසඳුම් ඉදිරිපත් කර තිබුණි. මෙම සියළු විසඳුම් පදනම් වී තිබුණේ දිළිඳු ජනතාවට ණය පහසුකම් සැපයීමට පමණක් සීමා නොවී අනෙකුත් උපකාරක සේවා සියල්ලද සැපයිය යුතුය යන සංකල්පය (Credit Plus Approach) මතය.

1980 පසු භාගය වනවිට කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර අරමුදල, කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (CIDA), ශ්‍රී ලංකා රජය හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ඒකාබද්ධ අනුග්‍රහයෙන් සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය පදනම් කරගනිමින් දිළිඳු ජනතාව කුඩා කණ්ඩායම් ලෙස ඒකරාශීකර ග්‍රාමීය සංවර්ධන ප්‍රයත්නයට නැඹුරු කර ගැනීම සහ ඔවුන්ගේ ආදයම් වර්ධනය කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස 'සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය' හෙවත් 'ඉසුරු ව්‍යාපෘතිය' හඳුන්වා දෙන ලදී. මේ සඳහා ගාල්ල, මාතර, පුත්තලම සහ මහනුවර දිස්ත්‍රික්ක තෝරාගන්නා ලදී. පුත්තලම සහ මහනුවර දිස්ත්‍රික්ක සඳහා කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර අරමුදලේද (IFAD) ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක සඳහා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනයේද (CIDA) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේද මූල්‍ය දයකත්වය ලැබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර අරමුදල අතර 1988 දී ණය ගිවිසුමක් අත්සන් කෙරිණ. ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව මගින් ඉටු කළේය. විශේෂයෙන්ම මෙවැනි දිළිඳුකම තුරන් කිරීමේ ව්‍යාපෘතියක අවශ්‍යතාවය පැන නැගුණේ 1977 දී හඳුන්වා දුන් වෙළඳපොළ ආර්ථික ක්‍රමය හා සාර්ථක ලෙස අනුගත වීමට අසමත් වීම නිසා ග්‍රාමීය ප්‍රදේශ වල ඇතැම් ජන කොටස් වලට ආර්ථික හා සාමාජික තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට අපහසුතාවක් පැන නැගී තිබුණු බැවිනි. මෙම තත්ත්වය මග හරිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා ඔවුන්ට නායකත්වය ලබාදීමත්, ණය පහසුකම් හා උපකාරක සේවා ලබා දීමත් අත්‍යවශ්‍ය සාධකයක් ලෙස ව්‍යාපෘතියෙහි සියළුම සම්බන්ධිත ආයතන පිළිගත් අතර, ඒ සඳහා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ අවශ්‍ය සියළුම පහසුකම් හා අවස්ථා තිබෙන බව පිළිගන්නා ලදී. එබැවින් සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය මත සුළු ණය හා උපකාරක සේවා ලබා දීමෙන් දිළිඳු ජනතාවගේ ආර්ථික හා සමාජීය තත්ත්වය දියුණු කිරීම පිළිබඳව ඒ වනවිට කලාපයේ අනෙකුත් රටවල් ලබා තිබූ ප්‍රතිඵල ශ්‍රී ලංකාව තුළ අත්හද බැලීමේ දැඩි අවශ්‍යතාවය මෙම ව්‍යාපෘතිය පිළිගෙන තිබුණි.

මෙම අභිප්‍රායයන් ඉටුකර ගැනීම සඳහා ඉලක්කගත ප්‍රතිලාභීන් ස්වඋපකාරක කණ්ඩායම් ලෙස ගොනු කිරීමටත්, ඔවුන්ගේ ධෛර්‍ය සහ අපේක්ෂාවන් වර්ධනය කිරීම සඳහා විපර්ය කාරක සේවාවන් හඳුන්වා දෙන ලදී. මේ තුළින් කණ්ඩායම්ගත කළ ප්‍රතිලාභීන් සඳහා සමාජ සජීවීකරණ වැඩසටහන් පවත්වමින්, දිළිඳුකම සහ දිළිඳුකම ඇතිවීමට හේතු, දුගී බවේ විෂම චක්‍රයෙන් මිදීමට ගතයුතු ක්‍රියාමාර්ග, තනි පුද්ගලයෙකු ලෙස කටයුතු කිරීමට වඩා කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේදී ජනිත වන්නාවූ කණ්ඩායම් ශක්තිය සහ බලය, අරපිරිමැස්ම සහ ඉතිරි කිරීම් නැඹියා වර්ධනය, මූල්‍ය විනය, කණ්ඩායම් පොදු සේවා කටයුතු, වෘත්තීය කුසලතා වර්ධනය, නායකත්ව ගුණාංග වර්ධනය, ව්‍යවසායකත්ව සංවර්ධනය,

**විශේෂ සටහන - 11 (සම්බන්ධයි)**

පොත් තැබීම සහ මූලික ගිණුම්කරණය, නෛතික පරිසරය සහ වෙළෙඳපොළ චර්යාවන් පිළිබඳව ප්‍රතිලාභීන්ගේ දැනුම සහ අවබෝධය පුළුල් කිරීමට විධි-විධාන යොදන ලදී. මෙම ස්වඋපකාරක කණ්ඩායම්වල සාමාජිකයන්ගේ අන්‍යෝන්‍ය ඇප සුරැකුම් මත ණය ලබාදීමට පියවර ගැනීම නිසා දිළිඳු ජනතාවට ණය ගැනීමට බාධාවක්ව පැවති ඇප සුරැකුම් ගැටළුව ඉවත් වූ අතර බැංකුවලට ණය පවත්වා ගෙන යෑමේ පිරිවැය ද අවම කරගත හැකිවිය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිපාලන ව්‍යුහය සකස් වූයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය ණය අධ්‍යක්ෂවරයා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කිරීමෙන් සහ දිස්ත්‍රික්ක හතරෙහි කටයුතු මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවට අනුබද්ධිතව මධ්‍යම ව්‍යාපෘති කාර්යාලයක් පිහිටුවීමත්,. දිස්ත්‍රික්ක හතරෙහි දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාල 04 ක් පිහිටුවීමෙනුත්ය. 1989 වසරේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 1997 වසර දක්වා අඛණ්ඩව පවත්වාගෙන යන ලදි. ව්‍යාපෘතියේ මූල්‍ය සැලැස්මට අනුව මුළු වියදම එ.ජ.ඩොලර් දශලක්ෂ 17.9 ක් වේතැයි අපේක්ෂිත විය. මේ සඳහා, ඉෆාඩ් ආයතනය සහනශීලී ණයක් ලෙස එ.ජ.ඩොලර් දශලක්ෂ 6.7 ක් ද, කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය ප්‍රදානයක් ලෙස එ.ජ.ඩොලර් දශලක්ෂ 6.6 ක් ද, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ.ඩොලර් දශලක්ෂ 4.1 ක් ද, ප්‍රතිලාභීන්ගේ හිමිකම් සහ ඉතිරි කිරීම් දායකත්වය එ.ජ.ඩොලර් දශලක්ෂ 0.5 ක් ද සැපයීමට නියමිත විය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සමාජ සජීවීකරණය සහ සුළු පරිමාණ ණයදීම් කටයුතු සඳහා සහාය වීම සඳහා සහභාගී නියෝජිතායතන වශයෙන් රාජ්‍ය නොවන සංවිධාන විශාල ගණනක් ඇතුලත් කර ගන්නා ලදී. රාජ්‍ය නොවන සංවිධාන මෙම කටයුත්ත සඳහා සහභාගි කර ගැනීමට හේතු වූයේ ඔවුන්ගේ අවම පරිපාලන වියදම්, ණයදීම් සහ ග්‍රාමීය සංවර්ධන කටයුතු පිළිබඳ පළපුරුද්ද, සාර්ථක සමාජ සජීවිකාරකයන් වශයෙන් කලක් තිස්සේ ලබා ඇති පළපුරුද්ද සහ පිවිසුම් ස්ථානයන්හි ඵලදායී විපර්ය කාරකයන් ලෙස ක්‍රියා කිරීමේදී යොදා ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ත වූ ජාලයක් ඔවුන් සතුව පැවතීමයි. මෙම රාජ්‍ය නොවන සංවිධාන අතර ජාතික මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන ලෙස පිළිගන්නා සණස, සර්වෝදය, කාන්තා කාර්යාංශය, ලංකා මහිලා සමිති මෙන්ම ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන ලෙස ගැමි සේවා සෙවන, පොල් ත්‍රිකෝණයේ කිරි නිපදවන්නන්ගේ සංගමය වැනි සංවිධාන ප්‍රධාන වශයෙන් මෙම ව්‍යාපෘති කටයුතුවලට සම්බන්ධ විය. ව්‍යාපෘතියේ මූල්‍ය කටයුතු මෙහෙයවීම පිළිබඳව වගකීම් දරන ලද්දේ අදාළ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසිනි.

ව්‍යාපෘතියේ ඉලක්කගත කණ්ඩායම තෝරාගන්නා ලද්දේ මූලික ආහාර අවශ්‍යතා සඳහා වැයවන පවුලේ ආදායම් තත්ත්වය පදනම් කර ගැනීමෙනි. මේ අනුව, පස් දෙනෙකුගෙන් යුත් පවුලක එක් සාමාජිකයකුගේ වාර්ෂික ආදායම රු.3,360 කට වඩා අඩු නම් එම පවුල මෙම ව්‍යාපෘතියේ පහසුකම් ලැබීමට සුදුසුකම් ලැබූ අතර, ඔවුන් දුගී දුප්පතුන් ලෙස හඳුනාගන්නා ලදී. එමෙන්ම දිනකට එක් පුද්ගලයෙකුට අවශ්‍ය කැලරි ප්‍රමාණය වූ 2,200 ලබා ගැනීම සඳහා අවශ්‍ය යයි සැළකුණේ මෙම ආදායම් මට්ටමයි. මෙම ආදායම් සීමාව ව්‍යාපෘති කාල-සීමාව තුළ වරින් වර වෙනස් කළ අතර, 1997 අවසන් වනවිට ව්‍යාපෘතියේ පහසුකම් ලැබීමට සුදුසු යයි සැළකුණ වාර්ෂික ඒක පුද්ගල ආදායම වූයේ රු.7,200 කි.

**1 සංඛ්‍යා සටහන**

**ඉසුරු ව්‍යාපෘතිය**

**1989-97 ප්‍රගතිය**

| විස්තරය | මහනුවර | පුත්තලම | ගාල්ල | මාතර | එකතුව |
|---|---|---|---|---|---|
| සමීක්ෂණය කළ ගම් සංඛ්‍යාව | 851 | 352 | 662 | 447 | 2,312 |
| ගොඩ නැගූ කණ්ඩායම් සංඛ්‍යාව | 3,327 | 2,253 | 1,537 | 1,605 | 5,580 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 19,895 | 12,668 | 9,953 | 10,477 | 52,993 |
| කාන්තා ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 11,702 | 8,740 | 7,448 | 7,821 | 35,711 |
| කණ්ඩායම් ඉතිරි කිරීම් (රු.ද.ල.) | 20.7 | 14.1 | 11.0 | 15.6 | 61.4 |
| මුළු ණය ප්‍රමාණය (රු.ද.ල.) | 144.0 | 120.0 | 59.3 | 92.2 | 415.6 |
| ණය මුදලක සාමාන්‍යය (රු.) | 8,785 | 10,039 | 7,591 | 10,392 | 9,228 |
| ආපසු අයවීමේ සමුච්චිත අනුපාතිකය | 96.4% | 96.2% | 85.4% | 92.6% | 94.0% |

මූලාශ්‍රය : ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන - 11 (සම්බන්ධයි)**

ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව විදේශීය ආධාර කණ්ඩායම් විසින් වරින් වර කළ නිරීක්ෂණ හා ඇගැයීම්වලට අනුව මෙම ව්‍යාපෘතියේ කටයුතු අතිශයින් සාර්ථක බවත් ඔවුන්ගේ පිළිගැනීම විය.

1998 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ප්‍රගතිය පලමුවන සංඛ්‍යා සටහන මගින් දැක්වේ.

ව්‍යාපෘතියට ආධාර කළ විදේශීය ආධාර කණ්ඩායම සිය අරමුදල් ලබාදීම 1997 දී අවසන් කළද, ණය ගිවිසුමේ ප්‍රකාරව චක්‍රීය අරමුදල භාවිතා කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. මේ යටතේ 1998 වසර තුළදී ප්‍රතිලාභීන්ගේ තිර පැවැත්ම තහවුරු කිරීම සඳහා එතෙක් පැවති සුළු පරිමානයේ ස්වයං උපකාරී කණ්ඩායම් පවත්වා ගෙන යාහැකි ඒකකයන් ලෙස එකතු කරන ලදි. මෙහි සුවිශේෂ ලක්‍ෂණය වූයේ කණ්ඩායම් එක්රොක් කළද, කණ්ඩායම් ක්‍රමය අඛණ්ඩව ආරක්‍ෂා කර ගැනීමයි. මෙලෙස කණ්ඩායම් ඒකරාශී කරමින් පිහිට වූ මධ්‍යස්ථාන විධිමත් සංවිධාන ලෙස සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත සමිති ආඥා පනත යටතේ සීමිත වගකීම් සහිත ඉසුරු සංවර්ධන සමිති ලෙස ලියාපදිංචි කරන ලදී. ඒ අනුව සිය සාමාජිකයන්ට කොටස් නිකුත් කිරීමෙන්, සාමාජිකයන්ගේ ඉතිරි කිරීම් තැන්පතු භාර ගනිමින් අරමුදල් සම්පාදනය කර ගැනීමටත්, ඒ තුළින් සිය සාමාජිකයන්ට අභ්‍යන්තර ණය මුදල් ලබාදීමේ වැඩපිළිවෙලක් ආරම්භ කිරීමට ද හැකිවිය. එමෙන්ම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මගින් සංවර්ධන සමිතිවලට තොග ණය මුදල් ලබා ගැනීමටත්, පොදු ව්‍යවසායන් ආරම්භ කිරීමටත් හැකිවිය. 1998 වසර අවසාන වනවිට ව්‍යාපෘතිය මගින් ගොඩ නැගූ ඉසුරු සංවර්ධන සමිතිවල ප්‍රගතිය දෙවන සංඛ්‍යා සටහන මගින් පහත දැක්වේ.

සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය සිය පරමාර්ථ ඉටුකර ගැනීමේදී දක් වූ සාර්ථකත්වය විදේශීය ආධාර කණ්ඩායම්වල පැසසුමට ලක් වූ අතර, මෙයින් ලැබූ අත්දැකීම් සහ ප්‍රතිඵල දිවයිනේ වෙනත් දිස්ත්‍රික්කවලටත් ලබා දීමට යෝජනා කරමින් කලාපයේ අනෙක් රටවලටද නිර්දේශ කරන ලදී. ඒ අනුව ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල (OECF) මෙම ව්‍යාපෘතියේ කටයුතු ශ්‍රී ලංකාවේ තවත් දිස්ත්‍රික්ක 6 ක් වන කළුතර, කුරුණෑගල, මාතලේ, නුවරඑළිය, බදුල්ල සහ හම්බන්තොට ආරම්භ කිරීමට අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීමට ශ්‍රී ලංකා රජය සමග එකඟතාවයකට පැමිණ සිටී.

**2 සංඛ්‍යා සටහන**

**1998 අග දක්වා ඉසුරු සංවර්ධන සමිති පිහිටුවීමේ ප්‍රගතිය**

| විස්තරය | මහනුවර | පුත්තලම | ගාල්ල | මාතර | එකතුව |
|---|---|---|---|---|---|
| ඉසුරු සංවර්ධන සමිති සංඛ්‍යාව | 24 | 43 | 47 | 54 | 168 |
| සාමාජික සංඛ්‍යාව | 867 | 1,535 | 2,043 | 1,729 | 6,174 |
| කොටස් මුදල් ප්‍රමාණය (රු.දහස්) | 288.3 | 786.0 | 884.2 | 911.8 | 2,870.3 |
| අනිවාර්ය ඉතුරුම් (රු.දහස්) | 46.4 | 224.0 | 561.0 | 544.0 | 1,375.4 |
| ස්වේච්ඡා ඉතුරුම් (රු.දහස්) | 199.9 | 392.9 | - | 385.2 | 978.0 |
| ණය සංඛ්‍යාව | 1,115 | 2,897 | 5,761 | 3,397 | 13,170 |
| ණය ප්‍රමාණය (රු.දහස්) | 1,190.1 | 1,293 | 1,690 | 1,854 | 6,027 |

මූලාශ්‍රය : ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පහල ආදයම් ලබන කණ්ඩායම්වල ආදයම් තත්ත්වය ඉහළ නැංවීමේ ඉදිරි දක්මක් සහිතව සණස සංවර්ධන බැංකුව 1997 අගෝස්තු මසදී පිහිටුවනු ලැබීය. සණස බැංකුව, සණස දිස්ත්‍රික් සංගමය සහ ප්‍රාථමික සමිති හරහා සිය ණයලාභීන් හට ණය පහසුකම් සපයනු ලැබේ.

ඒ අනුව, 1998 වසර තුළදී සණස බැංකුව විසින් විශේෂිත ණයලාභී කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් දිවයිනේ තෝරා ගත් ප්‍රදේශයන්හි විවිධ ණය ක්‍රම ක්‍රියාත්මක කරනු ලැබීය. 1998 වසර අවසානය වනවිට මෙවැනි සුළු ව්‍යවසායී ණය ක්‍රම තුළින් සුළු ණය 1,516 ක් වෙනුවෙන් රුපියල් දශ ලක්‍ෂ 21 ක ණය අරමුදල් මුදා හැර ඇත.

සකසුරුවම් හා සමුපකාර ණය දෙන සමිති සම්බන්ධයෙන් ගත් කල, 1998 වසර අවසානයට ඒකරාශී කරන ලද ඉතිරි කිරීම් ප්‍රමාණය සහ මුදා හරින ලද ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්‍ෂ 3,505 ක් හා රුපියල් දශ ලක්‍ෂ 1,868 ක් වේ.

### ජනශක්ති බැංකු සංගම් - හම්බන්තොට

හම්බන්තොට ප්‍රදේශයේ ජීවත් වන දිළිඳු කාන්තාවන් අතර සමාජමය හා ආර්ථික වශයෙන් ස්වශක්තිය වර්ධනය කිරීම දිරිමත් කිරීමේ අරමුණින් යුතුව අවිධිමත් ඉතිරි කිරීම් හා ණය සමිති විශේෂයක් වන ජනශක්ති බැංකු සංගම්, 1989 දී හම්බන්තොට කාන්තා සංවර්ධන සම්මේලනය විසින් පිහිටුවන ලදී. ඉලක්ක කණ්ඩායම වෙනුවෙන් සෞඛ්‍යය, පෝෂණය සහ සකසුරුවම් හා ඵලදායී ආර්ථික කටයුතු සඳහා වූ දැනුවත් කිරීමේ ක්‍රමික වැඩසටහන් කාන්තා සංවර්ධන සම්මේලනය විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. 1998 වර්ෂය තුළදී ගම්මාන 463 ක් පුරා විසිරුණු ජනශක්ති බැංකු සංගම් 67 හි නව සාමාජිකාවන් 807 දෙනෙකු ලියාපදිංචි වූ අතර, ඒ අනුව වර්ෂය අවසාන වනවිට සිටි මුළු සාමාජික සංඛ්‍යාව 26,807 දක්වා වැඩි විය. මෙම සාමාජිකයින් විසින් 1998 වර්ෂය තුළදී රාශිකරණය කරන ලද සමස්ත ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 43 කි. කෘෂිකාර්මික කටයුතු, සත්ව පාලන, ධීවර, සුළු වෙළෙඳාම් සහ නිවාස තැනීමේ කටයුතු සඳහා සාමාජිකයින් වෙත ලබා දී ඇති ණය මුදල් වලින්, 1998 වර්ෂය අවසාන වනවිට නොපියවා පැවති ශේෂය රුපියල් දශ ලක්ෂ 58 ක් වූ අතර, එම වර්ෂය තුළදී සියයට 95 ක ණය ආපසු අය වීමේ ප්‍රතිශතයක් පවත්වාගෙන යාමටද ජනශක්ති බැංකු සංගමය සමත් වී ඇත.

### සර්වෝදය ආර්ථික ව්‍යවසායකත්ව සංවර්ධන සේවාව (සීඩ්ස්)

සර්වෝදය ව්‍යාපාරයේ ශාඛාවක් වශයෙන් පැවති සර්වෝදය ආර්ථික ව්‍යවසායකත්ව සංවර්ධන සේවාව විසින් සුළු පරිමාණ ණයලාභීන් වෙත සේවා සැපයීමේ අරමුණෙන් සීමිත වගකීම් සහිත සමාගමක් ලෙස 1998 වර්ෂයේදී සිය සේවා කටයුතු ආරම්භ කරන ලදී. එම නව සමාගමේ ප්‍රතිපත්ති ප්‍රකාශනය දැනට සකස් කරමින් පවතින අතර, ඉලක්ක කණ්ඩායම් වෙත සේවා රැසක් සපයනු වස්, තැන්පතු රැස් කිරීම සහ ණය සේවා සැපයීම යනාදිය ද ආවරණය වන පරිදි පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් අරඹා ඇත. නව සමාගම විදේශ අරමුදල් සම්පාදිත ණය යෝජනා ක්‍රම කිහිපයකම රාජ්‍ය නොවන සහභාගිත්ව ණය දෙන සංවිධානයක් වශයෙන් ද ක්‍රියා කරයි. මෙම සමාගම විසින් විශේෂයෙන් ග්‍රාමීය දිළිඳු ජනතාව ඉලක්ක කර ගනිමින් "සෞභාග්‍යා", "සෙලෝ", "සිරිකත" හා "සිතුම් පැතුම්" යන නම් වලින් එයටම විශේෂිත වූ ණය යෝජනා ක්‍රම කිහිපයක්ද හඳුන්වා දී ඇත. 1998 වර්ෂය අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 1,352 ක මුදලක් ණයලාභීන් 99,741 ක් වෙත මුද හැර ඇති අතර, සියයට 90 ක ණය ආපසු අය වීමේ ප්‍රතිශතයක් ද පවත්වාගෙන යයි.

### තේ ශක්ති ව්‍යාපාරය

කුඩා තේ වතු හිමියන්ගේ සමිතිවල අරමුදල් තත්ත්වය වර්ධනය කිරීමේ සහ ඔවුන් සංවිධානය කිරීම තුළින් ස්වශක්තියෙන් නැගී සිටිය හැකි තිරසාර ව්‍යවසායකයින් පිරිසක් බවට පත් කිරීමේ ඉදිරි දැක්මක් සහිතව 1997 වර්ෂයේ පෙබරවාරි මසදී හඳුන්වා දෙන ලද තේ ශක්ති ව්‍යාපාරය 1998 වර්ෂය තුළදීද සිය සේවා කටයුතු තවදුරටත් ව්‍යාප්ත කළේය. 1998 වසර අවසානය වනවිට මෙම ව්‍යාපාරය සිය සාමාජිකයන්ගෙන් රැස් කරන ලද ඉතිරි කිරීම් සහ ඒවා ආයෝජනයෙන් උපයා ගත් පොලී ප්‍රමාණය ද ඇතුළුව රුපියල් දශ ලක්ෂ 82 ක අරමුදලක් ගොඩ නගාගෙන ඇත. තැන්පතු රැස් කිරීම් වලින් ලද අරමුදල්, කුඩා තේ වතු හිමියන්ගේ සමිති සඳහා අවශ්‍ය රථවාහන මිළදී ගැනීම සඳහා සහ වෙනත් ආයෝජන කටයුතු වෙනුවෙන් ද යොදවන ලදී. එයට අමතරව තේ ශක්ති ව්‍යාපාරය විසින් 1998 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද විශේෂ රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සිය සාමාජිකයන් 205 දෙනෙකු වෙනුවෙන් ස්වභාවික හා හදිසි අනතුරු මරණ, පූර්ණ බෙලහීනතාවය හා හදවත් සැත්කම් යනාදිය ආවරණය වන සේ රුපියල් දශ ලක්ෂ 6.3 ක වන්දි මුදලක් ගෙවා ඇත.

## 10.9 අනෙකුත් මූල්‍ය ආයතන

### ඉතිරිකිරීමේ ආයතන

ජාතික ඉතිරිකිරීමේ බැංකුව (ජා.ඉ.බැ.) වර්ෂය තුළදී එහි කටයුතු තවදුරටත් ශක්තිමත් කරලීය. ජා.ඉ.බැ.හි මුළු සම්පත්, ආසන්න වශයෙන් සියයට 9 කින් වැඩි වූ අතර තැන්පතු වර්ධනය වීම මීට ප්‍රධාන හේතුව විය. නව ඉතිරිකිරීමේ ක්‍රම කිහිපයක් හඳුන්වා දීම සහ පුළුල් ප්‍රචාරණ ව්‍යාපාරයත් තැන්පතු රාශීකරණය කිරීමෙහිලා උපකාර විය. වෙනත් ආයතනවල තැන්පතු පොලී අනුපාතික කෙරෙහි සැලකියයුතු බලපෑමක් කරනු ලබන ජා.ඉ.බැ. මගින් ගෙවන ලද පොලී අනුපාතික වර්ෂයේ පළමු භාගය තුළදී අඩු වුවද දෙවන භාගය තුලදී ඉහළ ගියේය. වෙළෙඳපොළ පදනම් වූ උපකරණ වල ආයෝජන වැඩිවීමත් සමඟ ආයෝජන ව්‍යුහයේ විවිධාංගීකරණය දිගටම සිදුවිය. ළමුන් සඳහා නව ඉතිරිකිරීමේ ක්‍රමයක් වූ 'පුංචි හපන්' සහ 'හපන්' ගිණුම් ක්‍රම මෙම වර්ෂය තුළදී හඳුන්වාදෙන ලදී. ඉතිරිකිරීමේ තැන්පතු සියයට 16 කින් ද, ස්ථාවර තැන්පතු සියයට 4 කින් ද ඉහළ ගිය අතර ජාතික ඉතිරිකිරීමේ සහතිකපත්, ඉතිරිකිරීමේ සහතිකපත්, ඉතිරිකිරීමේ බැඳුම්කර සහ ජා.ඉ.බැ. විශ්‍රාම වැටුප් ක්‍රමය ඇතුලත් අනෙකුත් තැන්පතු සියයට 23 කින් ඉහළ ගියේය. වාණිජ බැංකුවල ඉතිරි කිරීමේ හා ස්ථාවර තැන්පතු සියයට 13 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 287,929 ක් වීම හා සසඳන කල ජා.ඉ.බැ. මුළු තැන්පතු 1998 දී රුපියල් දශ ලක්ෂ 84,280 ක් දක්වා සියයට 9 කින් වැඩිවිය.

ජා.ඉ.බැ. පොලී අනුපාතිකයන් වර්ෂය තුළදී කිහිපවරක් සංශෝධනය කරනු ලැබීය. 1997 දෙසැම්බර් මස අවසානයට පිළිවෙලින් සියයට 10.8 ක් සහ සියයට 11.0 ක් වූ ඉතිරිකිරීමේ තැන්පතු අනුපාතිකය සහ එක් අවුරුදු ස්ථාවර තැන්පතු අනුපාතිකය, 1998 ජනවාරි මාසයේදී පිළිවෙලින් සියයට 9.6 ක් සහ සියයට 10.0 ක් දක්වා අඩු කරනු ලැබීය. වර්ෂයේ දෙවන කාර්තුව ආරම්භයේදී


වෙළෙඳපොළ උපනතීන් අනුව යමින් මෙම අනුපාතික නැවත වරක් ඉහළට යන පරිදි සංශෝධනය කරන ලදී. 1998 ජූලි 1 ද සිට බලපැවැත්වෙන පරිදි ඉතිරිකිරීමේ තැන්පතු පොලී අනුපාතිකය සියයට 10.5 ක් දක්වා ද එක් අවුරුදු ස්ථාවර තැන්පතු අනුපාතිකය සියයට 11.00 දක්වා ද ඉහළ දමන ලදී. ඉතිරිකිරීමේ තැන්පතු අනුපාතිකය සියයට 10.5 ක් ලෙස වර්ෂයේ ඉතිරි කාලය තුළ පැවතුනු අතර 1998 ඔක්තෝබර් මාසයේදී එක් අවුරුදු ස්ථාවර තැන්පතු අනුපාතිකය සියයට 11.5 ක් දක්වා වැඩිවිය.

මේ හා සමානව 1998 වර්ෂය තුළදී ජා.ඉ.බැ. ණයදීමේ අනුපාතික ද කිහිපවරක් සංශෝධනය කරන ලදි. නිවාස ණය සඳහා වූ පොලී අනුපාතික 1997 අවසානයට සියයට 15.50-16.50 පරාසයක තිබූ නිවාස ණය සඳහා අදල පොලී අනුපාතිකය 1998 ජනවාරි මාසයේදී සියයට 15.00-16.00 ක පරාසයක් දක්වා අඩු වී ජනවාරි මස සිට ජූලි මාසය දක්වාම එම අනුපාතික පැවතුනි. ඉන්පසුව අගෝස්තු මාසයේදී මෙම අනුපාතික තවදුරටත් සියයට 14.00-15.00 පරාසයක් දක්වා අඩුවූ අතර 1998 ඉතිරි කාලය තුළදී එම මට්ටමෙහිම පැවතුණි.

1998 අවසානයට ජා.ඉ.බැ. හි මුළු ආයෝජන සියයට 9 කින් ඉහළ ගොස් රුපියල් දශ ලක්ෂ 80,502 ක් විය. ජා.ඉ.බැ. හි ආයෝජන ව්‍යුහයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ වඩාත් වෙළෙඳපොළ මත පදනම් වූ රජයේ උපකරණයන්හි කරනු ලැබූ ආයෝජන කෙරෙහි යොමුවීමය. මෙමගින් රජය වඩාත් වෙළෙඳපොළ මත පදනම් වූ ණය උපකරණ වෙත යොමුවීම පෙන්නුම් කරයි. 1997 අවසානයට ආයෝජනයන්හි භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරයන්හි කොටස සියයට 10 ක සිට 1998 අවසානයට සියයට 21 ක් දක්වා වැඩිවිය. වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනයන් සියයට 12 කින් වැඩි වූ අතර, භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජන රුපියල් දශ ලක්ෂ 1,609 ක සිට 1998 අවසානයට රුපියල් දශ ලක්ෂ 10,177 ක් දක්වා ඉහළ ගියේය. ඒ හා සමානව, ආයෝජනයන්හි රජයේ රුපියල් සුරැකුම්පත්වල ආයෝජනයන්හි කොටස 1997 දී මුළු ආයෝජන වලින් සියයට 75 ක සිට 1998 දී සියයට 62 ක් දක්වා පහත වැටුණි. ණයකරයන්හි ආයෝජන, ඒකක භාර සහ කොටස්හි ආයෝජන ද පිළිවෙලින් සියයට 61 කින් සහ සියයට 18 කින් වැඩි විය. 1998 අවසානයට ජා.ඉ.බැ. හි මුළු ආයෝජනයන්ගෙන් සියයට 83 ක් වාර්තා කරමින් රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත්හි ආයෝජන ව්‍යුහයෙහි ප්‍රධාන කාණ්ඩය විය. ජා.ඉ.බැ. පනතට අනුව එහි ආයෝජනයන්ගෙන් අවම වශයෙන් සියයට 60 ක් රජය සහ රජය සහතික කළ සුරැකුම්පත්හි ආයෝජනය කල යුතුවේ.

රජයේ ප්‍රධාන අනිවාර්ය ඉතිරිකිරීමේ ආයතනය මෙන්ම සංස්ථා සහ වෙළෙඳ අංශයන්හි සේවකයන්ගේ විශ්‍රාම වැටුප් අරමුදල වූ සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) රටෙහි විශාලතම තනි ආයෝජන අරමුදල වේ. සේ.අ.අ. ට ලැබුණු දායක මුදල් පසුගිය වසර මුළුල්ලේදී වැඩි වූ අතර 1998 දී රුපියල් දශ ලක්ෂ 12,300 වාර්තා කරමින් කලින් වර්ෂයේ මට්ටමට වඩා සියයට 13 ක වැඩිවීමක් විය. සාමාජිකයන්ට මුදල් ආපසු ගෙවීම් 1997 දී රුපියල් දශ ලක්ෂ 4,775 හා සසඳන කල රුපියල් දශ ලක්ෂ 6,000 විය. සේ.අ.අ. මුළු සාමාජික ශේෂය සියයට 13 කින් ඉහළ ගොස් 1998 අවසානයේ දී ආසන්න වශයෙන් රුපියල් දශලක්ෂ 144,000 කරා ළඟා විය. කලින් වර්ෂ වලදී මෙන්ම අරමුදල ප්‍රධාන වශයෙන් රජය හා රජය සහතික කළ සුරැකුම්පත්වල ආයෝජනය කරණු ලැබීය. අරමුදලෙහි මුළු ආයෝජන රුපියල් දශ ලක්ෂ 162,000 ක් විය. මින් සියයට 98 ක් ආයෝජනය කරණු ලැබුවේ රජයේ සුරැකුම්පත්වලය. සේ.අ.අ. ට රාජ්‍ය නොවන සුරැකුම්පත්වල ක්‍රමයෙන් එහි ආයෝජන වැඩි කිරීමට අවසර දී ඇති අතර එවැනි ආයෝජන රුපියල් දශ ලක්ෂ 741 කින් වර්ෂය තුළ වැඩිවී 1998 අවසානයේදී රුපියල් දශලක්ෂ 3,267 ක් විය.

**10.5 රූප සටහන**
**සේවක අර්ථසාධක අරමුදල**



රටෙහි දෙවන විශ්‍රාමික වැටුප් අරමුදල වන, සේවක භාරකාර අරමුදල ද (සේ.භා.අ.) අරමුදල් ගලාඒම්වල වැඩිවීමක් වාර්තා කරනු ලැබීය. අරමුදලෙහි මුළු වත්කම් ප්‍රමාණය පෙර වර්ෂයෙහි සියයට 15 ක වර්ධනය හා සසඳන කල 1998 වර්ෂය තුළදී සියයට 16 කින් වැඩිවිය. 1998 වර්ෂය තුළදී ලැබුණු මුළු දායක මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 254 කින් වැඩි වූ අතර 1998 දී රුපියල් දශ ලක්ෂ 2,234 ක් විය. මුළු ආයෝජන රුපියල් දශ ලක්ෂ 3,242 කින් වැඩිවී 1998 අවසානයට රුපියල් දශ ලක්ෂ 21,940 ක් විය. සේ.අ.අ. ට මෙන් නොව සේ.භා.අ. ට එහි ආයෝජන සංයුතිය සකස් කරගැනීමේදී වඩා නම්‍යතාවයක් තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස 1998 අවසානයට රජයේ නොවන සුරැකුම්පත්වල ආයෝජන මුළු ආයෝජන වලින් සියයට 29 ක් විය. කෙසේ වුවද, කොටස් වෙළෙඳපොළ පිරිහුණු තත්ත්වයක් යටතේ 1998 වර්ෂය තුළ එහි ආයෝජනයෙන් වැඩි කොටසක් රජයේ සුරැකුම්පත්වල විය. 1998 අවසානයට එහි භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජන රුපියල් දශ ලක්ෂ 571 ක් දක්වා ඉහළ ගිය අතර භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජන රුපියල් දශ ලක්ෂ 10,054 ක් දක්වාද සහ රුපියල් සුරැකුම්පත්හි ආයෝජන රුපියල් දශ ලක්ෂ 4,881 දක්වා ද ඉහළ නැගුණි. ණයකර, කොටස්, ඒකක භාර, වාණිජ පත්‍ර සහ වත්කම් මත පදනම් වූ නෝට්ටුවල ආයෝජනයන් ඇතුලත් අනෙකුත් ආයෝජන වර්ෂය තුළදී සුළු වශයෙන් ඉහළ නැගුණි.

## දිගුකාලීන ණය දෙන ආයතන

ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 1998 දෙසැම්බර් මාසයේදී වල අනුපාතික නෝට්ටු ජාත්‍යන්තර වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම තුළින් ඉදිරි ණයදීම් සඳහා අරමුදල් සාර්ථක ලෙස වර්ධනය කරමින් වසර තුළදී එහි කාර්යයන් පුළුල් කළේය. එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 65 ක් වල අනුපාතික නෝට්ටු නිකුත් කිරීම මගින් සපයා ගනු ලැබීය. පෙර වසරේදී 1,066 ක් වූ ණය සංඛ්‍යාවක් සඳහා අනුමත කරන ලද රුපියල් දශ ලක්ෂ 6,631 ට සංසන්දනාත්මකව 1998 දී 1,418 ක් වූ ණය සංඛ්‍යාවක් සඳහා රුපියල් දශ ලක්ෂ 8,478 ක ණය අනුමත කරන ලදී. වසර තුලදී මුදාහරින ලද සමස්ත ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,277 ක් වූ අතර එය සියයට 16 ක වර්ධනයකි. එහි ප්‍රතිඵලයක් ලෙස නොපියවූ සමස්ත ණය ප්‍රමාණය සියයට 20 කින් වර්ධනය වී 1998 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 13,513 ක් විය. පෙර වසරේදී මෙන්ම අදාල වසර තුළදීද මුදාහළ ණයෙන් ප්‍රධාන කොටසක් (සියයට 55) යොමු වූයේ කාර්මික අරමුණු සඳහා ය. වාණිජ අංශයට, ප්‍රධාන වශයෙන් තොග වෙළෙඳම සහ සිල්ලර වෙළෙඳම සඳහා සියයට 12 ක් ලැබුණු අතර කෘෂිකාර්මික අංශය සහ මූල්‍ය අංශය විසින් පිළිවෙලින් සියයට 11 ක් සහ සියයට 8 ක් උකහා ගන්නා ලදී. සමස්ත ණය ප්‍රදානයන්ගෙන් සංචාරක අංශය සඳහා දෙන ලද ණය ප්‍රමාණය සියයට 2 ක් පමණක් විය.

**10.12 සංඛ්‍යා සටහන**

**දිගුකාලීන ණය දෙන ආයතන වලින් අනුමත කරන ලද හා දෙන ලද ණය - අරමුණු අනුව**

රුපියල් දශලක්ෂ

| අරමුණු | ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | | ජාතික සංවර්ධන බැංකුව (අ) | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | | පෞද්ගලික ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකු | | එකතුව | | අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණය % | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 |
| කෘෂිකර්ම | 1,122 | 1,153 | 815 | | - | - | 13 | 14 | - | - | - | - | 2 | 44 | 1,952 | 4,075 | 7.0 | 8.9 |
| කර්මාන්ත | 3,806 | 5,114 | 6,679 | | - | - | - | 0 | - | - | - | - | 19 | 283 | 10,504 | 20,432 | 37.8 | 44.5 |
| සංචාරක | 181 | 126 | 307 | | - | - | - | - | - | - | - | - | 59 | 10 | 547 | 918 | 1.9 | 2.0 |
| වෙළෙඳ | 888 | 591 | - | | - | - | - | - | - | - | - | - | 353 | 1,082 | 1,241 | 3,102 | 4.5 | 6.8 |
| මූල්‍ය | 320 | 766 | 569 | | - | 5,240 | - | - | - | - | - | - | 16 | 21 | 905 | 6,367 | 3.2 | 13.8 |
| නිවාස | - | - | - | | 1,812 | 679 | 1,329 | 1,540 | 484 | 684 | 1,463 | 1,911 | 5 | 152 | 5,093 | 5,241 | 18.3 | 11.4 |
| ණය නිදහස් කිරීම | - | - | - | | - | 59 | 17 | 17 | - | - | - | - | 2 | 19 | 19 | 95 | 0.1 | 0.2 |
| අනෙකුත් ණය | 314 | 728 | 3,276 | | 3,808 | 3,286 | | 19 | - | - | - | - | 161 | 478 | 7,559 | 5,688 | 27.2 | 12.4 |
| එකතුව (අනුමත කරන ලද) | 6,631 | 8,478 | 11,646 | | 5,620 | 9,264 | 1,359 | 1,590 | 484 | 684 | 1,463 | 1,911 | 617 | 2,089 | 27,820 | 45,918 | 100.0 | 100.0 |
| ප්‍රදානය කරන ලද ණය(ආ) | 3,684 | 4,277 | 4,674 | | 5,167 | 7,960 | 1,359 | 1,248 | 362 | 530 | 670 | 887 | 449 | 2,081 | 16,365 | 31,519 | | |
| ප්‍රදානය කරන ලද ණය අනුමත කරන ලද ණයෙහි ප්‍රතිශතයක් වශයෙන්(%) | 56 | 50 | 40 | 0 | 92 | 86 | 100 | 78 | 75 | 77 | 46 | 46 | 73 | 100 | 59 | 69 | | |

මූලයන් : ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
ජාතික සංවර්ධන බැංකුව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
සණස සංවර්ධන බැංකුව
ප්‍රමුඛ ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකුව
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

(අ) ප්‍රතිමූල්‍ය ණය සහ කොටස් ආයෝජන ඇතුළත් වේ.
(ආ) පෙර වර්ෂවල අනුමත කරන ලදුව මෙම වර්ෂයේ දී දෙන ලද ණය ද ඇතුළත් වේ.

ප්‍රජා හා සමාජ සේවා, විදුලිය, ගෑස් සහ ජලය සහ ගමනාගමන පහසුකම් ඇතුලත් අනෙකුත් අංශ සඳහා මුදහරින ලද ණය ප්‍රමාණය මුළු ණය ප්‍රමාණයෙන් සියයට 13 ක් විය. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ප්‍රාග්ධන මූල්‍යකරණය සඳහා පෙර වසරේදී ලබාදුන් ණය රුපියල් දශ ලක්ෂ 1,454 කට සංසන්දනාත්මකව 1998 දී රුපියල් දශ ලක්ෂ 45 ක් සපයන ලදී.

පෙරදී මෙන් ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ප්‍රධාන වශයෙන් යොමුවූයේ මැදිකාලීන සහ දිගුකාලීන ණය මුදල් සැපයීම සඳහායි. නොපියවූ සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 57 ක් මැදිකාලීනද, සියයට 34 ක් දිගුකාලීනද සහ සියයට 8 ක් කෙටිකාලීනද විය. ව්‍යාපෘති ණය සඳහා වැඩි අවධානයක් යොමු වීමත් සමග නොපියවා ඇති ණය වලින් සියයට 89 ක් රුපියල් දශ ලක්ෂයට වඩා වැඩි ණය වූ අතර ණය වලින් වැඩි ප්‍රමාණයක් දේපල උකස් කිරීම මත ප්‍රදනය කෙරිණ. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ණය පොලී අනුපාතික වර්ෂය ආරම්භයේදී පැවැති සියයට 13.50-21.00 පරාසයක සිට වසර අවසානයේදී සියයට 13.00-20.50 අතර පරාසයකට මඳ වශයෙන් පහත වැටුණි. සමස්ත මුදහැරීම් වලින් සියයට 52 ක් පොලී අනුපාතික සියයට 14.00-19.00 අතර පරාසයක විය. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවයන් වූයේ ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් (සියයට 36) ලබාගත් ණයද, ගණුදෙනුකරුවන් විසින් ණය ආපසු ගෙවීම් (සියයට 29) සහ ණයකර නිකුතුන් (සියයට 11) ය.

ණයදීම් කටයුතු මූල්‍යණය කිරීම සඳහා 1997 දී විදේශ ණය මගින් අරමුදල් රැස්කර ගනු ලැබූ ජාතික සංවර්ධන බැංකුව පෙර වසරේ අනුමත කළ සමස්ත ණය රුපියල් දශ ලක්ෂ 11,646 ට සාපේක්ෂව 1998 දී රුපියල් දශ ලක්ෂ 21,902 ක ණය අනුමත කරන ලදී. සමස්ත ණය සංඛ්‍යාවද 733 සිට 1998 දී 1,224 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය. අනුමත මුළු ණය ප්‍රමාණයෙන් වසර තුලදී රුපියල් දශ ලක්ෂ 14,536 ක් ප්‍රදනය කරනු ලැබිණ. 1998 දී නොපියවන ලද සමස්ත ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 21,883 ක් විය. ජාතික සංවර්ධන බැංකුව විසින් අනුමත කරනු ලැබූ ණය වලින් වැඩි ප්‍රමාණයක් (සියයට 69 ක්) කර්මාන්ත අංශය සඳහා විය. කර්මාන්ත අංශය සඳහා අනුමත කළ ණය වසර තුළදී දෙගුණයකට වඩා වැඩිවිය. අනුමත කළ සමස්ත ණය ප්‍රමාණයෙන් කෘෂිකාර්මික අංශය සඳහා අනුමත කරනු ලැබූ ණය ප්‍රමාණය සියයට 13 ක්ව පැවැති අතර එය රුපියල් දශ ලක්ෂ 815 සිට 1998 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 2,864 දක්වා සැලකියයුතු ලෙස වර්ධනය විය. ජාතික සංවර්ධන බැංකුව විදේශීය වෙළෙඳම ඇතුලත්ව වාණිජ අංශයට හා නිවාස අංශයට ණය දීම කෙරෙහි යොමුවිය. 1998 අනුමත කළ මුළු ණය වලින් සියයට 7 ක් වාණිජ අංශය ලද අතර නිවාස කටයුතු සඳහා අනුමත ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 275 ක් විය. පෙර වසර හා සංසන්දනාත්මකව සංචාරක අංශය ලද ණය ප්‍රමාණය 1998 දී දෙගුණයකටත් වඩා වැඩිවිය. වර්ෂය තුළදී මූල්‍ය අංශය සහ දේපල සංවර්ධනය ඇතුලත් අනෙකුත් අංශ වලට ලැබුණු ණය පහසුකම් පිළිවෙලින් සියයට 40 කින් සහ සියයට 64 කින් පහත වැටුණි. ජාතික සංවර්ධන බැංකුව විසින් ප්‍රදනය කළ ණය පහසුකම් වලින් වැඩි ප්‍රමාණයක් රුපියල් දශ ලක්ෂ 25 ට වැඩි වටිනාකමකින් යුතු වූ වසර 1-5 දක්වා කාලසීමාවක් සඳහා දෙන ලද ණය වූ අතර ඒ සඳහා වූ පොලී අනුපාතික සියයට 14-19 දක්වා විය. 1998 දී ජාතික සංවර්ධන බැංකුවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවයන් වූයේ ගණුදෙනුකරුවන් විසින් ණය ආපසු ගෙවීම්, ණයකර නිකුතුන්, වාණිජ පත්‍ර නිකුතුන් සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් ණය ගැනීම්ය.

වසර තුළදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 8,913 ක් වූ ණය සංඛ්‍යාවක් සඳහා රුපියල් දශ ලක්ෂ 1,590 ක් අනුමත කරනු ලැබූ අතර එය වසර තුල ආසන්න වශයෙන් සියයට 17 ක වැඩිවීමකි. මෙම බැංකුව මූලික වශයෙන් නිවාස කටයුතු සඳහා අරමුදල් සපයාදෙනු ලබන්නකු වශයෙන් 1998 දී අනුමත කළ මුළු ණය වලින් සියයට 97 ක් නිවාස කටයුතු සඳහා වූ අතර ඉතිරිය කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් මිලට ගැනීම, ප්‍රවාහන අංශය සහ ප්‍රජා හා සමාජ සේවා සඳහාද විය. 1998 දී මුදහරින ලද සමස්ත ණය වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,248 ක් වූ අතර එය පෙර වසරට වඩා සියයට 8 ක අඩුවීමකි. අනුමත කළ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 87 ක් දිගුකාලීන වූ අතර සියයට 12 ක් මධ්‍යකාලීන විය. අනුමත කළ ණයෙන් වැඩි ප්‍රමාණයක් (සියයට 85 ක්) රුපියල් ලක්ෂයකට වැඩි ණය වූ අතර ඒවා දේපල හෝ සේවක අර්ථසාධක අරමුදලේ ශේෂයන් මගින් ආවරණය කෙරිණි. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් රාශීකරණය කරන ලද මුළු තැන්පතු ප්‍රමාණය වසර තුළදී සියයට 5 කින් පහත වැටුණි. මෙම බැංකුවේ මුළු වත්කම් 1998 අවසානයේදී සියයට 4 කින් වර්ධනය වී රුපියල් දශ ලක්ෂ 6,627 ක් විය. මෙහි ප්‍රධාන අරමුදල් ප්‍රභවයන් වූයේ ගණුදෙනුකරුවන් විසින් ණය ආපසු ගෙවීම් සහ එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය ප්‍රදන යටතේ ණය ලබාගැනීම්ය.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, වෙළෙඳපොළ තරඟකාරිත්වයට මුහුණ දෙමින් වසර තුළදී තම තැන්පතු අනුපාතික කිහිප වරක්ම සංශෝධනය කළේය. තැන්පතු අනුපාතික ජනවාරි මාසයේදී ප්‍රතිශතාංක එකකින් පහත දැමූ නමුදු මෙම සංශෝධනය පසුව සැප්තැම්බර් මාසයේදී ආපසු වෙනස් කරන ලදී. 1997 අවසානයේදී සියයට 17.00-20.00 පරාසයක පැවැති ණය පොලී අනුපාතික 1998 ජනවාරි මාසයේදී සියයට 15.00-18.00 වූ පහතට නැඹුරුවූ පරාසයකට සංශෝධනය කරනු ලැබීය.

පෞද්ගලික ඉතිරිකිරීමේ හා සංවර්ධන බැංකු දෙක විසින් අනුමත කරන ලද ණය 1997 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 617 සිට 1998 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 2,088 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. ණය ප්‍රදනයන් ප්‍රධාන වශයෙන් වාණිජ අංශයට (සියයට 52), කර්මාන්ත අංශයට (සියයට 14), නිවාස අංශයට (සියයට 7) සහ කෘෂිකාර්මික අංශයට (සියයට 2) ද විය. දෙන ලද ණය වලින් සියයට 77 කට වැඩි ප්‍රමාණයක් රුපියල් දශ ලක්ෂයට වැඩි වූ අතර ණය වලින් සියයට 81 ක් සඳහා අයකළ

පොලී අනුපාතිකය සියයට 20 කට වඩා වැඩි විය. නොපියවන ලද සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 64 ක් මැදිකාලීන, සියයට 22 ක් කෙටිකාලීන සහ සියයට 14 ක් දිගුකාලීන ණයද විය. මෙම බැංකුවල ප්‍රධාන අරමුදල් ප්‍රභවයන් වූයේ තැන්පතු හා ගණුදෙනුකරුවන් විසින් ආපසු ගෙවන ලද ණයයි.

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නිවාස අවශ්‍යතා සඳහා දෙන ලද ණය වර්ධනය විය. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වසර තුළදී 4,908 ක ණය සංඛ්‍යාවක් සඳහා රුපියල් දශ ලක්ෂ 684 ක් අනුමත කළේය. මෙය පෙර වසරේදී අනුමත කරන ලද ණය ප්‍රමාණයට වඩා සියයට 41 කින් වැඩි වීමකි. මුදහරින ලද සමස්ත ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 362 සිට රුපියල් දශ ලක්ෂ 530 දක්වා වැඩිවිය. දෙන ලද ණයෙන් වැඩි ප්‍රමාණයක් දිගුකාලීන වූ අතර ඒවා දේපළ උකසට තබා ගැනීමෙන් ආවරණය කරන ලදී. මේ සියළුම ණය රුපියල් දශ ලක්ෂයට අඩු ඒවා වූ අතර දෙන ලද ණයෙන් වැඩි ප්‍රමාණයක් සඳහා අය කළ පොලී අනුපාතිකය සියයට 16.00-19.00 අතර විය. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවයන් වූයේ ගනුදෙනුකරුවන් විසින් ආපසු ගෙවන ලද ණය සහ ජාත්‍යන්තර මූල්‍ය නියෝජිත ආයතන වලින් ලබාගත් ණයයි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සාමාන්‍යයෙන් නිවාස කටයුතු සඳහා කුඩා ප්‍රමාණයේ ණය ප්‍රදානය කරන ලැබිය. 1997 දී 32,520 ක් වූ ණයගැනුම්කරුවන් සඳහා අනුමත කරන ලද රුපියල් දශ ලක්ෂ 1,463 ක් හා සංසන්දනාත්මකව 1998 දී 65,318 ක් වූ ණයගැනුම්කරුවන් සඳහා රුපියල් දශ ලක්ෂ 1,911 ක මුදලක් අනුමත කරන ලදී. මුළු අනුමත කිරීම් වලින් රුපියල් දශලක්ෂ 887 ක් වර්ෂය තුල ප්‍රදානය කරනු ලැබීය. මෙය 1997 හා සාපේක්ෂව සියයට 32 ක වර්ධනයකි. ප්‍රදානය කරන ලද සියළුම ණය රුපියල් 25,000 ට අඩු ඒවා විය. මේ ණය සඳහා අය කළ පොලී අනුපාතික වසරකට සියයට 11.0-16.0 අතර පරාසයක විය.

## මූල්‍ය සමාගම්

ක්‍රියාත්මක වෙමින් පැවති මූල්‍ය සමාගම් සංඛ්‍යාව 25 ක් වශයෙන් නොවෙනස්ව පැවති අතර 1998 දෙසැම්බර් අගදී පැවති ශාඛා සංඛ්‍යාව 46 ක් විය. මූල්‍ය සමාගම්හි මුළු වත්කම්/වගකීම්, 1997 දී වාර්තා වූ සියයට 24 ක වර්ධනය හා සැසඳීමේදී සියයට 17 කින් වැඩි වී 1998 දෙසැම්බර් අගදී රුපියල් දශ ලක්ෂ 26,089 ක් විය. මෙය වාණිජ බැංකුවල දේශීය ඒකකයන්හි වත්කම්වලින් සියයට

**10.13 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල වත්කම් සහ වගකීම්**

රුපියල් දශලක්ෂ

| ශීර්ෂය | 1997 දෙසැම්බර් 31 දිනට | 1998 මාර්තු 31 දිනට | 1998 ජුනි 30 දිනට | 1998 සැප්තැම්බර් 30 දිනට(අ) | 1998 දෙසැම්බර් 31 දිනට(අ) |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| 1. ණය සහ අත්තිකාරම් | 14,544 | 15,385 | 14,921 | 16,399 | 17,175 |
| 1.1 කුලීපිට ගැණුම් | 2,619 | 2,741 | 2,345 | 2,445 | 2,355 |
| 1.2 කල්බදු | 7,772 | 8,140 | 8,339 | 8,977 | 9,807 |
| 1.3 නිශ්චල දේපළ | 1,605 | 1,666 | 1,681 | 2,082 | 2,151 |
| 2. කොටස් ආයෝජන | 1,697 | 2,227 | 1,936 | 1,905 | 1,875 |
| 3. භාණ්ඩාගාර බිල්පත් | 1,534 | 1,159 | 1,848 | 1,688 | 1,949 |
| 4. ස්ථාවර වත්කම් | 1,664 | 2,126 | 2,196 | 2,209 | 2,288 |
| 5. අනෙකුත් වත්කම් | 2,856 | 2,736 | 2,576 | 2,827 | 2,802 |
| **එකතුව** | **22,295** | **23,633** | **23,477** | **25,028** | **26,089** |
| **වගකීම්** | | | | | |
| 1. ප්‍රාග්ධන ගිණුම් | 3,124 | 3,585 | 3,629 | 3,620 | 3,769 |
| 2. ස්ථිර තැන්පතු | 13,495 | 14,046 | 14,186 | 14,733 | 15,195 |
| 3. තැන්පතු සහතික | 542 | 736 | 792 | 846 | 881 |
| 4. ණය ගැනීම් | 558 | 480 | 643 | 1,312 | 1,910 |
| 5. වෙන්කිරීම් | 1,385 | 1,471 | 1,054 | 1,263 | 1,059 |
| 6. අනෙකුත් වගකීම් | 3,191 | 3,315 | 3,173 | 3,254 | 3,275 |
| **එකතුව** | **22,295** | **23,633** | **23,477** | **25,028** | **26,089** |
| මහ බැංකුවට තොරතුරු සැපයූ මූල්‍ය සමාගම් සංඛ්‍යාව | 25 | 25 | 25 | 25 | 25 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

6 කට සමාන විය. සංසන්දනාත්මකව, වාණිජ බැංකුවල මුළු වත්කම් 1997 දී සියයට 14 කින්ද, 1998 දී සියයට 13 කින්ද වර්ධනය විය. මූල්‍ය සමාගම් වලින් ලබාදුන් මුළු ණය ප්‍රමාණය වාණිජ බැංකු වල මෙන්ම සාපේක්ෂ වශයෙන් අඩු වර්ධනයක් පෙන්විය. මේ අතර, 1998 වර්ෂයේදී වාණිජ බැංකුවල තැන්පතු වර්ධනය හා සැසඳීමේදී මූල්‍ය සමාගම්වල තැන්පතු වර්ධනය සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි.

ණය සහ අත්තිකාරම් මූල්‍ය සමාගම්වල වත්කම්හි ප්‍රධාන කාණ්ඩය වශයෙන් තවදුරටත් පවතිමින් එය මුළු වත්කම් වලින් තුනෙන් දෙකක තරම් ප්‍රමාණයක පැවතුණි. කෙසේ වුවද, ණය සහ අත්තිකාරම්වල වර්ධන අනුපාතිකය 1997 දී සියයට 20 සිට 1998 දී සියයට 18 දක්වා මඳ වශයෙන් අඩුවිය. සංසන්දනාත්මකව, වාණිජ බැංකුවල ණය සහ අත්තිකාරම් 1997 දී සියයට 14 කින්ද, 1998 දී සියයට 15 කින්ද වැඩිවිය. ණය සහ අත්තිකාරම්වල කල්බදු (සියයට 57), කුලී පිට ගැණුම් (සියයට 14) සහ නිශ්චල දේපල (සියයට 13) මූලික අංශයන් විය. 1998 දී නිශ්චල දේපල සඳහා දුන් අත්තිකාරම් සියයට 34 ක වර්ධනයක් පෙන්වමින් එය වේගවත්ම වර්ධනය පෙන් වූ අංශය විය. වත්කම් මිල කෘත්‍රිමව ඉහළ දැමීමට ඇති ඉඩකඩ ගැන සලකන විට, මෙම තත්ත්වය පිළිබඳව සුපරීක්ෂාකාරීවීම වැදගත් වේ. කල්බදු සඳහා දුන් ණය සියයට 26 කින් වැඩි වූ අතර, කුලීපිට ගැණුම් සඳහා වූ ණය සියයට 10 කින් අඩුවිය.

මූල්‍ය සමාගම්වල වත්කම් වලින් ආයෝජන අගය සියයට 15 ක් වූ අතර එයින් සියයට 50 ක් පමණ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමුඛ වූ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබුණි. අනෙකුත් වත්කම් අතර, අතැති මුදල් සහ බැංකු ශේෂයන් සියයට 22 කින් අඩුවූ අතර, ස්ථාවර වත්කම් සියයට 38 කින් වැඩිවිය.

වගකීම් සම්බන්ධව සලකන විට, මුළු වගකීම් වලින් සියයට 62 ක් වෙමින්, තැන්පතු ප්‍රධාන අයිතමය විය. (ස්ථාවර තැන්පතු සියයට 58, තැන්පතු සහතික සියයට 4), වාණිජ බැංකුවල රුපියල් තැන්පතුවල සියයට 7 ක වැඩිවීම (1997 දී සියයට 14) හා සැසඳීමේදී 1998 දී මූල්‍ය සමාගම්වල මුළු තැන්පතු සියයට 15 කින් (1997 දී සියයට 38) වැඩිවිය. කැපී පෙනෙන වර්ධනයක් වූයේ තැන්පතු සහතික සියයට 62 කින් වැඩිවීමය.

මූල්‍ය සමාගම්වල නොපියවන ලද ණය ගැනීම් 1997 සියයට 62 ක අඩුවීම හා සැසඳීමේදී 1998 දී තුන් ගුණයක වැඩිවීමක් පැවති අතර මෙයින් අරමුදල් ප්‍රභවයක් ලෙස ණය ගැනීම් මත රඳා පැවතීම වැඩිවීම පෙන්නුම් කෙරිණි. මෙසේ ණය ගැනීම් මත රඳා පැවතීම වැඩිවීමට, 1998 දී තැන්පතු වර්ධනය මඳ වේගයකින් සිදුවීම හේතුවූවා වියහැක. 1998 දී බොල් ණය සහ අඩමාණ ණය වෙන් කිරීම් අඩුවීම, ප්‍රධාන වශයෙන් 1998 ජූනි මාසයේදී එක් මූල්‍ය සමාගමක් විසින් ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 480 ක්වූ බොල් ණය ලියා හැරීමේ ප්‍රතිඵලයක් විය. මූල්‍ය සමාගම්වල අනෙකුත් වගකීම් 1997 දී සියයට 23 ක වැඩිවීම හා සැසඳීමේදී 1998 දී සියයට 5 කින් පහත වැටුණි.

තැන්පතු පොලී අනුපාතික මෙන්ම ණය දීමේ පොලී අනුපාතික තවදුරටත් පහත වැටීමක් 1998 දී දක්නට ලැබුණි. වර්ෂයකින් කල්පිරෙන ස්ථාවර තැන්පතු පොලී අනුපාතික 1997 දී වර්ෂයකට සියයට 14.00-21.00 අතර පරාසයක සිට 1998 දී වර්ෂයකට සියයට 10.00-20.00 අතර පරාසයක් දක්වා පහත වැටුණු අතර කුලීපිට ගැණුම් මත ණයදීමේ පොලී අනුපාතික 1997 දී සියයට 11.00-30.00 පරාසයක සිට 1998 දී සියයට 10.00-27.00 පරාසයක් දක්වා පහත දමන ලදී. මෙයට සමානවම කල්බදු මත වූ පොලී අනුපාතික 1997 දී පැවති වර්ෂයකට සියයට 13.00-30.00 පරාසය හා සැසඳීමේදී 1998 දී වර්ෂයකට සියයට 10.00-27.00 ක පරාසයක් දක්වා අඩු කරන ලදී.

## 10.10 විශේෂිත මූල්‍ය ආයතන

### වණික් බැංකු

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ මුළු වණික් බැංකු සංඛ්‍යාව 10 ක් ලෙස පැවතිණි. වණික් බැංකුවල මුළු වත්කම් 1998 දී සියයට 2 කින් සුළු ලෙස පහත වැටුණි. බදු වලට පෙර මුළු ශුද්ධ ලාභය 1998 දී සෘණ අගයක් ගත් නමුත් 1997 හා සසඳ බලනවිට එම අලාභය සැලකිය යුතු ලෙස පහත වැටී තිබුණි. වණික් බැංකුවල මුළු ආදායම සියයට 3 කින් වැඩි වී 1998 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 2,008 ක් විය. ප්‍රධාන ආදායම් මාර්ගයන් වූයේ කල්බදු (සියයට 23), ණය (සියයට 14) සහ වෙළෙඳ බිල්පත් වට්ටම් කිරීම (සියයට 13) ය. කොටස් ආයෝජන ලාභ සහ මූල්‍ය සහ වෙළෙඳපොළ උපදේශක සේවා වලින් වූ ආදායම් සැලකියයුතු ලෙස අඩුවිය.

**10.14 සංඛ්‍යා සටහන**

**වණික් බැංකු කටයුතුවල ප්‍රගතිය**

රුපියල් දශලක්ෂ

| | 1997 | 1998(අ) |
|---|---|---|
| 1. කල්බදු මගින් උපයන ලද ආදායම | 473.8 | 471.1 |
| 2. වෙළෙඳ බිල්පත් වට්ටම් කිරීමෙන් ලද පොලී | 332.8 | 256.0 |
| 3. මූල්‍ය සහ අලෙවි උපදේශක සේවා | 203.9 | 111.3 |
| 4. ප්‍රාරක්ෂණ කොමිස් මුදල් | 0.8 | - |
| 5. රක්ෂණ කොමිස් මුදල් | 2.0 | 2.5 |
| 6. ආන්තික වෙළෙඳාම මත පොලී | 30.9 | 24.0 |
| 7. කොටස් ආයෝජන මත ලාභ | 229.8 | 25.0 |
| 8. භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 91.8 | 94.7 |
| 9. ණය මත පොලී | 305.1 | 272.4 |
| 10. ලාභාංශ | 61.6 | 179.6 |
| 11. අනෙකුත් ආදායම් | 224.9 | 571.0 |
| **12. මුළු ආදායම** | **1,957.4** | **2,007.6** |
| 13. බදු පෙර ලාභ | -135.1 | -58.6 |
| 14. මුළු වත්කම් | 19,802.4 | 19,388.2 |
| වාර්තා කරන ලද මුළු වණික් බැංකු සංඛ්‍යාව | 10 | 10 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## කල්බදු සමාගම්

1998 දී විශේෂිත කල්බදු සමාගම් 5 ක් ක්‍රියාත්මක විය. ඉන් 3 ක් වාණිජ බැංකුවල උප සමාගම්ය. මීට අමතරව වාණිජ බැංකු, සංවර්ධන බැංකු, මූල්‍ය සමාගම් සහ වණික් බැංකු වැනි අනෙකුත් මූල්‍ය ආයතනයන් ගණනාවක්ද ශ්‍රී ලංකාවේ කල්බදු ව්‍යාපාරික කටයුතුවල නිරත විය. දැඩි තරඟකාරිත්වය මධ්‍යයේ මෙම කල්බදු සමාගම්වල කටයුතු වර්ධනය විය. කල්බදු සමාගම් පහෙහි මුළු වත්කම් 1997 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 7,538 සිට 1998 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 10,013 දක්වා වැඩිවිය. මෙම සමාගම් විසින් සපයනු ලැබූ නව කල්බදු පහසුකම්වල මුළු වටිනාකම පසුගිය වර්ෂයේ සියයට 63 ක වර්ධනය හා සසඳ බලනවිට 1998 දී සියයට 60 කින් වැඩිවිය. කලින් වර්ෂයේ මෙන්ම කල්බදු පහසුකම් ප්‍රධාන වශයෙන් යොමු වූයේ වාණිජමය කටයුතු සඳහා භාවිතා කරන වාහන (සියයට 55), මගී වාහන (සියයට 15), යන්ත්‍ර උපකරණ (සියයට 12) සහ කාර්යාලීය උපකරණ සියයට (11) සඳහාය. ආංශික වශයෙන් බලනවිට වෙළෙඳ අංශයට මුළු බදු පහසුකම් වලින් සියයට 32 ක් ලැබුණ අතර සේවා අංශයට සහ ගමනාගමන අංශයට පිළිවෙලින් සියයට 22 ක් සහ සියයට 21 ක් ලැබුණි. මීට අමතරව, කාර්මික අංශය (සියයට 16), තැනීම් අංශය (සියයට 4) සහ කෘෂි අංශයටද (සියයට 3) සැලකියයුතු මට්ටමක මූල්‍ය පහසුකම් ලැබුණි. අනෙකුත් මූල්‍ය ආයතන වලින් එල්ල වූ තරඟකාරිත්වය සහ කල්බදු සඳහා පැනවූ භාණ්ඩ හා සේවා බද්ද එම ආයතනවල කටයුතු කෙරේ බලපෑ බව කල්බදු සමාගම් සඳහන් කරයි. බොහොමයක් කල්බදු සමාගම් විසින් මුහුණ දෙනු ලැබූ අනෙක් බාධකය වූයේ කල්බදු කටයුතු සඳහා සැපයීමට අවශ්‍ය කරන දිගුකාලීන අරමුදල් සම්පාදනය කර ගැනීමට ඇති අපහසුතාවයි.

## ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්

ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් විසින් නිල ලැයිස්තුගත සමාගම්වල ආයෝජනයන්ට සහ අනෙකුත් මූල්‍ය උපකරණයන්හි කරනු ලැබූ ආයෝජනයන්ට අමතරව නව ව්‍යාපාර ඇරඹීම පැවති ව්‍යවසායයන් පුළුල් කිරීම, ව්‍යාපාර අත්පත් කර ගැනීම් හා මිලදී ගැනීම් සඳහා දිගුකාලීන ප්‍රාග්ධනය සැපයීම කරගෙන යනු ලැබීය. ව්‍යවසායයන් ආරම්භ කිරීම සඳහා සැපයූ අරමුදල් 1997 දී සැපයූ ප්‍රමාණයට වඩා අඩු වුවද මුළු ප්‍රාග්ධන ආයෝජන වලින් වැඩි ප්‍රමාණයක් (සියයට 65) ඒ සඳහා විය. ව්‍යාපාරයන් පුළුල් කිරීම සඳහා සැපයූ අරමුදල් රුපියල් දශ ලක්ෂ 313 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා සියයට 4 කින් වැඩිවිය. මේ අතර අත්පත් කර ගැනීම් හා මිලදී ගැනීම් සඳහා සැපයූ අරමුදල් සහ ලැයිස්තුගත සමාගම්වල ආයෝජනයන් වර්ෂය තුළ අඩුවිය. පසුගිය වර්ෂයේ ව්‍යාපෘති 161 ක කරනු ලැබූ ආයෝජනයන් හා සසඳා බලනවිට 1998 දී ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් ව්‍යාපෘති 135 ක ආයෝජනයන් කරන ලදී. අරමුදල් ලැබුණු අංශයන් සලකා බලනවිට රුපියල් දශ ලක්ෂ 1390 ක් ලබා ගනිමින් සේවා අංශය අරමුදල් ලැබූ විශාලතම (සියයට 60) අංශය විය. මෙය පෙර වර්ෂයට වඩා සියයට 17 ක වැඩිවීමකි. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් මුළු ප්‍රාග්ධන සැපයුම් ප්‍රමාණයෙන් සියයට 34 ක් සහ සියයට 6 ක් පිළිවෙලින් නිෂ්පාදන අංශයට සහ කෘෂි අංශයට සැපයුණි. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්හි මුළු වත්කම් වර්ෂය තුළ සියයට 1 කින් වර්ධනය විය.

## රක්ෂණ සමාගම්

මුළු වත්කම් පදනම හා ලාභ යන දෙඅංශයෙන්ම බලනවිට 1998 වර්ෂය තුළදී රක්ෂණ කර්මාන්තය වර්ධනය වී ඇත. රක්ෂණ සමාගම් 7 ක මුළු වත්කම් වර්ෂය තුළදී සියයට 5 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 23,805 ක් බවට පත්විය. බදු වලට පෙර ශුද්ධ ලාභය ද 1998 වර්ෂය තුළදී සියයට 10 කින් වැඩිවිය. මෙම වර්ධනය සමඟ රක්ෂණ අංශයෙහි සේවා නියුක්තිය 6,244 ක සිට 6,511 ක් දක්වා වැඩිවීමක් සිදුවිය. මුළු ශාඛා ජාලය 1997 අවසානයේ 262 ක සිට 1998 අවසානයේ 268 ක් දක්වා වැඩිවිය.

රක්ෂණ කර්මාන්තයෙහි වර්ධනය ජීවිත රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණ කටයුතු යන දෙකෙහිම දක්නට ලැබුණි. ජීවිත ආරක්ෂණ අරමුදලේ මුළු වටිනාකම වර්ෂය තුළ සියයට 19 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 16,107 ක් බවට පත්විය. ක්‍රියාත්මකව පැවති ගිවිසුම් වෙනුවෙන් එකතු කරන ලද මුළු වාරික ප්‍රමාණය වර්ෂය තුළදී සියයට 18 කින් වැඩිවූ අතර මුළු රක්ෂිත මුදල් වටිනාකම කලින් වර්ෂය හා සසඳන කල සියයට 11 ක වර්ධනයක් පෙන්විය. 1998 දී ක්‍රියාත්මකව පැවති මුළු ඔප්පු සංඛ්‍යාව සියයට 5 කින් වැඩි විය. වර්ෂය තුළදී කල්පිරීම, මරණ සහ නොහැකියාවන් සහ පවාරණ මත ප්‍රතිලාභ ගෙවීම සියයට 17 ක වර්ධනයක් පෙන්විය.

වර්ෂය තුළදී මුහුදු රක්ෂණය හැරුණු කොට සාමාන්‍ය රක්ෂණ කටයුතුවල වර්ධනයක් පෙන්විය. 1998 අවසානයේ බලපවත්නා ඔප්පු සඳහා වූ ශුද්ධ වාරික සියයට 10 කින් වර්ධනය වී රුපියල් දශ ලක්ෂ 4,607 ක් බවට පත්විය. වර්ෂය තුළදී සාමාන්‍ය රක්ෂණ කාණ්ඩයන්හි විශාලතම අංශය වන මෝටර් රථ රක්ෂණ අංශයෙහි ශුද්ධ වාරික ආදයම සියයට 18 කින් වැඩිවිය. ගිනි රක්ෂණය සහ සාමාන්‍ය අනතුරු රක්ෂණයන්හි ශුද්ධ වාරික ආදයම් පිළිවෙලින් සියයට 9 කින් සහ සියයට 5 කින් වැඩිවිය. මේ අතර, මුහුදු රක්ෂණයෙන් ශුද්ධ වාරික ආදයම වර්ෂය තුළදී සුළු වශයෙන් අඩුවිය.

## 10.11 මුදල් වෙළෙඳපොළ

### සමස්ත ප්‍රවනතා

1998 මුල් කාලයේදී බාහිර වාතාවරණය තුළ අඛණ්ඩව පැවති අවිනිශ්චිතතාව සහ තරමක් ඉහළ දේශීය උද්ධමනය හේතුවෙන් මූල්‍ය සහ මිල ස්ථායිතාවයේ වැඩිදියුණුවක් ඇති කෙරෙන පරිදි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සකස්

කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කෙරිණි. අඩු චංචලතාවයක් සහිත ඒක්ෂණ වෙළෙඳපොළෙහි පොලී අනුපාතිකයන්, තරමක් ඉහළ ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකයන් සහ භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකයන්ද සහිත සාපේක්ෂ වශයෙන් ස්ථාවර මුදල් වෙළෙඳපොළක් ඇතිවීම මෙහි ප්‍රතිඵලයකි. 1998 දෙවන භාගය තුළදී යම් ප්‍රමාණයකින් ණය සැපයීමෙහි වූ මඳ වර්ධනය සහ විදේශීය අරමුදල් ගලාඒම්ද නිසා වෙළෙඳපොළ සාමාන්‍ය වශයෙන් ද්‍රවශීල විය. මෙම ද්‍රවශීලතාව ඇති බව බොහෝ ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල පැවැති මහජන අධි දයකත්ව මගින් පිළිබිඹු කරයි. නොවැම්බර් මාසයේදී මහ බැංකුවේ ප්‍රතිවිකුණුම් පහසුකම නැවත ඇතිකරලීමද වෙළෙඳපොළ ස්ථායී කිරීමට සහ පොලී අනුපාතිකයන්හි අහේතුක ඉහළයාම යටපත් කොට තබා ගැනීමටද උපකාරී විය. වෙළෙඳපොළ කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන්නාවූ ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය සහ ප්‍රතිවට්ටම් අනුපාතිකය යොදු ගනිමින් ද්‍රවශීලතා කළමණාකරණය සඳහා යන්ත්‍රනයක් ලෙස විවට වෙළෙඳපොළ ක්‍රියාකාරකම් නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. දින හතකින් කල්පිරෙන මහ බැංකු සුරැකුම්පත් වෙළෙඳපොළෙහි තිබුණ නමුදු වාණිජ බැංකු විසින් මෙම පහසුකම ප්‍රයෝජනයට ගැනීම අවම විය. වාණිජ බැංකු සමග ගණුදෙනු සඳහා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළහි වූ මහ බැංකුවේ මධ්‍ය අනුපාතිකය සියයට 10 කින් පමණ අවප්‍රමාණය කෙරිණි. 1997 ට වඩා 1998 දී මඳක් ඉහළ වූ ප්‍රතිමිලදී ගැණුම් අනුපාතික, විදේශ විනිමය මිලදී ගැනීම පිණිස ඒක්ෂණ වෙළෙඳපොළින් අරමුදල් සඳහා ඉල්ලුමක් ඇති වීම සීමා කිරීමට හේතුවිය.

## අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ

සමස්ත පිරිවැටුම රුපියල් දශලක්ෂ 1,015,457 සිට රුපියල් දශ ලක්ෂ 880,566 ක් දක්වා පහත වැටීමත් සමඟ ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි ක්‍රියාකාරිත්වය 1997 ට වඩා 1998 තරමකින් අඩුවිය. ඒක්ෂණ වෙළෙඳපොළ අනුපාතිකයන්හි ද අඩු චංචලතාවක් පැවැතිණි. ප්‍රතිමිලදී ගැණුම් අනුපාතික ඉහළ දැමීම තුළින් බලපෑම් ඇතිකළ තරමක දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයන් ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පොලී අනුපාතිකයන්හි පහළ සීමාව ඉහළ නැංවීමට ඉඩ සලසා දුණි. වසරේ මුල් කාලය තුළදී වෙළෙඳපොළෙහි පැවැති ඉහළ ද්‍රවශීලතාව පිළිබිඹු කරමින් ඒක්ෂණ වෙළෙඳපොළ පොලී අනුපාතික 1997 දෙසැම්බර් අවසානයේදී පැවති සියයට 12.00-20.00 පරාසයකට සංසන්දනාත්මකව 1998 පළමු මාස දෙක තුළදී සියයට 11.00 - 16.50 ක පහළ සහ පටු මට්ටමකට පහත වැටෙමින් 1998 මාර්තු අවසානයේදී සියයට 12.00 - 12.75 ක මට්ටමක පැවතුණි. දෙවන කාර්තුව තුළදී, ඒක්ෂණ මුදල් අනුපාතික 1998 ජුනි අවසානයේදී පටු පරාසයක් තුළ සුළු උච්චාවචනයක් සහිතව වූ අතර 1998 ජුනි මස අවසානයේදී

**10.15 සංඛ්‍යා සටහන**

**මුදල් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය 1996 - 1998**

රුපියල් දශලක්ෂ

| කාලච්ඡේදය | ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ | | ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ | | | | | | ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ (මහ බැංකුව) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ණයට දීම්/ ණයට ගැනීම් | කාලච්ඡේදය අවසානයට නොපියවූ ප්‍රමාණය(අ) | නොපියවා පැවති මුළු බිල්පත්(අ) | නිකුත් කළ ප්‍රමාණය | පිළිගත් ප්‍රමාණය (මිලදී ගැනීම්) මහ බැංකුව | වාණිජ බැංකු | අනෙකුත් | එකතුව | මුළු විකුණුම් | මුළු මිලදී ගැනීම් |
| **1996** | | | | | | | | | | |
| 1 කාර්තුව | 217,697 | 2,390 | 120,021 | 52,025 | 3,560 | 27,170 | 21,295 | 52,025 | 9,384 | 795 |
| 2 කාර්තුව | 191,406 | 4,792 | 122,821 | 50,009 | 8,586 | 27,285 | 14,138 | 50,009 | 1,710 | 3,871 |
| 3 කාර්තුව | 233,790 | 3,977 | 124,521 | 58,819 | 9,502 | 33,021 | 16,296 | 58,819 | 1,975 | 5,854 |
| 4 කාර්තුව | 301,921 | 6,862 | 124,996 | 66,027 | 2,753 | 42,362 | 20,912 | 66,027 | 3,043 | 6,301 |
| **1997** | | | | | | | | | | |
| 1 කාර්තුව | 303,208 | 4,811 | 124,996 | 56,629 | 9,304 | 30,179 | 17,146 | 56,629 | 7,222 | 4,027 |
| 2 කාර්තුව | 275,508 | 5,830 | 124,996 | 38,609 | 7,863 | 22,452 | 8,294 | 38,609 | 4,373 | 4,433 |
| 3 කාර්තුව | 224,566 | 1,853 | 114,996 | 46,676 | 3,886 | 25,776 | 17,014 | 46,676 | 5,936 | 1,563 |
| 4 කාර්තුව | 212,175 | 3,599 | 114,996 | 68,973 | 4,245 | 44,906 | 19,822 | 68,973 | 1,289 | 7,197 |
| **1998** | | | | | | | | | | |
| 1 කාර්තුව | 210,509 | 4,141 | 112,996 | 56,717 | 7,175 | 32,321 | 17,221 | 56,717 | 2,218 | 10,491 |
| 2 කාර්තුව | 196,668 | 2,734 | 114,996 | 50,086 | 6,398 | 28,254 | 15,434 | 50,086 | 4,062 | 4,143 |
| 3 කාර්තුව | 241,206 | 5,759 | 117,996 | 53,542 | 6,924 | 32,825 | 13,793 | 53,542 | 3,373 | 123 |
| 4 කාර්තුව | 232,184 | 4,272 | 119,996 | 70,338 | 5,502 | 44,740 | 20,096 | 70,338 | 1,738 | 105 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සෑම කාර්තුවකම අවසාන සතිය අවසානයට පැවති ප්‍රමාණය.

සියයට 12.13-12.75 ක්වූ පරාසයක් තුළ පැවැතිණ. ජූලි මසදී වෙළෙඳපොළ තුළ වූ තාවකාලික ද්‍රවශීල ඌණතාවය, ජූලි 30 වැනි දින අනුපාතික සියයට 28.00 උච්චස්ථානයකට ගමන් කළ අතර, එය 1998 දී අනුපාතිකයේ වාර්තාගත වූ ඉහළම අගය විය. ඉන්පසුව, පොලී අනුපාතික සැප්තැම්බර් තුළදී සියයට 12.25-17.25 පරාසයකට පහත වැටිණ. 1998 අවසාන කාලය තුළදී විදේශීය අරමුදල් රට තුළට ගලාඒම, දෙසැම්බර්හිදී එම අනුපාතික සියයට 11.25-16.50 අතර පරාසයකට පහත වැටීමට හේතුවිය. වසර අවසානයේදී අනුපාතික සියයට 13.00-14.00 අතර ඉතා පටු පරාසයක් තුළ පැවැතිණ.

## ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

විශේෂිත වශයෙන් 1997 දෙවන භාගයේදී භාණ්ඩාගාර බිල්පත් ඵලද අනුපාතිකයන්හි නිරීක්ෂණය වූ පහළයාමේ ප්‍රවනතාවයට වෙනස්ව 1998 දී ඵලද අනුපාතික මඳ වශයෙන් ඉහළ යාමේ නැඹුරුවක් ඇති විය. කෙසේ නමුදු සාමාන්‍ය වශයෙන් වෙළෙඳපොළ ද්‍රවශීලවීම නිසා වැඩිමනත් භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අධි සහභාගිත්වයකින් යුක්ත විය. 1997 අවසන් වෙන්දේසියේදී ත්‍රෛමාසික හා දෙළොස් මාසික භාණ්ඩාගාර බිල්පත් ඵලද අනුපාතික පිළිවෙලින් සියයට 9.97 සහ සියයට 10.21 ක්ව පැවැති, ජූනි අවසාන වනවිට පිළිවෙලින් සියයට 11.75 සහ සියයට 12.09 දක්වා ක්‍රමිකව වර්ධනය විය. 1998 අවසාන වෙන්දේසියේදී ඵලද අනුපාතික තවදුරටත් පිළිවෙලින් සියයට 12.01 ක් සහ සියයට 12.59 දක්වා වර්ධනය විය. ඵලද අනුපාතිකයන්හි ඉහළයාම එක්දින ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමේ එක් හේතුවක් විය. මීට අමතරව, වසරේ මුල් කාලයෙහිදී උද්ධමනය වර්ධනයවීම ඵලද අනුපාතිකයන්ගේ ඉහළයාමට දායක වූවා විය හැක. කෙටිකාලීනව කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් සහ දිගුකාලීනව කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත්වල ඵලද අනුපාතිකයන් අතර පරතරය පටු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වසරේ බොහෝ කාලයක් මුළුල්ලෙහිම සමතල ඵලද වක්‍රයක් ඇතිවිය. 1997 දී පෞද්ගලීකරණය තුළින් ලබාගත් මුදල් ප්‍රයෝජනයට ගෙන රුපියල් දශ ලක්ෂ 10,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් ගෙවා පියවීම කිරීම අනුගමනය කරමින්, 1998 මාර්ත මාසයේදීද තවදුරටත් රුපියල් දශ ලක්ෂ 2,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් ගෙවා පියවන ලදී. කෙසේ නමුදු, භාණ්ඩ හා සේවා බදු අනුපාතිකය ආදායම් මධ්‍යස්ථ අනුපාතිකයට වඩා අඩුවීම හේතුකොටගෙන රජයේ වියදම් වැඩි වූ අතර අයවැයෙහි අපේක්ෂිත වූ ප්‍රමාණයට වඩා ආදායම අඩුවිය. මෙය අතිරේක මූල්‍ය අවශ්‍යතාවයන් ඇතිකිරීමට හේතුවිය. එමනිසා, රජය විශ්‍රාම ගන්වන ලද රුපියල් දශ ලක්ෂ 2,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නැවත නිකුත් කළ අතර, තවදුරටත් 1997 දී පියවා දමන ලද බිල්පත් වලින් රුපියල් දශ ලක්ෂ 5,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත්ද නැවත නිකුත් කරන ලදී. මේ නිකුත් කිරීම් තුළින් වෙළෙඳපොළ තුළ ඇති විය හැකි අයහපත් තත්ත්වය වළක්වාලීම පිණිස, මහ බැංකුව විසින් මේවා මිලට ගන්නා ලදී. ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ තුළ වූ මෙම වර්ධනයන් නිසා 1997 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 114,996 ක් වූ නොපියවන ලද මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1998 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 119,996 ක් විය.

මුදල් වෙළෙඳපොළ අනුපාතික ස්ථාවර තත්ත්වයක පවත්වා ගැනීමේ අරමුණ ඇතිව, ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියට පෙරාතුව, භාණ්ඩාගාර බිල්පත් නැවත නිකුත් කිරීමේදී මහ බැංකුව වෙනුවෙන් වෙන්කර තබන ලද රුපියල් දශ ලක්ෂ 11,660 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් ද ඇතුලත්ව මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් රුපියල් දශ ලක්ෂ 25,999 ක භාණ්ඩාගාර බිල්පත් මිලට ගන්නා ලදී. කෙසේ නමුදු, මෙම මිලදී ගැනීම් පසුව මුළුමනින්ම මෙන් වෙළෙඳපොළට යොමු කළ අතර, මින් 1997 අවසානයේදී මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් රඳවා ගැනීම්හි පොත් අගය වූ රුපියල් දශ ලක්ෂ 6,691 කට සංසන්දනාත්මකව 1998 දී රුපියල් දශ ලක්ෂ 8,233 ක් විය. පෙර වසරේදී ප්‍රාථමික වෙළෙඳපොළට පිරිනමන ලද රුපියල් දශ ලක්ෂ 194,866 ක් වටිනාකමකින් යුක්ත වූ මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයට එරෙහිව 1998 දී ඉදිරිපත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 217,022 ක් විය.

## භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවේ ද්විතීයික වෙළෙඳපොළ

පෙර වසරේදී මහ බැංකුවේ ද්විතීයික කවුළුව වෙතින් භාණ්ඩාගාර බිල්පත් අලෙවියෙන් ලද මුදල වූ රුපියල් දශ ලක්ෂ 18,821 හා සංසන්දනාත්මකව 1998 දී ලද මුදල රුපියල් දශලක්ෂ 11,390 ක් (සියයට 39.5 ක අඩුවීමක්) විය. මේ අතර, භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම් (ප්‍රතිවට්ටම් කිරීම) ද 1997 දී රුපියල් දශලක්ෂ 17,220 සිට 1998 දී රුපියල් දශලක්ෂ 14,862 දක්වා පහත වැටුණි.

පෙරදී මෙන්, මහ බැංකුවේ වට්ටම් හා ප්‍රතිවට්ටම් අනුපාතික කෙටිකාලීන පොලී අනුපාතික මත වැදගත් සංඥ දීමේ උපකරණයන් විය. මේ අතර, වෙළෙඳපොළ ද්‍රවශීල තත්ත්වයට බලපෑම් කිරීම පිණිස මහ බැංකුවේ ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් සඳහා වට්ටම් සහ ප්‍රතිවට්ටම් අනුපාතික අතර පරතරය ද සංශෝධනය කරන

ලදී. එංවල විදේශීය විනිමය වෙළෙඳපොළක් තුළ වාණිජ බැංකු විසින් සමපේක්ෂණ කටයුතු සඳහා අඩු පිරිවැයක් සහිත ද්‍රවශීලතා ලබා ගැනීමට භාණ්ඩාගාර බිල්පත් මහ බැංකුවට අලෙවි කිරීම අධෛර්යමත් කිරීමට සහ මූල්‍ය තත්ත්වය දැඩි කිරීමට ජනවාරි මාසයේදී ආන්තිකයන් ප්‍රතිශතාංක 3.25 සිට 4.25 ක් දක්වා පියවර දෙකකින් ඉහළ නැංවිණ. පෙබරවාරි මාසයේදී විදේශීය විනිමය වෙළෙඳපොළෙහි ස්ථාවරභාවයෙහි යම් ප්‍රගතියක් දක්නා ලදී. වාණිජ බැංකු මහ බැංකුව වෙතින් විදේශීය ව්‍යවහාර මුදල් ලබා ගැනීම නැවැත්වූ අතර, පෙබරවාරි මාසයේදී පළමු මුල් සති කිහිපයේදී ඩොලර් සඳහා අන්තර් බැංකු විනිමය අනුපාතික අතිප්‍රමාණය කරන ලදී. එහෙයින්, පෙබරවාරි 20 වැනි දින භාණ්ඩාගාර බිල්පත් වට්ටම් සහ ප්‍රතිවට්ටම් අතර අනුපාතිකයන්හි පරතරය ප්‍රතිශතාංක 4.00 දක්වා අඩු කරන ලදී. වසර තුළදී කිහිප වරක්ම පරතරය වෙනස් කරන ලද අතර, එය 1998 අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් අවසානය දක්වා කාලය තුළදී ප්‍රතිශතාංක 3.15 ක් විය. සම්පූර්ණ වසරම සලකා බලන විට, මහ බැංකුවේ ද්විතීයික කවුළුව තුළ පොලී අනුපාතිකයන් තුළද ප්‍රතිශතාංක දෙකක පමණ සාමාන්‍ය වර්ධනයක් දැකිය හැකි විය. ත්‍රෛමාසික බිල්පත් සඳහා වූ වට්ටම් සහ ප්‍රතිවට්ටම් අනුපාතික 1998 අවසානයේදී සියයට 11.86 සහ සියයට 15.01 දක්වා පිළිවෙලින් ඉහළ ගිය අතර, 1997 දී ඒවා පිළිවෙලින් සියයට 9.72 සහ සියයට 12.97 ක් විය.

## භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැණුම් වෙළෙඳපොළ

1998 දී ද්‍රවශීලතා කළමනාකරණය පිණිස මහ බැංකුව විසින් ප්‍රයෝජනයට ගනු ලැබූ ප්‍රධාන උපකරණයන්ගෙන් එකක් ලෙස එක්දින ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය අඛණ්ඩව ක්‍රියාත්මක විය. මහ බැංකුව ඒක්ෂණ වෙළෙඳපොළ අනුපාතික ස්ථායී කිරීමට විශේෂිත ලෙස අනුපාතිකයන්හි පහත් සීමාව ස්ථායී කිරීමට ප්‍රතිමිලදී ගැණුම් ගණුදෙණුවල නිරත විය. 1997 පසු භාගයේදී නැගෙනහිර ආසියානු අර්බුදය හේතුවෙන් ඇති වූ විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සැලකිය යුතු අවිනිශ්චිතතාවය ශ්‍රී ලංකාවේ විදේශීය විනිමය වෙළෙඳපොළ තුළ සමපේක්ෂණ කටයුතු සඳහා යොමුවෙමින් 1998 දී ද අඛණ්ඩව සිදු විය. මෙම තත්ත්වය අධෛර්යවත් කිරීමට සහ 1998 මුල් කාලයෙහිදී වූ උද්ධමනය වැඩිවීම හේතුවෙන්, එක් දින ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය 1997 අවසානයේදී වූ සියයට 11.00 සිට 1998 ජනවාරියේදී සියයට 12 ක් දක්වා ඉහළ නැංවූ අතර, එය දේශීය වත්කම් විදේශීය වත්කම්වලට ව්‍යුහාත්මක වශයෙන් සිදුවන විතැන්වීම වලක්වාලීම පිණිස සාපේක්ෂ වශයෙන් වසරේ බොහෝ කාලයක් තුළදී ඉහළ මට්ටමක තබාගනු ලැබිණ. වසර අවසාන වන විට විනිමය අනුපාතික මත පීඩනය අඩු කරවීමත්, දේශීය උද්ධමනකාරී පීඩනය පහළයාමටත්, ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය පහත හෙළීමට ඉඩ සලස්වන ලදී. මහ බැංකුවට අවස්ථා කිහිපයකින් ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය අඩු කිරීමට හැකියාව ලැබුණ අතර එය දෙසැම්බර් අවසානයේදී සියයට 11.25 ක් විය. මහ බැංකුව විසින් ප්‍රතිමිලදී ගැණුම් අලෙවිය 1997 දී රුපියල් දශ ලක්ෂ 446,423 ක සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 728,335 ක් දක්වා ඉහළ නැගුණි.

## භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවේ ප්‍රතිවිකුණුම් වෙළෙඳපොළ

ඒක්ෂණ වෙළෙඳපොළ පොලී අනුපාතික පරාසයෙහි ඉහළ සීමාව ස්ථායී කිරීමේ අදහස ඇතිව, මහ බැංකුව විසින් 1995 නොවැම්බර් මාසයේදී ප්‍රතිවිකුණුම් පහසුකම හඳුන්වා දෙන ලදී. වෙළෙඳපොළෙහි ව්‍යුහාත්මක දුර්වලතාවයන් සහ ද්‍රවශීල සැපයුම් ප්‍රමාණයන්හි සීමාකම් නිසා එම පහසුකම හඳුන්වාදීමේ දී බලාපොරොත්තු වූවාට වඩා අඩු ප්‍රතිඵලදායී විය. මෙම පහසුකම ප්‍රයෝජනයට ගැනීම ක්‍රමයෙන් අත්හැර දමුන අතර, 1996 සහ 1997 තුළදී එම පහසුකම ලබා නොදෙන ලදී. මෙවැනි පහසුකමක අවශ්‍යතාවක් නොමැති බව 1997 දී වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතාව පැවැතීමෙන් පැහැදිලි විය. මහ බැංකුව මුදල් වෙළෙඳපොළ තුළ කෙටි-කාලීන අනුපාතික ස්ථායී කිරීම සඳහා 1998 නොවැම්බර් 09 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිවිකුණුම් පහසුකම නැවත හඳුන්වා දෙන ලදී. සියලුම වාණිජ බැංකු සහ රජයේ සුරැකුම්පත් සඳහා වාණිජ බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන් මෙම පහසුකම ප්‍රයෝජනයට ගැනීම සඳහා සුදුසු ලෙස සැලකුණි. වර්තමානයේදී, මෙම පහසුකම යටතේ එක්දින අරමුදල් පමණක් සපයාදෙනු ලැබේ. ද්‍රවශීලතා ලබා ගැනීමේ ප්‍රමාණය කෙරෙහි මෙහි සීමාවක් නැතත් එවැනි අරමුදල් භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර යන ඇපයන්ට එරෙහිව පමණක් මෙම පහසුකම සපයනු ලැබේ. ප්‍රතිවිකුණුම් අනුපාතික මහ බැංකුව විසින් දෛනික පදනම මත තීරණය කරමින් එය වෙළෙඳපොළෙහි ප්‍රකාශයට පත් කරනු ලැබේ. දැනට මෙම අනුපාතිකය මහ බැංකුවේ ද්විතීයික කවුළුවෙහි පවතින ප්‍රතිවට්ටම් අනුපාතිකයට සමාන වේ. වාර්තාගත වූ ප්‍රතිවිකුණුම් ගණුදෙනු ප්‍රමාණය 2 ක් පමණක් වූ අතර ඒවා නොවැම්බර් 27 දින සහ දෙසැම්බර් 01 වැනි දින සියයට 15.45 ක අනුපාතිකයට පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 731 ක් සහ රුපියල් දශ ලක්ෂ 334 ක ප්‍රමාණයක් සඳහා විය.

## දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ

එක්සත් ජනපද ඩොලරය මැදිහත් වීමේ මුදල් වර්ගය ලෙස නොකඩවා ක්‍රියාත්මක වූ අතර, මහ බැංකුව විසින්

වාණිජ බැංකු සමග ගණුදෙනු කිරීම පිණිස දිනපතා ඩොලරය සඳහා වන එතැන් ගැණුම් සහ විකුණුම් අනුපාතික ප්‍රකාශයට පත් කරන ලදී. 1995 සිට එතැන් ගැණුම් සහ විකුණුම් අනුපාතිකය අතර පරතරය සියයට 2 ක් විය. මහ බැංකුවේ එක්සත් ජනපද ඩොලරයක් සඳහා මධ්‍ය අනුපාතිකය 1997 පැවැති රුපියල් 61.2850 කට එරෙහිව 1998 දී රුපියල් 67.7800 ක් වූ අතර එය සියයට 9.6 කින් අවප්‍රමාණය වීමකි.

මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙතින් එක්සත් ජනපද ඩොලර් මිලට ගැනීම 1997 දී රුපියල් දශ ලක්ෂ 137 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 61 ක් දක්වා පහත වැටිණ. මේ අතර, මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට එක්සත් ජනපද ඩොලර් විකුණුම් 1997 දී වූ එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 155 ක ප්‍රමාණයට එරෙහිව 1998 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 215 ක් විය. ඒ අනුව, මහ බැංකුව වෙතින් වාණිජ බැංකු විසින් ශුද්ධ විදේශ විනිමය මිලට ගැණුම් 1997 දී වූ එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 18 කට එරෙහිව 1998 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 154 ක් විය. මුළු අන්තර් බැංකු පිරිවැටුම 1997 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 3,881 ක සිට 1998 දී එක්සත් ජනපද ඩොලර් දශලක්ෂ 4,409 ක් දක්වා වර්ධනය විය. කෙසේ නමුදු, 1997 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1,606 ක් වූ ඉදිරි ගණුදෙනු 1998 දී එක්සත් ජනපද ඩොලර් 696 ක් දක්වා පහත වැටිණ.

1997 ජනවාරි මාසයේදී හඳුන්වාදුන් ආයෝජන මණ්ඩලය යටතට නොවැටෙන අපනයන කරුවන් සඳහා වානිජ බැංකුවල දේශීය ඒකක හෝ වි.ව්‍ය.මු.බැ. ඒකක මගින් විදේශීය මුදල් ණය ප්‍රදානය කිරීමට අවසර ලැබුණු ණය ක්‍රමය 1998 දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. කෙසේ නමුදු, විදේශ විනිමය වෙළෙඳපොළෙහි නොකඩවා ක්‍රියාත්මක වූ චංචලතාවයද සාපේක්ෂ වශයෙන් පැවැති පහළ දේශීය පොලී අනුපාතිකයන්ද නිසා මෙම පහසුකම ආයෝජන මණ්ඩලය යටතේ නොවන අපනයනකරුවන් ප්‍රයෝජනයට ගත්තේ 1997 වසරට වඩා මඳ වශයෙනි. මෙම වැඩ පිළිවෙල යටතේ ප්‍රදානය කරන ලද ණය 1997 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 254 ක් (ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 15,017 ක්) හා සංසන්දනාත්මකව 1998 දී එක්සත් ජනපද ඩොලර් 177 ක් (ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 11,425 ක්) විය. එහෙයින්, මෙම ක්‍රමය යටතේ 1998 දෙසැම්බර් අවසානය දක්වා දළ වශයෙන් එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 431 ක් ප්‍රදානය කර තිබුණි. 1998 දෙසැම්බර් අවසානයේදී නොපියවා තිබූ ණය ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 44 ක් විය.

## මහ බැංකු සුරැකුම්පත්

මහ බැංකු සුරැකුම්පත් වාණිජ බැංකුවලට සහ ප්‍රාථමික වෙළෙඳුන්හට වසර පුරා අවශ්‍ය වූ විට ගතහැකි පරිදි තිබිණි. ප්‍රදානය කරන ලද සුරැකුම්පත් දින හතකින් කල්පිරෙන කෙටිකාලීන ඒවා විය. කෙසේ නමුදු, මෙම සුරැකුම්පත් සඳහා ඉතා සුළු ඉල්ලුමක් පැවැති අතර 1997 දී මුළු නිකුතුන් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 7,835 කට සංසන්දනාත්මකව 1998 දී නිකුතුන් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 40 ක් පමණක් විය. සුරැකුම්පත් සම මිලට අලෙවි කළ අතර, ඒ සඳහා වූ පොලී අනුපාතිකය දින 7 ප්‍රතිමිලදී ගැණුම් සඳහා පැවැති අනුපාතිකයට සමාන විය. 1998 දී පොලී අනුපාතික වසරකට සියයට 11.93 - 12.06 අතර පරාසයක විය.

## වාණිජ පත්‍ර

වාණිජ පත්‍ර 1993 දී මුල් නිකුතුව සිදුවූ තැන් පටන් ශ්‍රී ලංකාවේ ආයතනික අංශය තුළ ඉතා ප්‍රචලිත උපකරණයක් බවට පත්ව ඇත. වාණිජ පත්‍ර ජනප්‍රියභාවයට පත්වීමට මූලික වශයෙන් බලපාන ලද්දේ සමාගම්වල කෙටිකාලීන ද්‍රවශීල අවශ්‍යතා සිත්ගන්නා සුළු පොලී අනුපාතිකයන් යටතේ ඉටුකර ගැනීමට හැකිවීම නිසාය. ලැයිස්තුගත සමාගම් මෙන්ම වණික් බැංකු විසින්ද කල්පිරීමේ කාලය මාස 3-6 දක්වා වන වාණිජ පත්‍ර නිකුත් කරනු ලැබේ. වාණිජ පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් නිකුත් කර ඇති උපදෙස් වලට යටත්ව සහාය දීමට මෙම නිකුතුවලදී වාණිජ බැංකුවලට හැකි වේ.

නැවත නිකුත් කිරීම්ද ඇතුලත්ව 1998 වසරේදී දළ වාණිජ පත්‍ර නිකුත් කිරීම් රුපියල් දශ ලක්ෂ 16,457 ක් විය. (මෙම නිකුතුන් වාණිජ බැංකු හෝ වණික් බැංකුවල මැදිහත්වීම යටතේ පමණක් නිකුත් කරනු ලැබූ ඒවාය). 1998 වර්ෂය තුළදී වණික් බැංකු විසින් රුපියල් දශ ලක්ෂ 1,702 ක් වටිනා ඔවුන්ගේ වාණිජ පත්‍ර නිකුත් කළ අතර රුපියල් දශ ලක්ෂ 2,446 ක් වටිනා වාණිජ පත්‍ර නිකුත් කිරීම සඳහා සමාගම්වලට සහාය විය. කෙසේ වුවද, වාණිජ පත්‍ර නිකුත් කිරීම් වලින් විශාල ප්‍රමාණයක් එනම් රුපියල් දශ ලක්ෂ 12,309 ක් නිකුත් කරන ලද්දේ වාණිජ බැංකුවල සහාය ඇතිවය. 1998 අග වනවිට නොපියවා ඉතිරිව පැවති වාණිජ පත්‍රවල අගය රුපියල් දශ ලක්ෂ 4,286 ක් විය. වර්ෂය තුළදී, වාණිජ පත්‍ර සඳහා වූ එළද අනුපාතිකය වර්ෂයකට සියයට 11.00-18.02 පරාසයක් තුළ පැවතුණි.

## 10.12 ප්‍රාග්ධන වෙළෙඳපොළ

1998 මුල් මාස කිහිපය තුළදී කොළඹ කොටස් වෙළෙඳපොළ තරමක් දුරට යථා තත්ත්වයට පත්වුවද, මුළු වර්ෂයම සමස්තයක් ලෙස බලනවිට වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයෙහි සහ කොටස් මිල ගණන්වල පහත බැසීමේ ප්‍රවනතාවය තවදුරටත් දක්නට ලැබුණි. මෙයට මූලික

වශයෙන් හේතුවූයේ විශේෂයෙන් ආසියානු කලාපය තුළ තවදුරටත් දක්නට ලැබුණු අයහපත් ආර්ථික සහ මූල්‍ය තත්ත්වයන්ය. 1997 ජූලි මස ආරම්භ වූ නැගෙනහිර ආසියානු අර්බුදයෙහි බලපෑම 1998 වර්ෂය තුළදීද පැවති අතර විදේශීය ආයෝජකයින් සමස්ත කලාපයම සම්බන්ධව ඔවුන්ගේ රුචියාව අඩුකළ නිසා කොළඹ ඇතුළු කලාපීය කොටස් වෙළෙඳපොළවලට අයහපත් බලපෑමක් ඇතිවිය. දෙවනුව, 1998 මැයි මසදී ඉන්දියාව සහ පකිස්තානය න්‍යෂ්ටික අවි පරීක්ෂණ සිදුකිරීම විදේශීය ආයෝජන අභිප්‍රායයන් අඩුවීමට බලපාන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් දකුණු ආසියානු වෙළෙඳපොළවලින් ආයෝජන ඉවත්කර ගැනීම සිදුවිය. මෙයට අමතරව, 1998 අගෝස්තු මස ඇරඹුන රුසියානු මූල්‍ය අර්බුදය, රුසියාව විසින් සිය ණය ආපසු ගෙවීම කල් දැමීමටත් ලංකාවෙන් තේ ආනයන කිරීම අඩුකිරීමටත් හේතු වූ අතර එය වැවිලි සමාගම්වල කොටස් මිල ගණන් කෙරෙහි අයහපත් ලෙස බලපෑවේය. සමස්ත කොටස් මිල දර්ශකය සහ සංවේදී කොටස් මිල දර්ශකය පිළිවෙලින් සියයට 16 කින් සහ සියයට 19 කින් වැඩිවීම් වාර්තා කළ 1997 තත්ත්වයට ප්‍රතිවිරුද්ධව, 1998 දී පිළිවෙලින් සියයට 15 කින් සහ සියයට 13 කින් අඩුවිය. ශුද්ධ විදේශීය ගලායාම් ආසන්න වශයෙන් එ.ජ.ඩොලර් දශලක්ෂ 24 ක් වෙමින්, විදේශීය ආයෝජකයෝ ශුද්ධ විකුණුම්කරුවන් බවට පත්වූහ. වෙළෙඳපොළ ප්‍රාග්ධනී-කරණයද සියයට 10 කින් අඩුවිය. කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව 1998 දී ශුද්ධ වශයෙන් එකකින් වැඩිවිය. වැවිලි සමාගම් හතරක් සිය කොටස් අලෙවිය සඳහා මහජනයාට ඉදිරිපත් කළ අතර වර්ෂය තුළදී එක් වැවිලි සමාගමක් සහ පෞද්ගලික සමාගමක් විසින් මූලික (ප්‍රාථමික) නිකුතුන් සිදුකරන ලදී. වැවිලි සමාගම්වල ආයෝජනය කිරීමට මහජනයාගේ ඇති කැමැත්ත තවදුරටත් පෙන්නුම් කරමින් අලෙවිය සඳහා ඉදිරිපත් කළ සියළු කොටස් සහ මූලික නිකුතුවෙහි කොටස් සඳහා අධි දයකත්වයක් පැවතුණි. හෝටල් අංශයෙහි පෞද්ගලික සමාගමෙහි මූලික නිකුතුව ද අධි දයකත්වයකින් යුක්ත විය.

ආයතනික ණය වෙළෙඳපොළෙහි ක්‍රමික වර්ධනය තවත් දිරිගන්වන සුළු ලක්ෂණයක් විය. වාණිජ බැංකු 3 ක් සහ පෞද්ගලික සමාගම් 3 ක් මහජනයාට ණයකර නිකුතුන් 7 ක් සිදු කරන ලද අතර ඒවා කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කෙරුණි. 1998 වර්ෂය අගදී මුළු ලැයිස්තුගත සමාගම් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,703 ක් විය. බොහෝ දියුණු මූල්‍ය වෙළෙඳපොළවල්වල ණය උපකරණවල වටිනාකම කොටස්වල වටිනාකම අභිබවා යයි. මූල්‍ය වෙළෙඳපොළ පුළුල් වීමත්, ඉතිරිකරන්නන්ට නව ආයෝජන

**10.16 සංඛ්‍යා සටහන**
**කොටස් වෙළෙඳපොළ දර්ශකයන්**

| | | 1996 | 1997 | 1998 |
|---|---|---|---|---|
| 1. | වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු.දශලක්ෂ) | 104,197 | 129,428 | 116,660 |
| 2. | නව නිකුතුන් සංඛ්‍යාව | 8 | 5 | 6 |
| 3. | නිකුත් කළ මුළු කොටස් සංඛ්‍යාව (දශලක්ෂ) | 64 | 50 | 28 |
| 4. | නිකුත් කළ කොටස්වල වටිනාකම (රු.දශලක්ෂ) | 2,178 | 456 | 349 |
| 5. | අලෙවි කළ කොටස් සංඛ්‍යාව (දශ ලක්ෂ) | 227 | 515 | 634 |
| 6. | අලෙවි කළ කොටස්වල වටිනාකම (රු.දශලක්ෂ) | 7,403 | 18,315 | 18,130 |
| 7. | මිල දර්ශක | | | |
| | සියළු කොටස් මිල දර්ශකය (දෙසැ.31 දිනට) | 603.0 | 702.2 | 597.3 |
| | සංවේදී කොටස් මිල දර්ශකය (දෙසැ.31 දිනට) | 897.7 | 1,068.0 | 923.0 |


මූලය : කොළඹ කොටස් හුවමාරුව

මාර්ග සැපයීමත්, සමාගම්වලට සිය අරමුදල් වර්ධනය කර ගැනීමට නව අවස්ථා සැලසීමත් නිසා කොළඹ වෙළෙඳ-පොළෙහි වර්ධනය යහපත් ලක්ෂණයක් විය.


තුන්වැනිව, වෙළෙඳපොළ පදනම් කරගත් රජයේ බැඳුම්කර තවදුරටත් වර්ධනය වීම දක්නට ලැබුණි. වෙළෙඳපොළ අරමුණු කරගත් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම ඇරඹුන 1997 දී මුළු නිකුත් කිරීම් වටිනාකම රුපියල් දශ ලක්ෂ 10,000 ක් විය. 1998 දී නිකුත් කළ මුළු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රුපියල් දශ ලක්ෂ 38,915 ක් දක්වා වැඩිවිය. කූපන් අනුපාතිකයක් (Coupon Rate) සහිත, වෙන්දේසියක් මගින් අලෙවි කරන මෙම බැඳුම්කර, අවුරුදු 2, 3 සහ 4 වශයෙන් කල්පිරෙන ඒවා විය.

**10.6 රූප සටහන**
**කොටස් වෙළෙඳපොළ දර්ශක**


10.6.1 රූප සටහන
**කොටස් මිල දර්ශක (1985-100)**




10.6.2 රූප සටහන
**කොටස් වෙළෙඳපොළ ගණුදෙනු**




10.6.3 රූප සටහන
**දේශීය නොවන සහභාගීත්වය**




ශුද්ධ මිලදී ගැනීම්

අන්තර්ජාතික වශයෙන් බලන විට, ශ්‍රී ලංකාවේ සමාගමක් අන්තර්ජාතික කොටස් නිකුතුවක් සිදු කළ අතර තවත් සමාගමක් වල අනුපාතික නෝට්ටු නිකුත් කළේය. එම නිකුතුන් දෙකම අධි දයකත්වයකින් යුක්ත විය.

## ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ

1998 වසර තුළදී, හෝටල් අංශයේ සමාගමක් වන සීමාසහිත රෝයල් පාම් බීච් හොටෙල් සමාගම විසින් මූලික කොටස් නිකුතුවක් සිදු කරන ලදී. වර්ෂය තුළදී සීමාසහිත හපුගස්තැන්න වැවිලි සමාගම, සීමාසහිත උඩපුස්සැල්ලාව වැවිලි සමාගම, සීමාසහිත බලංගොඩ වැවිලි සමාගම, සීමාසහිත මඩුල්සිම වැවිලි සමාගම සහ සීමාසහිත කහවත්ත වැවිලි සමාගම යන සමාගම් 5 විසින් සිය කොටස්, අලෙවිය සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම කොටස් නිකුතුන්හි මුළු වෙළෙඳපොළ වටිනාකම (කොටස් අධි මිලද ඇතුලත්ව) රුපියල් දශ ලක්ෂ 349 ක් වූ අතර සංසන්දනාත්මකව 1997 දී කොටස් නිකුතුන් පහක මුළු වෙළෙඳපොළ වටිනාකම රුපියල් දශ ලක්ෂ 583 ක් විය. හිමිකම් නිකුතුන්වල මුළු වටිනාකම 1997 දී රුපියල් දශ ලක්ෂ 1,078 හා සසඳන විට 1998 දී රුපියල් දශ ලක්ෂ 1,960 ක් විය.

**10.17 සංඛ්‍යා සටහන**
**1996-1998 වර්ෂ තුළ ආයෝජන වර්ග අනුව නිකුත් කරන ලද නව කොටස් ගණන**

| | 1996 | 1997 | 1998 |
|---|---|---|---|
| බැංකු මූල්‍ය හා රක්ෂණ | - | 1 | - |
| බීම වර්ග, ආහාර හා දුම්කොළ | 1 | - | - |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | 1 | - | - |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | - | - | - |
| විවිධ | | | |
| පාවහන් හා රෙදිපිළි | - | - | - |
| හෝටල් හා සංචාරක | 1 | 2 | 1 |
| ආයෝජන භාර | - | - | - |
| ඉඩම් හා දේපල | - | - | - |
| නිෂ්පාදන | - | - | - |
| මෝටර් රථ | - | - | - |
| ඔයිල් පාම් | - | - | - |
| වැවිලි | 5 | 2 | 5 |
| සේවා | - | - | - |
| ගබඩා හා සැපයුම් | - | - | - |
| වෙළෙඳ | | | |
| එකතුව | 8 | 5 | 6 |
| ඉදිරිපත් කළ කොටස් ගණන (දශලක්ෂ) | 64 | 50 | 28 |
| ඉදිරිපත් කළ කොටස්වල වටිනාකම (රු.දශලක්ෂ) | 2,178 | 583 | 349 |

මූලය : කොළඹ කොටස් හුවමාරුව

ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් සිදු කළ වල අනුපාතික නෝට්ටු නිකුත් කිරීම සහ සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් සමාගම විසින් සිදු කරන ලද කොටස් නිකුත් කිරීම මගින් වර්ෂය තුළදී අන්තර්ජාතික නිකුතුන් දෙකක් සිදු කරන ලදී. කලාපීය වශයෙන් පසුබෑමක් පැවතියදීත්, මෙම ආයතන දෙක කෙරෙහි විදේශීය ආයෝජකයින්ගේ පැවති විශ්වාසය පෙන්නුම් කරමින් මෙම නිකුතුන් දෙකම සඳහා අධි දයකත්වයක් ලැබුණි. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවෙහි වල අනුපාතික නෝට්ටු නිකුතුවෙහි වටිනාකම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 65 ක් විය. (රුපියල් බිලියන 4.3 ක් පමණ) එ.ජ. ඩොලර් සඳහා වූ මාස 6 අන්තර් බැංකු පිරිනැමුම් අනුපාතිකයට සියයට 2 ක් එකතු කරන ලද වල අනුපාතිකයකට නිකුත් කරන ලද මෙම බැඳුම්කරවල කල්පිරෙන කාලය අවුරුදු 10 ක් විය. මෙම වල අනුපාතික නෝට්ටුවල ප්‍රාග්ධන ආපසු ගෙවීම ආසියානු සංවර්ධන බැංකුව විසින්ද පොළී ගෙවීම් ශ්‍රී ලංකා රජය මගින්ද සහතික කර ඇත. මෙම බැඳුම්කර ලක්ෂම්බර්ග් කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත. සීමාසහිත එයිට්කන් ස්පෙන්ස් සමාගම විසින් කොටස් දශ ලක්ෂ 7 ක් එක් කොටසක් රු.105 බැගින් විදේශීය වෙළෙඳපොළට ඉදිරිපත් කරන ලදී. පොදු රාජ්‍ය මණ්ඩලයීය සංවර්ධන සංස්ථාව සහ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව මෙම කොටස් වල ආයෝජනයන් ප්‍රධාන ආයතනමය ආයෝජකයන් විය. වර්ෂය තුළදී ණය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි කැපීපෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. සමාගම් 6 ක් විසින් ණයකර නිකුතුන් 7 ක් සිදුකරන ලදී. සීමාසහිත සෙලින්කෝ සෙකියුරිටීස් ඇන්ඩ් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගම, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, සීමාසහිත කොමර්ෂල් බැංකුව (නිකුතුන් 2), සීමාසහිත සිලෝන් ග්ලාස් සමාගම, සීමාසහිත සෙලාන් බැංකුව සහ සීමාසහිත වණික් ඉන්කෝපරේෂන්

**10.18 සංඛ්‍යා සටහන**

**1998 වර්ෂය තුළ සමාගම්වල, නව කොටස් නිකුතුන්**

| සමාගම | අයැදුම්පත් කැඳවීමේ දිනය | ඉදිරිපත් කළ කොටස් ගණන (දහස්) | නාමික අගය (රු) | අධි මිල (රුපියල්) | කොටස්වල වටිනාකම (රු.දශලක්ෂ) | මහජනයා විසින් ඉල්ලුම් කරන ලද කොටස් ගණන (දහස්) | ප්‍රාරක්ෂකයින් විසින් මිලදී ගත් කොටස් ගණන (දහස්) |
|---|---|---|---|---|---|---|---|
| 1. සී. ස හපුගස්තැන්න වැවිලි සමාගම | 22.01.98 | 4,000 | 10 | – | 40 | 4,000 | – |
| 2. සී. ස උඩපුස්සැල්ලාව වැවිලි සමාගම | 13.02.98 | 1,900 | 10 | – | 19 | 1,900 | – |
| 3. සී. ස රෝයල් පාම් බීච් හෝටල් සමාගම | 26.03.98 | 10,000 | 10 | 1 | 110 | 10,000 | – |
| 4. සී. ස බලංගොඩ වැවිලි සමාගම | 26.03.98 | 4,000 | 10 | 10 | 80 | 4,000 | – |
| 5. සී. ස. මඩුල්සීම වැවිලි සමාගම | 29.04.98 | 4,000 | 10 | 5 | 60 | 4,000 | – |
| 6. සී. ස. කහවත්ත වැවිලි සමාගම | 08.10.98 | 4,000 | 10 | – | 40 | 4,000 | – |

මූලය : කොළඹ කොටස් හුවමාරුව

එම සමාගම් විය. මෙම නිකුතුන්හි කල්පිරීම අවුරුදු 3 ත්, 5 ත් අතර වූ අතර ඒ සඳහා සියයට 13.5 සිට සියයට 17.5 අතර පරාසයක පොලී අනුපාතික පිරිනැමුනි. නිකුතුන්වලින් වැඩි කොටසක් සඳහා ස්ථාවර පොලී අනුපාතික පැවතියද වල අනුපාතික මත නිකුතුන් දෙකක් සිදුකරන ලදී. කෙසේ වුවද, අවම පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 12.74 ක්ද, උපරිම පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 16 ක්ද වශයෙන් පැවතුනු බැවින් පොලී අනුපාතිකවල විචලනය සීමා වීමක් සිදුව ඇත. සියළුම නිකුතුන් අධි දයකත්වයකින් යුක්ත වූ අතර ඒවායින් ලැබුණු මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,668 ක් විය. මෙම නිකුතුන් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර තිබේ. මේ අතර, රුපියල් බිලියන 1 ක් වටිනා අවුරුදු 10 ණයකර ජාතික ඉතිරිකිරීමේ බැංකුවට නිකුත් කිරීම සඳහා 1998 දෙසැම්බර් මසදී, ලංකා බැංකුව විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමග ගිවිසුමක් ඇතිකර ගන්නා ලදී.

## ද්විතීයික කොටස් වෙළෙඳපොළ

සමස්ත මිල දර්ශකයෙහි සහ සංවේදී මිල දර්ශකයෙහි 1997 ජූලි මස සිට පැවති පහත බැසීමේ ප්‍රවනතාවය 1998 ජනවාරි මස දක්වාම දක්නට ලැබුණි. පෙබරවාරි සිට අප්‍රේල් මාසය දක්වා මිල ගණන්වල යම්කිසි වර්ධනයක්

**10.19 සංඛ්‍යා සටහන**

**1998 වර්ෂය තුළදී ද්විතියික කොටස් වෙළෙඳපොළෙහි අලෙවි වූ කොටස් ආයෝජන වර්ගීකරණය අනුව බෙදීයාම**

| ආයෝජන වර්ගීකරණය | කොටස් ගණුදෙනු ප්‍රමාණය | කොටස් ප්‍රමාණය (දහස්) | වටිනාකම (රුපියල් දශලක්ෂ) |
|---|---|---|---|
| බැංකු මූල්‍ය හා රක්ෂණ | 52,407 | 136,122 | 4,572 |
| බීම වර්ග, ආහාර හා දුම්කොළ | 18,971 | 65,432 | 1,347 |
| ඉදිකිරීම් හා ඉංජිනේරු | 7,810 | 20,847 | 343 |
| රසායන ද්‍රව්‍ය හා ඖෂධ | 3,071 | 3,011 | 85 |
| විවිධ | 8,641 | 21,686 | 3,638 |
| පාවහන් හා රෙදිපිළි | 4,170 | 14,197 | 32 |
| හෝටල් හා සංචාරක | 11,127 | 160,007 | 1,122 |
| ආයෝජන භාර | 1,015 | 3,107 | 210 |
| ඉඩම් හා දේපළ | 3,685 | 14,065 | 86 |
| නිෂ්පාදන | 39,089 | 100,610 | 2,846 |
| මෝටර් රථ | 1,613 | 3,993 | 142 |
| ඔයිල් පාම් | 14 | 3 | 1 |
| වැවිලි | 173,518 | 85,829 | 3,301 |
| සේවා | 1,584 | 1,195 | 43 |
| ගබඩා හා පහසුකම් | 290 | 790 | 29 |
| වෙළෙඳ | 2,063 | 3,240 | 98 |

මූලය : කොළඹ කොටස් හුවමාරුව

දක්නට ලැබුනද, ඉන්පසු මිල ගණන් විශාල වශයෙන් පහත වැටුණ අතර, අගෝස්තු මාසය තුළදී 1991 මැයි මාසයෙන් පසු වාර්තා වූ අඩුම මට්ටම කරා ළඟාවිය. නැගෙනහිර ආසියාවේ ආර්ථික අස්ථාවරභාවය ඉන්දියාව සහ පකිස්ථානය සිදුකළ න්‍යෂ්ටික අවි අත්හදා බැලීම් නිසා තවදුරටත් උග්‍ර බවට පත්වීම මෙසේ මිල පහත බැසීමට විශාල වශයෙන් හේතුවිය. අගෝස්තු මස අග වනවිට සමස්ත මිල දර්ශකය දර්ශක අංක 206 (සියයට 29) කින් සහ සංවේදී මිල දර්ශකය දර්ශක අංක 367 කින් (සියයට 34) පහත බසිමින් පිළිවෙලින් 496 ක් සහ 701 ක් විය. මිල ගණන්වල යම්කිසි වර්ධනයක් සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා දක්නට ලැබුණද ඒවා 1997 දෙසැම්බර් මස පැවති මට්ටමට වඩා පහත මට්ටමක පැවතුණි. වර්ෂය අවසානය වනවිට සමස්ත මිල දර්ශකයෙහි සමස්ත අඩුවීම දර්ශක අංක 105 ක්ද (සියයට 15), සංවේදී මිල දර්ශකයෙහි සමස්ත අඩුවීම දර්ශක අංක 145 ක්ද (සියයට 13) වෙමින් 1998 වසර අගදී පිළිවෙලින් 597 ක් සහ 923 ක් විය.

කොටස් මිල ගණන්වල වෙනස්වීම් අනුව කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය වර්ෂය තුළදී උච්චාවචනය විය. වර්ෂය තුළ පැවති ඉහළම වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය වූ රුපියල් දශ ලක්ෂ 147,900 අප්‍රේල් මාසයෙහි පැවති අතර එය 1997 දෙසැම්බර් මස පැවති රුපියල් දශ ලක්ෂ 129,400 සමග සැසඳීමේදී සියයට 14 ක වැඩිවීමක් පෙන්වීය. ඉන්පසු අගෝස්තු මස අගදී රුපියල් දශ ලක්ෂ 96,100 ක පහත මට්ටමක් දක්වා වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය අඩුවිය. කෙසේවුවද, වර්ෂයෙහි අග මාස 4 තුළදී එය ක්‍රමයෙන් වර්ධනය විය. වර්ෂය සමස්තයක් ලෙස සලකන විට, වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය සියයට 10 කින් අඩුවී 1998 දෙසැම්බර් මස අගදී රුපියල් දශ ලක්ෂ 116,700 ක් විය. ලංකාවේ මුළු වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ අගයෙන් සියයට 40 කට ආසන්න ප්‍රමාණයක් සඳහා ආයතන 10 ක් දයක වේ. ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස්, හැටන් නැෂනල් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, හේලීස්, සිලෝන් ටුබැකෝ, කොමර්ෂල් බැංකුව, නෙස්ලේ ලංකා, එයිට්කන් ස්පෙන්ස් සහ පියෝ බෙවරේජස් වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය අතින් ඉහළම මට්ටමෙහි පැවති ආයතන 10 විය. මේවායින් හතරක් සංවර්ධන බැංකු දෙකද ඇතුළත් වූ මූල්‍ය ආයතනයන් විය.

මුළු පිරිවැටුම 1997 දී රුපියල් දශ ලක්ෂ 18,315 සිට 1998 දී රුපියල් දශ ලක්ෂ 18,130 දක්වා සියයට එකකින් අඩුවිය. වසර දෙක තුළදී සාමාන්‍ය දෛනික පිරිවැටුම රුපියල් දශ ලක්ෂ 76.0 සිට රුපියල් දශ ලක්ෂ 75.5 දක්වා අඩුවිය. රුපියල් දශ ලක්ෂ 2,800 ක්වූ ඉහළම පිරිවැටුම 1998 මැයි මාසයේදී ද රුපියල් දශ ලක්ෂ 688 ක්වූ අඩුම පිරිවැටුම 1998 දෙසැම්බර් මාසයේදීද වාර්තා විය. මුළු පිරිවැටුමෙහි විශාලතම කොටස බැංකු, මූල්‍ය සහ රක්ෂණ අංශයෙන් ලැබුණු අතර එම අංශයේ පිරිවැටුමෙහි සියයට 59 ක් ජාතික සංවර්ධන බැංකුව, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව සහ සම්පත් බැංකුවෙන් විය.

වෙළෙඳපොළ මිල ඉපැයුම් අනුපාතය මිල දර්ශකවල වෙනස්වීම අනුව වෙනස් වූ අතර 1997 අගදී 12.5 සිට 1998 අප්‍රේල් මස අගදී 14.3 දක්වා වැඩිවිය. ඉන්පසු එය ක්‍රමයෙන් අඩු වෙමින් 1998 අගෝස්තු මස අගදී 8.2 වූ නමුත් දෙසැම්බර් මස අගදී 9.00 දක්වා නැවත වර්ධනය විය.


මුළු ආසියානු කලාපයේම සිදුවූ අයුරින්ම, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ද විදේශීය ආයෝජකයින්ගේ සහභාගිත්වය තවදුරටත් අයහපත් බලපෑමට ලක්විය. 1997 වාර්තා වූ ශුද්ධ විදේශීය ලැබීම් රුපියල් දශ ලක්ෂ 716 හා සසඳන විට වර්ෂය තුළ සමස්ත විදේශීය ගණුදෙනුවල රුපියල් දශ ලක්ෂ 1,560 (එ.ජ.ඩොලර් දශ ලක්ෂ 24) ක


## 10.20 සංඛ්‍යා සටහන
## ලැයිස්තුගත ණයකර නිකුත් කිරීම් - 1998

| | නිකුත් කරන්නා | දිනය | පරිණත කාලය | ණයකර වර්ගය | ණයකර සංඛ්‍යාව | ණයකරයක මිල රු. | වටිනාකම රුපියල් දශලක්ෂ | පොලී අනුපාතික % | අධි දයකත්වය/ ඌණ දයකත්වය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | සීමාසහිත සෙලින්කෝ සෙකියුරිටීස් ඇන්ඩ් ෆයිනෑන්සියල් සර්විසස් සමාගම | 19.03.98 | අවු.4 | ආවරණ රහිත නිදහස් කළහැකි | 1,000,000 | 100 | 100 | වර්ෂයකට සියයට 17.5 (අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු) | අධි දයකත්වය |
| | | | | (තෙවැනි වසර අගදී ගැණුම් විකල්පය සහිත) | 182,550 | 100 | 18 | | |
| 2. | සීමාසහිත හැටන් නැෂනල් බැංකුව | 24.06.98 | අවු.5 | ආවරණ රහිත යටත් කළහැකි, නිදහස් කළහැකි | 10,000,000 | 100 | 1000 | වර්ෂයකට සියයට 13.5(කාර්තුමය වශයෙන් ගෙවිය යුතු) | අධි දයකත්වය |
| 3. | සීමාසහිත ලංකා වාණිජ බැංකුව | 06.07.98 | අවු.5 | ආවරණ රහිත යටත් කළහැකි, නිදහස් කළහැකි | 250,000 | 1000 | 250 | වර්ෂයකට සියයට 13.5 (කාර්තුමය වශයෙන් ගෙවිය යුතු) | අධි දයකත්වය |
| 4. | සිලෝන් ග්ලාස් කම්පනි ලිමිටඩ් | 10.07.98 | අවු.3 | නිදහස් කළහැකි ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් සහතික කළ | 500,000 | 100 | 50 | වර්ෂයකට සියයට 13.5 (අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු) | අධි දයකත්වය |
| 5. | සීමාසහිත ලංකා වාණිජ බැංකුව | 28.09.98 | අවු.5 | ආවරණ රහිත යටත් කළහැකි, නිදහස් කළහැකි | 250,000 | 1000 | 250 | ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය + සියයට 1 කට සම්බන්ධ කළ වල අනුපාතික (කාර්තුමය වශයෙන් ගෙවිය යුතු) | අධි දයකත්වය |
| 6. | සීමාසහිත සෙලාන් බැංකුව | 30.09.98 | අවු.5 | ආවරණ රහිත යටත් කළහැකි හා නිදහස් කළහැකි | 3,000,000<br>3,000,000 | 100<br>100 | 300<br>300 | වර්ෂයකට සියයට 13.5(වාර්ෂිකව ගෙවිය යුතු හෝ වර්ෂයකට සියයට 14.37(කාර්තුමය වශයෙන් ගෙවිය යුතු) | අධි දයකත්වය |
| 7. | සීමාසහිත වණිත් ඉන්කෝපරේෂන් | 11.12.98 | අවු.5 | ප්‍රාග්ධන සහතික කළ නිදහස් කළහැකි | 4,000,000 | 100 | 400 | වර්ෂයකට සියයට 15(වාර්ෂිකව ගෙවිය යුතු හෝ වර්ෂයකට සියයට 14.2(කාර්තුමය වශයෙන් ගෙවිය යුතු) | අධි දයකත්වය |
| | එකතුව | | | | 22,182,550 | | 2,668 | | |

ශුද්ධ ගලායාමක් පැවතුණි. විමර්ශනයට ලක්වන කාල-පරිච්ඡේදය තුළදී, විදේශීය සහභාගිත්වය මුළු පිරිවැටුමෙන් සියයට 35 ක් වූ අතර එය පසුගිය වසරේ සියයට 43 ක් විය.

## 10.7 රූප සටහන
## කොටස් මිල ගණන්



## අංශවල ක්‍රියාකාරිත්වය

1998 වර්ෂය තුළ බොහොමයක් අංශයන්හි මිල ගණන් සිත්ඇදගන්නා සුළු නොවීය. මුළු අංශ 16 න් අංශ 12 කම මිල ගණන් පහත වැටුණි. මිල වට්ටම් සියයට 45.6 කින් පහත වැටුණ වැවිලි අංශය වඩාත්ම පසුබෑස්මට ලක්වූ අංශය විය. මෙය ප්‍රධාන වශයෙන්ම රුසියානු අර්බුදය නිසා සිදුවිය. විශාල ලෙස මිල මට්ටම් පහත වැටුණ අනෙකුත් අංශයන් අතර පාවහන් සහ රෙදිපිළි, ආයෝජනභාර, බැංකු, මූල්‍ය හා රක්ෂණ, රසායන ද්‍රව්‍ය හා ඖෂධ, මෝටර් රථ සහ නිෂ්පාදන යන අංශ විය. මිල මට්ටම්වල සියයට 31.7 ක වර්ධනයක් පැවතුණ ගබඩා හා සැපයුම් අංශය ඉහළම වර්ධනයක් ලබාගත් අංශය විය. ඔයිල් පාම්, සේවා සහ බීම, ආහාර සහ දුම්කොළ යන අංශයන්හිද වර්ෂය තුළදී මිල මට්ටම් පහත වැටුණි.

## කලාපීය සහ ප්‍රධාන ජාත්‍යන්තර කොටස් වෙළෙඳපොළවල්

වඩාත් සංවර්ධිත බටහිර රටවල කොටස් වෙළෙඳපොළවල් සාපේක්ෂව ඉහළ වර්ධනයක් ලබා ගත්තද බොහෝ ආසියානු සහ දියුණු වෙමින් පවත්නා වෙළෙඳ-පොලවල්වල පසුබෑස්මක් පැවතුණි. 1998 වර්ෂය තුළ මිල මට්ටම් සියයට 44 කින් පහත වැටුන කරච්චි කොටස් වෙළෙඳපොළ වඩාත් බලපෑමට ලක් වූ වෙළෙඳපොළකි. අනෙකුත් වෙළෙඳපොළවල් අතර කොළඹ (සියයට 15), බොම්බාය (සියයට 18), තායිපේ (සියයට 13), සිංගප්පූරුව (සියයට 12), ටෝකියෝ (සියයට 5), හොංකොං (සියයට 4), ක්වාලාලම්පූර් (සියයට 3), මැනිලා (සියයට 3) සහ බැංකොක් (සියයට 2) මිල පහත වැටීම් වාර්තා කළහ. මේ අතර, සියෝල් (සියයට 54), සිඩ්නි (සියයට 5) සහ ජකාර්තා (සියයට 1) මිල වැඩිවීම් වාර්තා කළහ. වර්ෂය අග භාගය වනවිට ගිණිකොන දිග ආසියානු වෙළෙඳපොළවල යම් ස්ථාවරභාවයක් දක්නට ලැබීම යහපත් ලක්ෂණයක් විය. මෙයට මූලික වශයෙන් හේතුවූයේ එම රටවල් විනිමය අනුපාතික ස්ථායි කිරීම ඇතුළු අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම මගින් ඔවුන්ගේ ආර්ථිකයන්හි ස්ථායිතාවයක් ඇතිකර ගැනීමට උත්සාහ ගැනීමයි.

බටහිර වෙළෙඳපොළවල නිව්යෝර්ක් කොටස් හුව-මාරුවෙහි ඩව් ජෝන්ස් ඉන්ඩස්ට්‍රියල් ඇවරේජ් දර්ශකය සියයට 15 ක වර්ධනයක් වාර්තා කළ අතර, ලන්ඩන්වල ෆයිනෑන්ෂියල් ටයිම්ස් කොටස් හුවමාරු දර්ශකය සියයට 11 කින් වර්ධනය විය.

## වෙළෙඳපොළෙහි වර්ධනයන්

කොළඹ කොටස් හුවමාරුව 1998 ඔක්තෝබර් මස 26 වැනිද ජාත්‍යන්තර කොටස් හුවමාරු පෙරමුණෙහි (International Federation of Stock Exchange) 52 වැනි සාමාජිකයා බවට පත්විය. මෙම පෙරමුණෙහි අරමුණ වූයේ ලෝකයේ ප්‍රාග්ධන වෙළෙඳපොළවල් භාවිතා කරන්නවුන්ට ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සංවිධිත හා රෙගුලාසිවලට යටත් සුරැකුම් වෙළෙඳපොළවල් සංවර්ධනය කිරීමට සහ දිරිගැන්වීමට දායක වීමයි. ලෝකයේ සංවර්ධිත හා පුරෝගාමී කොටස් වෙළෙඳපොළවල් ද, ආශ්‍රිත සාමාජික-යින් 14 කින් ද දියුණු වෙමින් පවතින වෙළෙඳපොළවල් 32 කින්ද සමන්විත මෙම පෙරමුණෙහි මුළු සාමාජික සංඛ්‍යාව 52 කි.

කොළඹ කොටස් හුවමාරුව විසින් 1997 දී හඳුන්වා දුන් සම්පූර්ණ ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය තුළින් සියළුම තැරැව්කාර කාර්යාලයන් කොටස් හුවමාරුව සමග විද්‍යුත් මාධ්‍යය මගින් සම්බන්ධ වන පරිදි පුළුල් හුවමාරු ජාලයක් පිහිටුවා ඇත. මෙම ක්‍රමය, තැරැව්කරුවන්ට කොළඹින් පිට සිය කාර්යාල පිහිටුවීමට සහ පුළුල් පරාසයක විහිදුන වෙළෙඳ තොරතුරු ලබා ගැනීමට උපකාරි වී ඇත.

කොළඹ කොටස් වෙළෙඳපොළ තවදුරටත් නවීකරණය කිරීමේ අරමුණ ඇතිව කොළඹ කොටස් හුවමාරුව සහ සුරැකුම්පත් හා විනිමය කොමිසම එක්ව කොටස් ණයට දීමේ (Stock Lending) සහ විකිණීමට අදහස් කරන අවස්ථාවේ යම් පුද්ගලයෙක් සතුව කොටස් නොමැති වුවද අනාගතයේ දී කොටස් මිලට ගෙන ගනුදෙනුව පියවීම කරන අදහසින් කොටස් අලෙවි කිරීමේ ගිවිසුම් වලට එළඹීමේ ක්‍රමයක් (Short Selling) හඳුන්වා-දීමට අදහස් කරයි. මේ සම්බන්ධයෙන් මැලේසියාව යොදගෙන ඇති ක්‍රියාමාර්ග පරීක්ෂාවට ලක්කරමින් අධ්‍යයනයක් සිදු කරනු ඇත. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) මගින් අධ්‍යයනය සඳහා අවශ්‍ය අරමුදල් සැපයීමට අදහස් කරයි.

1998 අයවැය මගින් සමාගම් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම උනන්දු කරවීමට සහ ආයෝජන පදනම පුළුල් කිරීමට පියවර කිහිපයක් ගන්නා ලදී. 1998 අයවැය යෝජනාවලදී ලියාපදිංචි නොවූ සමාගම් 1999 මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත වීමේ කොන්දේසියට යටත්ව ඔවුන්ගේ ප්‍රාග්ධන ලාභ බදු වලින් නිදහස් කරන ලදී.

1999 අයවැය යෝජනාවලදී මෙම සහනය ලබාදීම 2000 මාර්තු 31 දින දක්වා දීර්ඝ කරන ලදී. ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 1998 අයවැය මගින් ලැයිස්තුගත ණයකර විකිණීමේදී ප්‍රාග්ධන ලාභ සහ ලාභාංශ ආදායම් බදු වලින් නිදහස් කරන ලදී. ලැයිස්තුගත සමාගම්වලට සහ ආයෝජකයින්ට උපක්‍රමශීලීව ඔවුන්ගේ ගණුදෙනුවලට එළඹීමටත් වෙළෙඳපොළ වර්ධනයක් ඇති කිරීමටත් හැකිවනු පිණිස ද්විතීයික ණය වෙළෙඳපොළ වර්ධනය කිරීමට 1999 අයවැයෙහිදී යෝජනා ඉදිරිපත් කරන ලදී. ලැයිස්තුගත ණයකර සහ ණය සුරැකුම්පත් සඳහා ගෙවූ පොලී මත අය කළ සියයට 10 රැඳවුම් බද්ද ඉවත් කිරීමටත් ණයකර සහ පොරොන්දු නෝට්ටු වැනි ලැයිස්තුගත ණය උපකරණ නිකුත් කිරීමේදී අයකළ මුද්දර ගාස්තු ඉවත් කිරීමටත් යෝජනා කෙරුණි. කොටස් ලාභාංශ බලපත්‍ර සහ ව්‍යුත්පන්න උපකරණයන් මත වූ ප්‍රාග්ධන ලාභ බද්ද ඉවත් කිරීමටද යෝජනා ඉදිරිපත් කර ඇත.

1998 අයවැයෙන් යෝජනා කළ පරිදි, සුරැකුම්පත් හා විනිමය කොමිසම කොළඹ කොටස් හුවමාරුව සමග එක්ව කොළඹ කොටස් වෙළෙඳපොළ ස්ථායීකිරීමේ සහ ආයෝජකයින්ගේ විශ්වාසය තහවුරු කිරීමේ අරමුණ ඇතිව ගණුදෙනු පියවීම් සහතික කිරීමේ අරමුදලක් පිහිටුවන ලදී. කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම තැන්පතුගාර ක්‍රමයෙහි නිශ්කාෂණ සාමාජිකයින් (කොටස් තැරැව්කරුවන්) අතර කොටස් වෙළෙඳ ගණුදෙනු පියවීම මෙම අරමුදල මගින් සහතික කරනු ලැබේ. සුරැකුම්පත් හා විනිමය කොමිසමෙහි වර්තමාන විධිවිධානවලට අනුව මිලදී ගන්නා විසින් දින 6 ක් ඇතුලත ගෙවීම් කළයුතු අතර විකුණන්නාට කළයුතු ගෙවීම් දින 7 ඇතුලත පියවිය යුතුය. තැරැව්කරු ගෙවීම් කිරීමට අපොහොසත් වුවහොත් අරමුදල මගින් එම වෙළෙඳ ගණුදෙනුව සම්පූර්ණ කරනු ලැබේ. අරමුදල මගින් ගෙවූ මුදල සහ යම් දඩ මුදලක් වේ නම් එය ගෙවනතුරු ගෙවීමට අපොහොසත් වූ තැරැව්කරුට ව්‍යාපාරික කටයුතුවල යෙදීම තහනම් වේ. රජය මෙම අරමුදල සඳහා මූලික ප්‍රාග්ධනය වශයෙන් රුපියල් දශ ලක්ෂ 150 ක් ලබාදුන් අතර තාක්ෂණික සහාය ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඇමරිකානු එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) මගින් සපයන ලදී.

**10.21 සංඛ්‍යා සටහන**

**භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව 1998**

| කල්පිරීමේ කාලය | කූපන් අනුපාතිකය (වාර්ෂික ප්‍රතිශතය) | කල්පිරීමේදී බර තැබූ සාමාන්‍ය ඵලදාව | වසර අගදී නොපියවූ අගය (රුපියල් දශලක්ෂ) |
|---|---|---|---|
| වසර 2 | 11.00 | 10.81-13.94 | 25,065 |
| වසර 3 | 11.50 | 12.44-13.93 | 9,450 |
| වසර 4 | 12.00 | 12.93-13.94 | 4,400 |
| එකතුව | | | 38,915 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කොළඹ කොටස් හුවමාරුව 1998 ජුනි මස 8 දින සිට බලපැවැත්වෙන පරිදි වෙළෙඳ දිනයෙන් පසු ගණුදෙනු පියවීම සඳහා දී තිබූ දින 15 ක කාලය දින 8 ක් දක්වා අඩුකරන ලදී. කලින් පැවති විධිවිධානවලට අනුව යම් පුද්ගලයෙක් තැරැව්කරුවකුගෙන් සුරැකුම්පත් මිලදී ගත්විට ඔහුගේ ගෙවීම් වෙළෙඳ දිනයෙන් පසු දින 5 ක් ඇතුලතදී කළයුතු වූ අතර දිනකට සියයට 0.1 ක පොලියකට යටත්ව තව දින 10 ක අනුග්‍රහ කාලයක්ද ලබාදී තිබුණි. එම නිසා, ගණුදෙනු පියවීම සඳහා පැවති මුළු කාලය වෙළෙඳ දිනයෙන් පසු දින 15 ක් විය. නව විධිවිධානවලට අනුව අනුග්‍රහ කාලය දින 3 දක්වා අඩුකර ඇති අතර ගණුදෙනු පියවීම වෙළෙඳ දිනයෙන් පසු දින 8 ක් ඇතුලත සිදුකළ යුතු වේ. 8 වන දිනය වනවිට ගැණුම්කරු ඔහුගේ කොටස් සඳහා ගෙවීම් කිරීමට අපොහොසත් වුවහොත් තැරැව්කරුවන් එම කොටස් ඔවුන්ට ලබාගත හැකි කුමන හෝ මිලකට අනිවාර්යයෙන්ම අලෙවි කළයුතු වේ.

## මැදි හා දිගුකාලීන රජයේ සුරැකුම්පත් භාණ්ඩාගාර බැඳුම්කර

1997 මාර්තු මාසයේදී ආරම්භ වූ මැදිකාලීන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම 1998 වර්ෂයේදී වඩාත් පුළුල් විය. මෙම භාණ්ඩාගාර බැඳුම්කර දැන් වෙළෙඳපොළෙහි ජනප්‍රිය වී ඇති අතර, පෞද්ගලික අංශයට මැදිකාලීන පොලී අනුපාතික පිළිබඳ සංඥවන් සහ එක් අවුරුදු පොලී අනුපාතිකයට වඩා වැඩි කාලයක් සඳහා අවදනම් රහිත ඵලද වක්‍රයක් ඉන් සැපයේ. ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥපනත යටතේ නිකුත් කරන ලද සියළුම භාණ්ඩාගාර බිල්පත් වාණිජ බැංකු සහ බලපත්‍ර ලත් විශේෂිත බැංකුවල ද්‍රවශීල වත්කම්වල කොටසක් ලෙස සැලකීමට 1998 මැයි 18 දින මහ බැංකුව තීරණය කිරීමත් සමග මෙම බැඳුම්කර පිළිගැනීම වර්ධනය විය.

මෙම බැඳුම්කරවල ද්‍රවශීලතාව වැඩිකරලීමේ සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළෙහි ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මහ බැංකුව විසින් භාණ්ඩාගාර බැඳුම්කරද භාණ්ඩාගාර බිල්පත් මෙන් මහ බැංකුවේ ද්විතීයිය කවුළුවෙහි ගණුදෙනු කිරීම සඳහා සුදුසු බවට තීරණය කරන ලදී. ඒ අනුව, මහ බැංකුව විසින් 1998 මැයි 21 දින සිට භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම් ඇතිකර ගැනීමට, එහි ද්විතීයික කවුළුවෙහි විකිණීමට සහ මිලදී ගැනීමට අවසර ලබා දෙන ලදී.

1998 භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි කිහිපයකදී වෙළෙඳපොළට වැඩි තෝරා ගැනීමක් කිරීමට හැකිවන පරිදි වෙනස් කල් පිරෙන කාලසීමාවන් සහිතව භාණ්ඩාගාර බැඳුම්කර විශාල ප්‍රමාණ වශයෙන් පිරිනමන ලදී. භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළෙහි තවත් ප්‍රධාන සිදුවීමක් වූයේ, විශාල සුරැකුම්පත් සංචිතයක් ගොඩ නංවාලීම, අධිද්‍රවශීලතාවයකින් යුත් ද්විතීයික වෙළෙඳපොළක් ඇති කරලීම සහ රජයේ ණය ලබා ගැනීමේ පිරිවැය පහත හෙළීමේ අරමුණින්, භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවලදී "සමූහ" (Jumbo) නිකුතුන් හඳුන්වා දීමයි. මෙම "සමූහ" නිකුතුන් වලදී, විශේෂිත ශ්‍රේණියක් යටතේ භාණ්ඩාගාර බැඳුම්කර විශාල කොටසක් නිකුත් කිරීමට තීරණය කරනු ලබන අතර, රජයේ ණය ලබා ගැනීමේ අවශ්‍යතාවයන් සහ

**10.22 සංඛ්‍යා සටහන**

**රුපියල් ණය නිකුත් කිරීම 1998**

| කල්පිරීමේ කාලය | පරිමාණය (රුපියල් දශලක්ෂ) | පොලී අනුපාතිකය |
|---|---|---|
| අවුරුදු 4-5 | 5,500 | 11.50 |
| අවුරුදු 5 | 10,000 | 11.00 |
| අවුරුදු 5-6 | 6,000 | 12.00 |
| අවුරුදු 6-7 | 29,300 | 11.25-12.25 |
| අවුරුදු 9-10 | 1,500 | 11.50 |
| එකතුව | 52,300 | 11.00-12.25 |

වෙළෙඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන්ට යටත්ව, විවිධ වෙන්දේසිවලදී මෙම කොටස්වලින් වඩාත් කුඩා කොටස් වෙළෙඳපොළට ලැබේ. වසර 2 බැඳුම්කර ශ්‍රේණි 11 (නිකුතු 29), අවුරුදු 3 බැඳුම්කර ශ්‍රේණි 4 (නිකුතු 14) සහ වසර 4 බැඳුම්කර ශ්‍රේණි 2 (නිකුතු 9) සමන්විත බැඳුම්කර ශ්‍රේණි 17 ක් වසර තුළදී විය. කල්පිරීමේ කාලය වසර 2, වසර 3 සහ වසර 4 වූ භාණ්ඩාගාර බැඳුම්කර කූපන් අනුපාතිකයන් පිළිවෙලින් වාර්ෂිකව සියයට 11.00, වාර්ෂිකව සියයට 11.50 සහ වාර්ෂිකව සියයට 12.00 ක් විය. සියළුම වෙන්දේසි පූර්ණ දායකත්වයට පත්විය. අනෙකුත් පොලී අනුපාතිකයන් මෙන්, භාණ්ඩාගාර බැඳුම්කර ඵලදාවන්හිද ඉහළයෑමේ නැඹුරුවක් දක්නට ලැබුණි.

සියයට 11.00 ක කූපන් අනුපාතිකයක් සහිත රුපියල් දශ ලක්ෂ 1,000 ක වසර 2 භාණ්ඩාගාර බැඳුම්කර 1997 දෙසැම්බර් මාසයේ අවසාන වෙන්දේසියේදී පිරිනැමුණු අතර, මෙම බැඳුම්කරවල බර තබන ලද සාමාන්‍ය ඵලදාව සියයට 10.81 ට පහත වැටෙමින් අධි සහභාගිත්වයක් සහිතව එම වෙන්දේසියේදී අධිමිලකට ලංසු ලැබිණි. කෙටිකාලීන අනුපාතිකවල ක්‍රමික වැඩිවීමක් සමග අධිදායකත්ව ප්‍රමාණයෙහි අඩුවීමකට සහ ඵලද අනුපාතිකයන්හි නැගීමකට යොමු වෙමින්, වෙළෙඳපොළෙහි යම් අවිනිශ්චිතතාවයක් උත්පාදනය විය. වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාවයක් තිබියදීත්, ආයෝජකයින් විසින් මැදිකාලීන බැඳුම්කරවල ආයෝජනය කිරීමෙහි යම් ප්‍රවේශම් සහගත වීමක් පෙන්වීය. කෙසේ වෙතත්, සියළුම වෙන්දේසි සම්පූර්ණ දායකත්වයට පත්විය. වර්ෂයේ අවසන් කාලය දෙසට විශේෂයෙන් 1998 වර්ෂයේ අවසන් මාස 2 තුළ, වැඩි වූ ද්‍රවශීලතාවය පිළිබිඹු කරමින්, අධිදායකත්වය ප්‍රමාණයෙහි වැඩිවීමක් පෙන්වීය.

වර්ෂය තුළ, වසර 2, වසර 3 සහ වසර 4 භාණ්ඩාගාර බැඳුම්කරවල බර තබන ලද සාමාන්‍ය ඵලදාව සියයට 10.81-13.94, සියයට 12.44-13.93 සහ සියයට 12.93-13.94 පරාසයන්හි වූහ.

## රුපියල් ණය

රජයේ වියදම් මූල්‍ය කරණය සඳහා මැදිකාලීන සහ දිගුකාලීන අරමුදල් ලබාගැනීමේ අරමුණින් 1998 වර්ෂයේදී රුපියල් ණය වැඩපටහන මගින් ණය ලබාගැනීම නොකඩවා ක්‍රියාත්මක විය. මෙම ණය සම මිලට විකුණූ අතර, ඒවා ස්ථාවර පොලී අනුපාතිකයන්ගෙන් සමන්විත විය. 1997 ලබාගත් රුපියල් දශ ලක්ෂ 48,500 ට එරෙහිව 1998 දී රුපියල් දශ ලක්ෂ 52,299 ක දායකත්වයක් ලැබිණි. මෙම ණය සඳහා වූ පොලී අනුපාතික සියයට 11.00 සිට 12.25 ක පරාසයක වූ අතර, කල්පිරීමේ කාලය වසර 4-10 පරාසයක විය. රුපියල් ණය වැඩ සටහනෙහි ප්‍රධාන දායකත්වය සැපයුවන් වූයේ සේවක අර්ථසාධක අරමුදල, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලයි.

## ඒකක භාර

1998 දී මුළු ඒකක භාර සංඛ්‍යාව 10 ක් ලෙස නොවෙනස්ව පැවැතුනි. 1997 දී වූ ඉහළ වර්ධනය හා සැසඳීමේදී 1998 දී ඒකක භාරයන්හි කටයුතුවල පහත වැටීමක් වාර්තා කෙරිණි. ආදායම් අරමුදල් හා වර්ධන අරමුදල් කිහිපයක් හැරුණුවිට බොහෝ ඒකක භාරයන්හි මුළු ශුද්ධ වත්කම්වල පහත යාමක් දක්නා ලදී. කෙසේ නමුදු, ඒකක භාර දරන්නන් සංඛ්‍යාවෙහි හා ඒකක නිකුතුන්හි වර්ධනයක් සිදුවිය.

ඒකක භාරයන්හි කටයුතුවල පහත යාමට ප්‍රධාන වශයෙන් කොටස් වෙළෙඳපොළෙහි පසුබැසීම හේතුවිය. 1998 දී, ඒකක භාරයන් විසින් කරනු ලැබූ කොටස්

ආයෝජනයෙහි පහළයාමක් පෙන්නුම් කළද, ආයෝජනයන්ගෙන් තුනෙන් දෙකක්ම කොටස් වල ආයෝජනය කර තිබීම හේතුවෙන් කොටස් වෙළෙඳපොළෙහි පසුබෑම ඒකක භාරයන්හි කටයුතුවලට දැඩි ලෙස බලපායි.

ඒකක භාරයන්හි ශුද්ධ වත්කම් අගයෙහි 1997 දී වූ සියයට 17 ක වර්ධනයට සංසන්දනාත්මකව 1998 දී සියයට 13 කින් පහත වැටුණි. කොටස්හි ආයෝජන 1997 සිදුවූ සියයට 40 ක වර්ධනයට සංසන්දනාත්මකව 1998 දී සියයට 21 කින් පහත වැටුණි.

ඒකක භාරයන් විශේෂීකරණය කළ සමහර ආයෝජන අංශයන්හි ඵලදායීතාවයන් විවිධ විය. බැංකු සහ මූල්‍ය, නිමැවුම් කර්මාන්ත, විවිධ රඳවා ගැනීම් සහ වගා අංශය ප්‍රධාන ආයෝජන අංශයන් වූ වර්ධන අරමුදල් හි ශුද්ධ වත්කම් වටිනාකම, ඉහත අංශයන්හි කටයුතු සතුටුදායක නොවීම නිසා අඩුවීමක් පෙන්වීය. කෙසේ නමුදු, ආදායම් අරමුදල් රජයේ සුරැකුම්පත් ණයකර හා වාණිජ පත් වැනි මිශ්‍ර ස්ථිර ආදායම් සුරැකුම්පත්හි ආයෝජනයන් කිරීමෙන් ඒවායෙහි ශුද්ධ වත්කම් අගයෙහි වර්ධනයක් සිදුවිය.

කොටස් වෙළෙඳපොළ කටයුතුවල පහතයාමේ ප්‍රවනතාවයක් තිබියදීත් 1998 දී ඒකක දරන්නන්ගේ සංඛ්‍යාව 1997 දී මෙන් සියයට 5 කින් වර්ධනය වූ අතර 1998 දී ඒකක නිකුතුව සියයට 4 කින් වර්ධනය විය. මේ අතර ඒකකයක් සඳහා වූ සමස්ත ශුද්ධ වත්කම් අගය 1997 දෙසැම්බර් අවසානයේදී වූ රුපියල් 6.03-10.52 ක පරාසයකට සංසන්දනාත්මකව 1998 දෙසැම්බර් අවසානයේදී එය රුපියල් 5.18-11.14 අතර පරාසයක විය.

**10.23 සංඛ්‍යා සටහන**

**ඒකක භාර (අ)**

| | 1995 | 1996 | 1997 | 1998 (ආ) |
|---|---|---|---|---|
| 1. මුළු වත්කම්- රුපියල් දශලක්ෂ) | 2,881 | 2.652 | 3,097 | 2,687 |
| 2. ශුද්ධ වත්කම් වටිනාකම (රුපියල් දශලක්ෂ) | 2,855 | 2,637 | 3,072 | 2,675 |
| 3. කොටස්හි ආයෝජන (රුපියල් දශලක්ෂ) | 1,762 | 1,599 | 2,244 | 1,773 |
| 4. (3), (2) හි ප්‍රතිශතයක් ලෙස | 61.7 | 60.6 | 73.0 | 66.3 |
| 5. ඒකක හිමි මුළු ගණන | 22,251 | 25,240 | 26,441 | 27,709 |
| 6. ඒකක භාර සංඛ්‍යාව | 4 | 5 | 10 | 10 |

මූලය : ඒකකභාර

(අ) දෙසැම්බර් 31 දිනට වටිනාකම
(ආ) තාවකාලික